කාල් මාක්ස්

ෆ්‍රෙඩ්රික් එංගල්ස්

# කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය

1848



**කාල් මාක්ස්**



**ෆ්‍රෙඩ්රික් එංගල්ස්**

# පටුන


| | |
|---|---|
| කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය | 5 |
| I ධනපතියෝ සහ නිර්ධනයෝ | 6 |
| II නිර්ධනයෝ සහ කොමියුනිස්ට්වාදියෝ | 17 |
| III සමාජවාදී සහ කොමිනියුනිස්ට්වාදී සාහිත්‍ය | 27 |
| 1. ප්‍රතිගාමී සමාජවාදය | 27 |
| (අ) රදළ සමාජවාදය | 27 |
| (ආ) සුළු ධනපති සමාජවාදය | 28 |
| (ඇ) ජර්මන් හෙවත් සැබෑ සමාජවාදය | 30 |
| 2. ගතානුගතික හෙවත් ධනපති සමාජවාදය | 32 |
| 3. විවේචක - මනෝරාජික සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය | 34 |
| IV විවිධ රටවල විරුද්ධ පක්ෂ සම්බන්ධව කොමියුනිස්ට්වාදීන්ගේ ස්ථාවරය | 36 |


✪ ✪ ✪ ✪ ✪ ✪


| | |
|---|---|
| 1872 ජර්මන් සංස්කරණයට ලියූ සංඥාපනය | 39 |
| දෙවැනි රුසියන් සංස්කරණයට ලියන ලද සංඥාපනය | 40 |
| 1883 ජර්මන් සංස්කරණයට ලියූ සංඥාපනය | 42 |
| 1888 ඉංග්‍රීසි සංස්කරණයට ලියූ සංඥාපනය | 43 |
| 1890 ජර්මන් සංස්කරණයට ලියූ සංඥාපනය | 47 |
| 1892 පෝලන්ත සංස්කරණයට ලියූ සංඥාපනය | 52 |
| 1893 ඉතාලි සංස්කරණයට ලියන ලද සංඥාපනය | 54 |
| සංස්කාරකගේ සටහන් | 56 |

# කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය

අවතාරයක් යුරෝපයේ හොල්මන් කරයි - එය කොමියුනිස්ට්වාදයේ අවතාරයය. පාප් වහන්සේ සහ සාර් රජුද, මෙටර්නිහ් සහ ගීසෝද[23], ප්‍රංශයේ රැඩිකල්වරු සහ ජර්මන් පොලිස් ඔත්තු කරුවෝද යන මේ පැරණි යුරෝපයේ සියලු බලවේග, මෙම අවතාරය පළවා හැරීම පිණිස ශුද්ධවූ ගිවිසුමකට එළඹ සිටිති.

බලයට පත්වූ සිය ප්‍රතිවාදීන් විසින් කොමියුනිස්ට්වාදීයැයි හෙළා දකිනු නොලැබූ විපක්ෂයක් ඇත්තේ කොහේද? තමන්ට වඩා ප්‍රගාමී විපක්ෂවලට විරුද්ධව මෙන්ම තමන්ගේ ප්‍රතිගාමී පසමිතුරන්ට විරුද්ධවද කොමියුනිස්ට්වාදය නැමැති හංවඩු ගසන ලද දෝෂාරෝපණය ආපසු දමා නොගැසූ විපක්ෂයක් ඇත්තේ කොහිද?

මෙම කරුණෙන් පැන නගින ප්‍රතිඵල දෙකකි.

කොමියුනිස්ට්වාදය දැනටමත් සියලු යුරෝපා බලවේගයන් විසින් බලයක් ලෙස පිළි ගෙන ඇත්තේය.

කොමියුනිස්ට්වාදීන් ස්වකීය පක්ෂයේම ප්‍රකාශනයක් මගින්, මුළු මහත් ලෝකය ඉදිරියෙහි විවෘත ලෙස, ස්වකීය අදහස්ද, ස්වකීය අරමුණුද, ස්වකීය ප්‍රවණතාවයන්ද ප්‍රකාශ කළ යුතු, කොමියුනිස්ට් අවතාරය පිළිබඳ ළමා කතන්දරවලට පිළිතුරු සැපයිය යුතු කාලය පැමිණ ඇත.

මේ පරමාර්ථය පෙරදැරි කරගෙන විවිධ ජාතීන් නියෝජනය කරන කොමියුනිස්ට්වාදීහු ලන්ඩනයට ඒකරාශී වී පහත සටහන් ප්‍රකාශනය ලියා ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ඉතාලි, ප්ලෙමිෂ් සහ ඩෙන්මාක් භාෂාවලින් මුද්‍රණය කිරීමට තීරණය කළහ.

# I. ධනපතියෝ සහ නිර්ධනයෝ*

මෙතෙක් පැවති සියලු සමාජ වල ඉතිහාසය** පංති අරගලවල ඉතිහාසය වේ.

නිදහස් මිනිසා සහ වහලාද, රෝම කුලීනයා සහ රෝම පොදු ජනයාද, රදළයා සහ ප්‍රවේණිදාසයාද, ශ්‍රේණි හිමියා*** සහ ජ්‍යෙෂ්ඨ ආධුනිකයාද - වචනයකින් පැහැදිලි කළහොත්, පීඩකයා සහ පීඩිතයා එකිනෙකාට විරුද්ධව නියත ලෙස නැගී සිට, වරෙක සැඟවුණාවූද, වරෙක විවෘත වූද සටනක්, එක්කෝ මුළු මහත් සමාජයම විප්ලවවාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙන් අවසන් වූ, නැතිනම් සටන් කරන පංතීන්ගේ පොදු විනාශයෙන් අවසන් වූ සටනක් නොකඩවාම කරගෙන ගියහ.

ඉතිහාසයේ ආදි යුගවලදී විවිධ ස්තරවලට බෙදන ලද පූර්ණ සැකැස්මක්, සාමාජීය තරාතිරම්වල විවිධ සරණී කරණයක් හැම තැනදීම පාහේ අපි දකිමු. පැරණි රෝමයෙහි කුලීනයින්ද, අසරුවන්ද, පොදු ජනයාද, වහලුන්ද; මධ්‍ය කාලීන යුගවලදී රදළ අධිපතීන්ද, ඔවුන්ගේ ගැත්තන්ද, ශ්‍රේණි හිමියන්ද, ජ්‍යෙෂ්ඨ ආධුනිකයින්ද (සිප්කැමියන්ද), ප්‍රවේණිදාසයන්ද අපි දකිමු. තවද මේ සියලු පංතීන් තුළම පාහේ තවත් අප්‍රධාන සරණී කරණයන් විය.

---

* ධනපති පංතිය යනුවෙන් අදහස් කරන්නේ, සාමාජීය නිෂ්පාදන මාර්ග හිමි, වැටුප් පිට කම්කරුවන් සේවයෙහි යොදන සමකාලීන ධනපතීන්ගේ පංතියය. නිර්ධන පංතිය යනුවෙන් අදහස් කරන්නේ තමන් සතු නිෂ්පාදන මාධ්‍යයන් නොමැති වීම නිසා, ස්වකීය ශ්‍රම ශක්තිය විකිණීමේ තත්ත්වයට ඇද වැටී ඇති සමකාලීන වැටුප් ශ්‍රමිකයින්ගේ පංතියය. (එංගල්ස් විසින් 1888 ඉංග්‍රීසි සංස්කරණයට ලියන ලද සටහනකි)

** මුළු මහත් ලිඛිත ඉතිහාසය මින් අදහස් කැරේ. 1847 දී සමාජයේ ප්‍රාග් ඉතිහාසය, එනම් ලිඛිත ඉතිහාසයට පෙර පැවති සාමාජීය සංවිධානය සම්පූර්ණයෙන්ම පාහේ නොදන තිබිණි. ඉන් ඉක්බිතිව, රුසියාවේ පොදු ඉඩම් අයිතිය පැවති බැව් හක්ස්තෝසන්[24] විසින් සොයා ගැනිණි. සියලු ජර්මන් ගණ ගෝත්‍රවල ඓතිහාසික වර්ධනයේ ආරම්භය ඇති කළ සාමාජීය පදනම වූයේ මෙම පොදු ඉඩම් අයිතිය බව, මවුරර්[25] විසින් ඔප්පු කරන ලදි. ඉන්දියාවේ සිට අයර්ලන්තය දක්වා සෑම තැනම පැවැති ආදිකල්පික සමාජ ක්‍රමයේ පදනම වන්නේත්, අතීතයේ වූයේත් වර්තමානයෙහි වන්නේත් හවුලේ ඉඩම් හිමි ගැමි පොදු සමාජය බව අනුක්‍රමයෙන් පැහැදිලි විය. ආදිකල්පික කොමියුනිස්ට් සමාජයේ අභ්‍යන්තරික සංවිධානය, එහි නියම ආකාරය මෝර්ගන්[26] විසින් ගණ ගොත්‍රය සම්බන්ධයෙන් වංශවල සැබෑ ස්වභාවය අරභයා කරන ලද උතුම් සොයා ගැනීමෙන් සුපැහැදිලි විය. මේ ආදි කල්පික පොදු සමාජය දිරාපත් වී යාමත් සමගම, එකිනෙකට වෙනස් වූ සහ අවසානයේදී එකිනෙකට ප්‍රතිසතිත පංතිවලට බෙදිණි. *'Der Ursprung der Familie, des Privateigentums und des Staats', 2 Aufgabe, Stuttgart, 1886* - 'පවුල, පෞද්ගලික දේපොළ සහ රජය ඇති වූ හැටි' නැමැති කෘතිය මගින් මේ ගැන විස්තරයක් කිරීමට මම වෑයමක් දැරීමි. (1888 ඉංග්‍රීසි සංස්කරණයට එංගල්ස් විසින් ලියන ලද සටහනකි.)

*** ශ්‍රේණි හිමියා - ශ්‍රේණියක පූර්ණ සාමාජිකයෙකි. ඔහු ශ්‍රේණිය තුළ පූර්ණ බලතල හිමියකු විය. එහෙත් එහි නායකයා නොවීය.
(1888 ඉංග්‍රීසි සංස්කරණයට එංගල්ස් ලියූ සටහනකි.)

රදළ සමාජයේ නශ්ටාවශේෂවලින් ඇතිවුණු සමකාලීන ධනපති සමාජය පංති ප්‍රතිසතයන් විනාශ කර නැත. එය අලුත් පංතීන්, පෑගීම සඳහා නව තත්ත්වයන්, පැරණි සටන් ක්‍රම වෙනුවට, අලුත් සටන් ක්‍රමද එය ඉදිරිපත් කළා පමණකි.

ධනපති පංතියේ යුගය වන අපේ මෙම යුගයට අයත් විශේෂ ලක්ෂණය නම්, එය පංති ප්‍රතිසතය සරළ කිරීමයඃ සමස්තයක් වශයෙන් සමාජය වැඩි වැඩියෙන් එකිනෙකට සතුරු මහ කඳවුරු දෙකකට, එකිනෙකාට එරෙහිව මුහුණට මුහුණ ලා සිටින මහා පංතීන් දෙකකට, ධනපති සහ නිර්ධන නැමැති පංති දෙකට බෙදෙමින් පවතී.

මධ්‍ය කාලීන යුගයේ ප්‍රවේණිදාසයන්ගෙන් ආදි නගරවල නිදහස් ජනගහණය ඇති විය. මේ නාගරිකයින්ගෙන් ධනපති පංතියේ ප්‍රථම කොටස් ඇති විය.

ඇමරිකාව සොයාගැනීමත්, අප්‍රිකාව වටා යාමට මුහුදු මාර්ගය සොයාගැනීමත් නිසා නැගී ආ ධනපති පංතියට අලුත් ක්‍රියාකාරී ක්ෂේත්‍රයක් ඇති විය. පෙරදිග ඉන්දියානු සහ චීන වෙළඳ පොළවල්ද, ඇමරිකාව යටත් විජිත කරණයට හසුවීමද, යටත් විජිත සමග වෙළඳාමද, හුවමාරු කිරීමේ මාධ්‍යයන් සහ වෙළඳ භාණ්ඩවල වැඩිවීමද නිසා වාණිජයටත්, නෞකා ගමනයටත්, කර්මාන්තයටත් මින් පෙර නොවූ විරූ ආවේගයක් ඇතිවිය. එමගින්, ගරා වැටෙමින් පැවති රදළ සමාජයේ සිටි විප්ලවීය කොටසට සීඝ්‍ර සංවර්ධනයක් ලබා දුන්නේය.

ශිල්පීන් අල්ප සංඛ්‍යාවකට සීමා වී තිබුණු ශ්‍රේණි මගින් කාර්මික නිෂ්පාදනය මත ඒකාධිකාරයක් අයත් කැර ගෙන සිටි, පැරණි රදළ වාදයට වැඩිවෙමින් පැවති අලුත් වෙළඳ පොළවල්වල වර්ධනය වන ඉල්ලුම තවදුරටත් සපුරාලීමට නොහැකි විය. එය වෙනුවට හස්තෝපක්‍රම කර්මාන්තය ඇති විය. භාණ්ඩ සාදන මැද පංතිය විසින් ශ්‍රේණි ශිල්පීන් පසෙකට තල්ලු කැරිණි. සාමූහික ශ්‍රේණි අතර පැවති ශ්‍රම විභජනය, එක් එක් වැඩ ශාලාවක් තුළ ඇති වූ ශ්‍රම විභජනය ඉදිරියෙහි අතුරු දහන් විය.

එහෙත් වෙළඳ පොළවල් නොනැවතී වැඩෙන්නට වූ අතර ඉල්ලුමද එන්ට එන්ටම වැඩිවිය. හස්තෝපක්‍රම කර්මාන්තයට පවා එම ඉල්ලුම සපුරාලීමට තවදුරටත් නොහැකි විය. එවිට වාෂ්ප සහ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ විසින් කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනයේ විප්ලවයක් ඇති විණි. හස්තෝපක්‍රම කර්මාන්තය වෙනුවට නවීන මහා පරිමාණ යෝධමය කර්මාන්තය ඇතිවිය. කාර්මික මැද පංතියට අයත් ස්ථානය දසලක්ෂාධිපති ධන හිමි කර්මාන්ත කරුවෝ, කර්මාන්ත හමුද මෙහෙයවන නායකයෝ, සමකාලීන ධනපති පංතිය අයත් කැර ගත්හ.

මහා පරිමාණ කර්මාන්තය සමස්ත ලෝක වෙළඳ පොළක් බිහි කළේය. මෙයට මග හෙළි කරන ලද්දේ ඇමරිකාව සොයා ගැනීම විසිනි. සමස්ත ලෝක වෙළඳ පොළ වෙළඳාමේත්, නෞකා ගමනයේත්, ගොඩබිම ගමනාගමනයේත් ඉමහත් සංවර්ධනයක් ඇති කළේය. මෙය යළි කර්මාන්ත ව්‍යාප්ත කිරීමෙහි ලා බල පෑමක් ඇති කළේය. එමෙන්ම කර්මාන්තය, වෙළඳාම, නෞකා ගමනය, දුම්රිය සේවාව වර්ධනය වූ ප්‍රමාණයටම සමානුපාතිකව ධනපති පංතිය වැඩි දියුණු වී, සිය

ප්‍රාග්ධනය වැඩි කැරගෙන, මධ්‍යම යුග වලින් දයාද වශයෙන් පැවත ආ සියලු පංති පසුතලයට ඇද දැම්මේය.

මේ නයින් සමකාලීන ධනපති පංතිය, දීර්ඝ කාලීන සංවර්ධන ක්‍රියාදාමයක ඵලයක් බවත්, භාණ්ඩ නිෂ්පාදන විධිවල සහ හුවමාරුවල ඇති වූ පෙරළි මාලාවක ඵලයක් බවත් අපි දකිමු.

ධනපති පංතියේ දියුණුවේ සෑම පියවරක් සමගම ඊට අනුරූපව එම පංතියේ දේශපාලන ප්‍රගමනයක්ද ඇති විය. රදළ කුලීන ආධිපත්‍යය යටතේ පීඩිත පංතියක් වූ, මධ්‍යකාලීන කොමියුනය*

තුළ අවිගත් ස්වයං පාලක සංගමයක් වූ (ඉතාලියේ සහ ජර්මනියේ මෙනි), එක් තැනෙක ස්වාධීන නාගරික සමූහාණ්ඩුවක් වූ (ප්‍රංශය මෙනි), තවත් තැනෙක රාජාණ්ඩුවට අයබදු ගෙවිය යුතු තෙවැනි ප්‍රජාව වූ, ඉන් ඉක්බිතිව, හස්තෝපක්‍රම කර්මාන්ත පැවති අවධියේදී රදළ ප්‍රභූවරුන්ට විරුද්ධව පාවිච්චි කළ බලවේගයක් ලෙස, අර්ධ රදළවාදයට හෝ පරම රාජාණ්ඩුවට හෝ සේවය කළ, පොදුවේ මහා රාජාණ්ඩුවල ප්‍රධාන මුල්ගල වූ, ධනපති පංතිය අවසානයේදී සමකාලීන මහා කර්මාන්තය සහ සමස්ත ලෝක වෙළඳ පොළ පිහිටුවාලීමෙන් අනතුරුව, නියෝජිත සමකාලීන රාජ්‍යයන් තුළ තමාට පමණක් සීමාවූ සුවිශේෂ දේශපාලනමය ආධිපත්‍යයක් ලබාගෙන සිටී. සමකාලීන රාජ්‍ය බලය අන්කිසිවක් නොව, මුලු මහත් ධනපති පංතියේම පොදු කටයුතු මෙහෙයවන කාරක මණ්ඩලයක් පමණකි.

ධනපති පංතිය ඉතිහාසයෙහි, අති විප්ලවීය ක්‍රියා කලාපයක් ඉටුකර ඇත.

ධනපති පංතිය ආධිපත්‍යය ලැබූ හැම තැනෙකම, සියලු රදළවාදී, පීතෘ මූලික, පරමාදර්ශී (චාන් ගැමි ජීවිත) සබඳකම් විනාශ කළේය. ''ස්වාභාවික ස්වාමිවරුන්ට'' මිනිසා බැඳ තිබුණු අනේක විධ රදළවාදී බන්ධනයන් අනුකම්පා විරහිත ලෙස සිඳ බිඳ දැමූ ධනපති පංතිය, මිනිහකු සහ මිනිහකු අතර නග්න ස්වාර්ථකාමය හැර, අනුකම්පා විරහිත ලෙස ''මුදල් ගෙවීම හැර'' වෙනත් කිසිදු සබඳකමක් ඉතිරි නොකළේය. ආගමික භක්තියද, ධීර - වීර උනන්දුවද, අවරසිකවාදී අනුරක්තතාවයද අරභයා වූ ස්වර්ගමය ආනන්දයන් ආත්මාර්තකාමී ගණන් බැලීම නැමැති අයිස් වතුරෙහි ගිල්වා දමනලදි. එය පෞද්ගලික අගය හුවමාරු වටිනාකම

---

* ''කොමියුනය'' යන නමින් ප්‍රංශයේ වර්ධනය වෙමින් පැවති නගර හැඳින් විය. මේ නාමය සිය රදළ අධිපතීන්ගෙන් ප්‍රාදේශීය ස්වයං පාලනය සහ''තෙවැනි ප්‍රජාවේ'' දේශපාලන අයිතිවාසිකම් දිනාගැනීමටත් පෙර සිටම තබන ලද්දකි. පොදුවේ පවසතොත්, ධනපති පංතියේ ආර්ථික වර්ධනය පිළිබඳව නිදසුනක් ලෙස එංගලන්තයද, එම පංතියේ දේශපාලන වර්ධනය පිළිබඳව නිදසුනක් ලෙස
ප්‍රංශයද මෙහි පෙන්වන ලදි. (1888 ඉංග්‍රීසි සංස්කරණයට එංගල්ස් විසින් ලියන ලද සටහනය.)

කොමියුනය - ඉතාලියේ සහ ප්‍රංශයේ නගර වැසියන් විසින් ස්වයං පාලනය පිළිබඳ ස්වකීය මූලික අයිතිය රදළ අධිපතීන් ගෙන් මුදලට ගැනීමෙන් හෝ, සටන් කොට දිනා ගැනීමෙන් හෝ පිහිටුවන ලද නාගරික පාලනයට තැබූ නාමයය. (1890 ජර්මන් සංස්කරණයට එංගල්ස් විසින් ලියන ලද සටහනකි.)

බවට පෙරළන ලදි. එමෙන්ම සංඛ්‍යා විරහිත, උදුරා ගත නොහැකි, වර සහිත නිදහස් අයිතීන් වෙනුවට හෘද සාක්ෂියට කොහෙත්ම එකඟ නොවන එකම නිදහස වන වෙළඳාම් කිරීමේ නිදහස පිහිටුවාලීය. වචනයකින් කියතොත්, ආගමික සහ දේශපාලනික මායාවන්ගෙන් වසා තිබුණු සූරාකෑම වෙනුවට එය විවෘත, ලජ්ජා විරහිත, සෘජු, කෲර සූරාකෑම ආදේශ කළේය.

මෙතෙක් ගරුත්වයට භාජනය වූ, ගෞරව පූර්වක විස්මයකින් යුතුව සැළකූ හැම වෘත්තියකම තිබූ ප්‍රභා මණ්ඩලය ධනපති පංතිය විසින් ඉවත් කැරිණි. එය වෛද්‍ය වරයා, නීති වේදියා, පූජකයා, කවියා, විද්‍යා කටයුතුවල නිරත වන්නා ආදී හැම කෙනෙක්ම වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත් කළේය.

ධනපති පංතිය, පවුලේ සිත් ගන්නා සුළු-අනුරක්තතාවයේ ආකල්ප බිඳ දමා එය හුදු මුදල් පිළිබඳ ආකල්පයක් දක්වා පහත හෙළීය.

ප්‍රගතිගාමීන්ගේ අභිමානයට පාත්‍ර වූ මධ්‍ය කාලීන යුගවල පැවැති තිරිසන් ලෙස සවි ශක්තිය විදහා පෙන්වීමේ ගතිය, ඉතා කම්මැළි කුසීතභාවය තුළ ඊට ගැළපෙන ප්‍රතිවිරුද්ධ ගතිය සොයා ගැනීම කෙසේ සිදුවීද යන්න ධනපති පංතිය හෙළි කළේය. මිනිස් ක්‍රියාකාරීත්වයට ලබාගත හැකි දේ මොනවාද යන්න එය ප්‍රථම වරට පෙන්වීය. මිසරයේ පිරමිඩ්, රෝමයේ වාරිමාර්ග(ජල මාර්ග), ගොතික් කලාව අනුව ඉදි කළ දේවස්ථාන වැනි වෙනත් වර්ගයකට අයත් විශ්මයජනක කලාවස්තූන් එය නිර්මාණය කළේය. ඊට කලින් පැවති ජාතීන්ගේ දේශාටනයන් සහ කුරුස යුද්ධ[27] සියල්ලට වඩා වෙනත් වර්ගවල මහා ප්‍රයාණවල එය යෙදුණේය.

ස්ථාවර ලෙසම නිෂ්පාදන උපකරණවල පෙරළියක් ඇති නොකර, එමගින් නිෂ්පාදන සම්බන්ධකම් සහ සමාජයේ මුළු මහත් සම්බන්ධකම්වල සමස්තයද විප්ලවීය වෙනසකට භාජනය නොකොට, ධනපති පංතියට පැවතිය නොහැකිය. අනික් අතින් ඊට කලින් ඇති වූ සියලු කාර්මික පංතීන්ගේ පැවැත්මට අවශ්‍ය වූ පළමුවැනි කොන්දේසිය වූයේ වෙනස් නොවන අන්දමකින් පැරණි නිෂ්පාදන ක්‍රම පවත්වා ගෙන යාමය. නිෂ්පාදනයෙහි ඇතිවන ස්ථාවර විප්ලවීය වෙනස්වීම්, සියලු සාමාජීය සබඳතාවයන්වල ඇතිවන නිරන්තර කැළඹීම්, සදාකාලික අවිනිශ්චිතතාවය සහ ගාමකත්වය විසින් ධනවාදී යුගය අන් සියලු යුගවලට වඩා වෙනස් වෙයි. සිය පෞරාණික වූත්, පූජනීය වූත් ප්‍රාග් විනිශ්චයන් සහ මත සහිත පාෂාණීභූත යකඩ මල බැඳුණු සියලු සබඳතාවයන් විනාශ වී යන අතර අළුතින් ඇතිවන සියලු සබඳතාවයන් අස්ථිකරණයට භාජනය වීමටත් පෙර ඒවා යල්පැන යයි. ඝන වූ හැම දෙයක්ම උණුවී වාතය බවට පෙරළෙයි. ශුද්ධවූ හැම දෙයක්ම කෙළසන්නේය. අවසානයේදී මිනිසාට, තම ජීවන තත්ත්වයන් සහ තම වර්ගයා සමග ඇති අන්‍යොන්‍ය සබඳතාවයන් දෙස සන්සුන් සිතින් බැලීමට අවශ්‍යතාවයක් ඇති වේ.

සිය නිෂ්පාදන භාණ්ඩවලට නියත ලෙසම විශාල වෙමින් පවතින වෙළඳ පොළක් සොයා ගැනීමේ අවශ්‍යතාවය විසින් මුළු මහත් ලෝක ගෝළය වටා ධනපති පංතියට දුවන්නට සිදුවෙයි. එයට හැම තැනටම රිංගන්නටද, හැම තැනකම පදිංචි වීමටද, හැම තැනකම සම්බන්ධකම් ඇති කැර ගැනීමටද සිදුවෙයි.

ධනපති පංතිය සමස්ත ලෝක වෙළඳ පොළ සූරාකෑම තුළින්, හැම රටකම නිෂ්පාදනයට සහ පරිභෝජනයට නිර්ජාතික සාර්වභෞමික ස්වරූපයක් දී ඇත. එය

ප්‍රතිගාමීන් මහත් සේ කණස්සල්ලට පත් කරමින්, කර්මාන්තයේ ජාතික පදනම එහි පා යටින් ඉවතට ඇද දමා ඇත. පුරාණ චිරාගත ජාතික කර්මාන්ත විනාශ කර දමන ලදි. නැතිනම් දිනපතා ඒවා විනාශ කර දමනු ලැබේ. සියලු සභ්‍ය ජාතීන් ඉදිරියෙහි ඇති ජීවිතයත් මරණයත් අතර ප්‍රශ්න විසඳාලීමක් වශයෙන්, අභිනවයෙන් ආරම්භ කළ යුතු නව කර්මාන්ත මගින් තවදුරටත් දේශිය අමුද්‍රව්‍යවලින් නොව, ලෝකයේ ඉතා ඈත පෙදෙස්වලින් ගෙනෙනු ලබන අමුද්‍රව්‍යවලින් වැඩ කරන කර්මාන්ත මගින්, එක් රටක් තුළ පමණක් නොව, ලෝක ගෝළයේ හැම දිසාවෙකම පරිභෝජනයට ගන්නා භාණ්ඩ නිපදවන කර්මාන්ත මගින් පැරණි කර්මාන්ත පළවා හරිනු ලැබේ. රටක ජාතික නිෂ්පාදනය මගින් සෑහීමකට පත් කරනු ලබන පැරණි අවශ්‍යතාවයන් වෙනුවට, ඈත සහ විවිධ දේශගුණික රටවලට අයත් නිෂ්පාදන මගින් පමණක් සෑහීමට පත් කළ හැකි නව අවශ්‍යතාවයන් පැනනගී. පැරණි ප්‍රාදේශිය සහ ජාතික හුදෙකලාතාවය සහ ස්වයංපෝෂිතතාවය වෙනුවට, සමස්ථ ලෝක අන්තර් ආවේදනයක්ද, එක් ජාතියක් තවත් ජාතියක් මත රඳා පවතින සමස්ථ ලෝක අන්‍යොන්‍ය පරායක්තතාවයක්ද ඇතිවේ. මෙය ද්‍රව්‍යමය නිෂ්පාදනවලට මෙන්ම අධ්‍යාත්මික නිර්මාණවලට එකසේ බලපායි. එක් ජාතියකගේ අධ්‍යාත්මික නිර්මාණයේ ඵල සියලු ජාතීන්ගේ පොදු දායාදය බවට පත්වේ. ජාතික ඒක පාර්ශිකත්වය, සහ සීමා සහිත පටු බුද්ධිය වඩ වඩාත් නොකළහැකි දෙයක් බවට පත්වේ. ජාතික හා පළාත් බද සාහිත්‍යයන්ගේ බහු සංඛ්‍යාවක් විසින් ජගත් සාහිත්‍යයක් බිහි වෙයි.

සියලු නිෂ්පාදන උපකරණවල සීඝ්‍ර දියුණුව මගින්ද, ඉමහත් ලෙස පහසුවන ප්‍රවාහන සහ පණිවුඩ මාර්ග මගින්ද ධනපති පංතිය අති ම්ලේච්ඡ ජාතීන් ඇතුළු සියලු ජාතීන් සභ්‍යත්වය වෙතට ඇද ගනී. ධනපති භාණ්ඩවල ලාභ මිල මහා කාලතුවක්කුවලට සමානය. මෙය පාවිච්චි කරමින් ධනපති පංතිය සියලු චීන ප්‍රාකාර බිඳ දමයි. ම්ලේච්ඡයින් තුළ විදේශිකයින් කෙරෙහි ඇතිවන මුරණ්ඩු ද්වේෂ සහගත වෛරය මෙල්ල කරලයි. වඳවී යාමේ භීතිය ඉදිරියේ, ඉන් මිදෙනු පිණිස ධනවාදී නිෂ්පාදන ක්‍රමය පිළිගන්නා ලෙස එය සියලු ජාතීන්ට බල කර සිටී. ඔවුනට ඊනියා ශිෂ්ටත්වය, එනම් ධනපතිවාදය පිළිගන්නා ලෙස එය බලකර සිටී. වචනයකින් පවසතොත්, ධනපති පංතිය තම ප්‍රතිමූර්තියක් සහ තමාට සමාන ලෝකයක් මවාලයි.

ධනපති පංතිය ගම නගරයේ ආධිපත්‍යයට යටකර දමයි. එය අති විශාල නගර ඉදි කර ඇත. ගැමි ජනගහණය සමග සන්සන්දනය කරන විට, නගරබද ජනගහණය සංඛ්‍යාව අතින් වැඩි කළේය. ඒ නයින්, ජනගහණයෙන් සෑහෙන කොටසක්, ගම්බද ජීවිතයේ මුග්ධභාවයෙන් මුදවා ගත්තේය. එය ගම නගරයට පරාධීන කළාක් මෙන්ම, ම්ලේච්ඡ සහ අර්ධ ම්ලේච්ඡ රටවල් සභ්‍ය රටවලට පරාධීන කළේය. ගොවීන්ගෙන් සමන්විත ජාතීන්, ධනපතීන්ගෙන් සමන්විත ජාතීන්ටද, නැගෙනහිර බටහිරටද පරාධීන කළේය.

ධනපති පංතිය ජනගහණයත්, නිෂ්පාදන මාධ්‍යයන් සහ දේපොළත් විසුරුම වඩ වඩාත් අහෝසිකැරැ දැමීමෙහි යෙදී සිටී. එය ජනගහණය පිණ්ඩිත කොට, නිෂ්පාදන මාධ්‍යයන් මධ්‍යගත කොට ඇත. දේපොළ අල්ප සංඛ්‍යාවක් අත සංකේන්ද්‍රණය කොට ඇත. මෙයින් අවශ්‍යයෙන්ම ඇතිවූ විපාකය වූයේ දේශපාලනමය මධ්‍යගත වීමකි. ස්වාධීන නමුදු ලිහිල් ලෙස එකිනෙකට සම්බන්ධව තිබූ, විභේදකාරී වුවමනාවන්, විවිධ නීති පද්ධති, ආණ්ඩු සහ අයබදු ක්‍රම තිබුණු පෙදෙස්, <u>එකම</u> ආණ්ඩුවක්, <u>එකම</u> නීති සංග්‍රහයක්, <u>එකම</u> ජාතික පංති වුවමනාවක්,

එකම තීරුබදු ක්‍රමයක් සහිත, දේශසීමාවක් සහිත ඒකීය ජාතියක් ලෙස ඒකරාශී විය.

ධනපති පංතිය, සිය වසරකටත් වඩා අඩු සිය පාලන කාලය තුළදී, ඉන් පෙර පැවති සියලු පරම්පරාවන් විසින් ඉදිකරන ලද නිෂ්පාදන බලවේගයන්ගේ සමස්තයට වඩා අති විශාල වූද, අති දැවැන්ත වූද නිෂ්පාදන බලවේගයක් බිහි කළේය. සොබාදහම මෙල්ල කිරීම, යන්ත්‍ර නිෂ්පාදනය, කර්මාන්තයට හා කෘෂිකර්මයට රසායනය යෙදවීම, ධූම නෞකා සේවය ආරම්භ කිරීම, දුම්රිය සේවය, විදුලි පණිවුඩ ක්‍රමය, වගාව සඳහා මහද්වීප හෙළි කිරීම, ගංගා වාරිමාර්ග කරණයට යටකිරීම, බහු ජනගහණයන් පොළවෙන් මවා පෑම වැනිදේ ආදී මේ මහා නිෂ්පාදන බලවේගයන් සාමාජීය ශ්‍රමයේ උකුළෙහි සැතපුන බවට පෙර නිමිත්තක් තිබුණේ, මින් පෙර කිනම් සියවසරටද!

ධනපති පංතියේ ඉදිකිරීමට පදනම වූ නිෂ්පාදන මාධ්‍යයන් සහ හුවමාරු ක්‍රම නිර්මාණය කරන ලද්දේ රදළ සමාජ ක්‍රමය තුළදී බැව්, එනයින් දැන් අපි දුටිමු. මේ නිෂ්පාදන මාධ්‍යවල හා හුවමාරු ක්‍රමවල සංවර්ධනයේ එක්තරා අවධියකදී රදළ සමාජය සිය නිෂ්පාදනය සහ හුවමාරුව කළේ යම් තත්ත්වයන් යටතේද, එම තත්ත්වයනුත් කෘෂිකර්මය සහ කුඩා පරිමාණ කර්මාන්ත පිළිබඳ රදළවාදී සංවිධානයත්, එක් වචනයකින් කියතොත් දේපොළ පිළිබඳ රදළවාදී සබඳතාවයන්, ඒ කාලය වන විට සංවර්ධනය වී තිබුණු නිෂ්පාදන බලවේගයන්ට තවදුරටත් අනුරූපී නොවීය. නිෂ්පාදනය දියුණු කරනවා වෙනුවට ඒවාට බාධා කරන්නට විය. ඒවා විලංගු බවට පත් විය. ඒවා පුපුරවා දැමීම අවශ්‍ය විය. එලෙසම ඒවා පුපුරවා දමන ලදි.

නිදහස් තරඟය, ඊට අනුකූල වන පරිදි සකස් කැරුගත් සාමාජීය හා දේශපාලනමය සංස්ථාපනයක්ද, ධනපති පංතියේ ආර්ථික සහ දේශපාලනමය ආධිපත්‍යයද සහිතව, ඒවාට අයත් ස්ථානය ගත්තේය.

අප ඉදිරියේ එබඳු ව්‍යාපාරයක් සම්පූර්ණ වෙමින් පවතී. නිෂ්පාදන සහ හුවමාරු සබඳතාවයන් සහිත, දේපොළ අයිතිය පිළිබඳ සබඳතාවයන් සහිත සමකාලීන ධනවාදී සමාජය, මෙතරම් බලසම්පන්න නිෂ්පාදන මාධ්‍යයන් සහ හුවමාරු ක්‍රම මවා තිබෙන මෙම සමාජය, තමා විසින් සිය විජ්ජාකාරී බලයෙන් ආරාධනා කොට ඇති පාතාල ලෝකයේ භූත බලවේගයක් තවදුරටත් මෙල්ල කළ නොහැකි විජ්ජාකාරයකුගේ තත්ත්වයකට වැටී සිටියි. ඉකුත් දශකයන් කීපයක් තිස්සේම කර්මාන්තයේ සහ වාණිජයේ ඉතිහාසය නම්, අන් කිසිවක් නොව, සමකාලීන නිෂ්පාදන තත්ත්වයන්ට විරුද්ධව, ධනපති පංතියේ සහ ආධිපත්‍යයේ පැවැත්මට අවශ්‍ය තත්ත්වයන් වන දේපළ සබඳතාවයන්ට විරුද්ධව සමකාලීන නිෂ්පාදන බලවේගයන් ගෙනයන කැරැල්ලේ ඉතිහාසයයි. කලින් කල, යළි, යළිත් ආපසු පැමිණෙන, එලෙස ආපසු පැමිණෙන හැම වාරයකදීම වඩවඩාත් තර්ජනාත්මක ලෙස මුළු මහත් ධනපති සමාජයේ පැවැත්මට තර්ජනය කරන වාණිජ අර්බුද ගැන සඳහන් කිරීම ප්‍රමාණවත්ය. මෙම වාණිජ අර්බුදවලදී, නිෂ්පාදනය කර තිබූ භාණ්ඩවලින් සෑහෙන කොටසක් පමණක් නොව, නිෂ්පාදන බලවේගයන්ගේ ද සෑහෙන කොටසක් පවා සෑම වාරයකදීම විනාශ කර දමනු ලැබේ. මෙම අර්බුද වලදී ඊට කලින් හැම වකවානුවකදීම අමන ක්‍රියාවක් සේ පෙනී යා හැකි සාමාජීය වසංගතයක් - අධි නිෂ්පාදනය නැමැති වසංගතය දසත පැතිර යයි. හිටිහැටියේ සමාජය ම්ලේච්ඡත්වය කරා ආපසු ඇද වැටුණු සැටියක් දැනෙයි. දුර්භික්ෂයක්,

සමස්ත ලෝක විනාශකාරී යුද්ධයක් විසින් ජීවත් වීමේ මාධ්‍යයන් සියල්ල කපා දැමූ කලෙක මෙන් සමාජයට දැනෙයි. කර්මාන්තය සහ වෙළඳාම විනාශ වූවක්සේ දැනෙයි. කුමක් නිසාද? වුවමනාවට වඩා වැඩි ශිෂ්ටත්වයක් සමාජයට ඇති නිසාය, අවශ්‍යතාවයට වඩා වැඩි ප්‍රමාණයක් ජීවන මාධ්‍යයන් තිබෙන නිසාය, වුවමනාවට වඩා වැඩි කර්මාන්තයක් සහ වාණිජයක් සමාජය සතු නිසාය. සමාජයට රිසි පරිදි පාවිච්චි කළ හැකි නිෂ්පාදන බලවේගයන් ධනපති දේපොළ අයිතියේ සබඳතාවයන් වර්ධනය කිරීමට තවත් දුර ඉඩ නොදෙයි. එහෙත් ඒ වෙනුවට, නිෂ්පාදන බලවේග දේපළ සබඳතාවයන්ට වඩා ඉමහත් ලෙස බලවත් වේ. ධනවාදී සබඳතාවයන් ඒවායේ සංවර්ධනයට බාධා කරයි. මේ බාධා මැඩ නැගී සිටීමට නිෂ්පාදන බලවේග ඉදිරිපත් වූ විට, ඒවා මුළු මහත් ධනවාදී සමාජයම ව්‍යාකූලත්වයකට ඇද දමයි. ධනවාදී දේපොළ අයිතියේ පැවැත්ම තර්ජනයට ලක් කරයි. ධනේශ්වර සමාජයේ සබඳතාවයන් විසින් නිපදවන ලද ධන සම්භාරය අඩංගු කර තැබීමට ප්‍රමාණවත් නොවන තරමින් එය පටුවිය. ධනපති පංතිය මේ අර්බුදයන්ගෙන් ගොඩ එන්නේ කෙසේද? එක් අතකින් බලකිරීම නිසා නිෂ්පාදන බලවේගයන්ගේ ඉමහත් තොගයක් විනාශ කැරැ දැමීමෙනි. අනිත් අතින්, අලුත් වෙළඳ පොලවල් අල්ලා ගැනීමෙන් සහ පැරණි වෙළඳ පොළවල් එහෙම පිටින්ම සූරාකෑමෙනි. එය කරන්නේ කෙසේද? වඩාත් විස්තීර්ණ වූද, වඩාත් විනාශකාරීවූද අර්බුදවලට මඟ හෙළිකිරීමෙන් සහ අර්බුද වළක්වාලන මාධ්‍යයන් අඩු කරලීමෙනි.

රදළ ක්‍රමය මුළින් උපුටා දැමීමට ධනපති පංතිය පාවිච්චි කළ අවි, දැන් ධනපති පංතියට එරෙහිව එල්ල වීමට පටන් ගෙන ඇත.

තමනට මරණය ළඟා කරන අවි ධනපති පංතිය නිපදවූවා පමණක් නොව, මෙම අවි තමනට විරුද්ධව එල්ල කරන මිනිසුන්ද, එනම් සමකාලීන කම්කරුවන්, නිර්ධනීන් බිහි කළේය.

ධනපති පංතිය, එනම් ප්‍රාග්ධනය වැඩෙන්නේ යම් ප්‍රමාණයකටද, එම ප්‍රමාණය සරිලන සේ සමානුපාතිකව නිර්ධන පංතිය, නූතන කම්කරු පංතිය වර්ධනය වේ. මෙම පංතිය තමන්ට වැඩ සොයාගත හැකි තාක් කල් පමණක් පවතී, එයට වැඩ ලැබෙන්නේද, එය සිය ශ්‍රමයෙන් ප්‍රාග්ධනය වැඩිකරන තාක් කල් පමණකි. තමන් එක එකා වශයෙන් වෙන්, වෙන්ව විකුණා ගත යුතු මේ කම්කරුවෝ, වෙළඳාමට තබා ඇති අන් හැම භාණ්ඩයක් මෙන්ම, වෙළඳ භාණ්ඩයක් වන්නාහ. මෙහි විපාකයක් වශයෙන් ඔවුහු තරගයේ සියලු ජය පරාජයන්ටද, සියලු උච්ඡාවචනයටද ගොදුරු වෙති.

යන්ත්‍ර සූත්‍ර විස්තීර්ණ ලෙස වැඩි වැඩියෙන් පාවිච්චි කිරීම නිසාත්, ශ්‍රම විභජනය නිසාත්, නිර්ධනීන්ගේ ශ්‍රමයෙහි පෞද්ගලික ස්වාධීන ස්වරූපය අතුරුදහන් විය. ඒ අනුව, වැඩකරන්නාට තිබූ වශීකරණත්වයද නැති විය. ඔහු යන්ත්‍රයේ සරළ උපාංගයක් බවට පත්විය. ඔහුගෙන් ඉල්ලා සිටින්නේ ඉතා සරළවූද, අතිශයින්ම ඒකතානමය වූද, ඉතා ලෙහෙසියෙන් ලබාගත හැකිවූද ක්‍රියාකාරිත්වයක් පමණකි. කම්කරුවකුගේ නිෂ්පාදන වියදම සම්පූර්ණයෙන්ම පාහේ, ඔහුගේ ජීවන යැපුම් මාධ්‍යයන් සඳහාත්, ඔහුගේ වර්ගය බෝ කිරීම සඳහාත් සීමා වෙයි. එහෙත් භාණ්ඩයක මිලත්, එම නිසාම ශ්‍රමයේ මිලත්[28] එය නිපදවීමට යන වියදමට සමාන වෙයි. එබැවින් වැඩක ඇති විකර්ෂණයට සමානුපාතිකව, වැටුප් අඩු වෙයි. එපමණක්ද නොවේ, යන්ත්‍ර සූත්‍ර පාවිච්චිය සහ ශ්‍රම විභජනය වැඩිවන ප්‍රමාණයට

සමානුපාතිකව, වැඩ කරන පැය ගණන වැඩි කිරීමෙන් හෝ එක්තරා පැය ගණනක් තුළදී වැය කරන ශ්‍රමය වැඩි කිරීමෙන් හෝ යන්ත්‍ර සූත්‍රවල වේගය වැඩිකිරීමෙන් ආදියෙන් හෝ ශ්‍රම ප්‍රමාණය වැඩි වෙයි.

සමකාලීන කර්මාන්තය, පීතෘමූලික ශිල්පියාගේ කුඩා වැඩ පොළ කාර්මික ධනපතියාගේ මහා කම්හල බවට පරිවර්තනය කළේය. කම්හලට එක්රැස් වූ කම්කරුවන් සෙබළුන් ලෙස සංවිධානය කරන ලදි. කාර්මික සේවාවේ සාමාන්‍ය සෙබළුන් ලෙස ඔවුන් උසස් නිලධාරීන්ගේ සහ සාජන්ට් වරුන්ගේ අණදීම යටතේ ඉතා සම්පූර්ණ ධූරාවලියකට යටත් කොට ඇත. ඔවුහු ධනපති පංතියේ සහ ධනපති ආණ්ඩුවේ වහලුන් පමණක් නොවෙත්. ඔවුහු දිනපතාමත්, පැයක් පාසාමත්, යන්ත්‍රයේත්, පාලකයාගේ සහ අන් හැමටම වඩා පෞද්ගලික ධනවාදී නිෂ්පාදකයාගේත් වහලුන් බවට පත්වෙති. තම අවසාන හා එකම පරමාර්ථය ලාභය ලබාගැනීම බව මෙම දුෂ්ට ඒකාධිපතිත්වය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන තරමට, එය වඩාත් නීච, වෛර සහගත, වඩාත් කෲර දෙයක් බවට පත්වෙයි.

කායික ශ්‍රමය සඳහා අවශ්‍ය වන නිපුණත්වය සහ කායික ශක්තිය අඩුවන තරමට, වෙනත් වචනවලින් කියතොත්, නූතන කර්මාන්තය සංවර්ධනය වන තරමට පුරුෂයින්ගේ ශ්‍රමයේ ස්ථානය ළමා සහ ස්ත්‍රී ශ්‍රමය විසින් දරනු ලැබේ. කම්කරු පංතියට, වයස් භේදයේ සහ ස්ත්‍රී පුරුෂ භේදයේ විශේෂ සාමාජීය වටිනාකම තවදුරටත් බල නොපායි. ඔවුහු සියලු දෙනාම, වයස හා ලිංගික භේදය අනුව අඩු හෝ වැඩි වියදමින් පාවිච්චි කරනු ලබන ශ්‍රම උපකරණ පමණක් බවට පත්වෙති.

කම්කරුවා කර්මාන්ත හිමියා විසින් සූරාකෑම අවසන් වීම සහ ඔහුට වැටුප් ලැබෙනවාත් සමගම, ධනහිමි පංතියේ අනෙකුත් කොටස් වන ගෙවල් හිමියාද, කඩකාරයාද, පොළී කාරයාද ආදීහු ඔහු මත කඩා පනිති.

මධ්‍යම පංතියේ පහළ තට්ටු වන කුඩා කර්මාන්ත හිමියෝද, සුළු වෙළෙන්දෝද, සුළු පොළී කරුවෝද, හස්ත කර්මාන්ත කරුවෝ සහ ගොවියෝද යන මේ කොටස් නිර්ධන පංතිය දක්වා පහත වැටෙති. අඩ වශයෙන් මෙසේ වීමට එක් හේතුවක් නම් විශාල කම්හලක් පටන් ගැනීමට තරම් ඔවුන්ගේ කුඩා ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීමය. එමෙන්ම ඔවුන් විශාල ධනපතීන් සමග කරන තරඟයේදී පරාජයට පත්වීමය. අනික් හේතුව නම්, නවීනතම නිෂ්පාදන ක්‍රම විධි ඔවුන්ගේ ශිල්පමය දක්ෂතාවය නොවටනා දෙයක් බවට පත්කරනු ලැබීමය. මේ ලෙස ජනගහණයේ සියලු පංතීන්ගෙන් නිර්ධන පංතියට පුද්ගලයින් බඳවාගනු ලැබේ.

සංවර්ධනයේ විවිධ අවධි තුළින් නිර්ධන පංතිය ගමන් කරයි. තම උපතත් සමගම නිර්ධන පංතිය, ධනපති පංතියට විරුද්ධව අරගලය ආරම්භ කරයි.

ආරම්භයේදී මෙම අරගලය පටන්ගන්නේ තනි, තනි කම්කරුවන් විසිනි. ඉන් ඉක්බිතිව එක් කම්හලක කම්කරුවන් විසින්ද, අනතුරුව එක් වෘත්තියක කම්කරුවන් විසින් එක් පෙදෙසක තමන්ව කෙලින්ම සූරාකන ධනපතියකුට විරුද්ධව අරගලය ගෙන යනු ලැබේ. ඔවුහු සිය ප්‍රහාරය නිෂ්පාදනයේ ධනවාදී සබඳතාවයන්ට විරුද්ධව පමණක් නොව, නිෂ්පාදන උපකරණවලට විරුද්ධවද එල්ල කරති. ඔවුහු තම ශ්‍රමය සමග තරඟ කරන ආනයනිත භාණ්ඩ විනාශ කරති, යන්ත්‍ර සූත්‍ර කඩා බිඳ දමති, කම්හල් ගිනිබත් කරති. මධ්‍යකාලීන යුගවලදී කම්කරුවාට

තිබුණු, නැතිවී ගිය තත්ත්වය, බලහත්කාරයෙන් යළි ලබා ගැනීමට ඔවුහු වැර දරති.

මෙම අවධියේදී, කම්කරුවෝ තවමත් මුළු මහත් රට පුරා පැතිර පවතින අසංඝක්ත බලවෙගයත් වන අතර, තරඟය නිසා කැඩී වෙන්වී සිටිති. කම්කරු බහු ජනතාවගේ ඒකරාශි වීම තවමත් ඔවුන්ගේ ස්වයං සමගියේ ප්‍රතිඵලයක් නොවන අතර එය ධනපතීන්ගේ සමගියේ ඵලයක් පමණකි. ධනපති පංතියට සිය දේශපාලනමය අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිසා එයට මුළු මහත් නිර්ධන පංතියම ක්‍රියාවේ යෙදවීමට සිදු වී ඇත. එපමණක් නොව එයට තව කලකට එසේ කිරීමටද හැකියාවක් ඇත. මේ අවධියේදී නිර්ධනීන් සටන් කරන්නේ තම සතුරන්ට විරුද්ධව නොව, සතුරන්ගේ සතුරන් වන නිරපේක්ෂ රාජාණ්ඩුවේ නටඹුන්වලටත්, ඉඩම් හිමියන්ටත්, කාර්මික නොවන ධනපති පංතියටත්, සුළු ධනපති පංතියටත් විරුද්ධවය. මේ අනුව මුළු මහත් ඓතිහාසික සංවර්ධන ව්‍යාපාරය ධනවාදී පංතිය අත සංකේන්ද්‍රණය වෙයි. එවැනි තත්ත්වයන් යටතේ ලබන සෑම ජයග්‍රහණයක්ම, ධනපති පංතියේ ජයග්‍රහණයක් වන්නේය.

එහෙත් කර්මාන්ත සංවර්ධනයත් සමගම නිර්ධන පංතිය සංඛ්‍යාත්මක ලෙස වැඩි වනවා පමණක් නොව, එය වඩාත් විශාල සමූහයන් ලෙස ඒකරාශී වී, සිය ශක්තිය වර්ධනය කැර ගනී, එමෙන්ම එයට සිය ශක්තිය වැඩි වැඩියෙන් දැනෙයි. යන්ත්‍ර සූත්‍ර මගින් ශ්‍රමයේ සියලු අන්දමේ විශේෂත්වයන් මකා දමන තරමට, හැම තැනකම පාහේ එකම පහත් මට්ටමකට වැටුප් හෙළන තරමට, නිර්ධන පංතියේ විවිධ අවශ්‍යතාවයන් සහ ජීවන තත්ත්වයන් වඩ වඩාත් එකම සමානතාවයකට පත්වේ. ධනපතීන් අතර වැඩිවෙමින් පවතින තරඟයත්, එහි විපාකයක් වශයෙන් පැන නගින වාණිජ අර්බුදත් නිසා කම්කරුවන්ගේ වැටුප් වඩාත් අස්ථිරතාවයට භාජනය වෙයි. යන්ත්‍ර සූත්‍ර නොකඩවා දියුණු වන අතර වඩාත් අධික වේගයකින් වර්ධනය වන නිසා නිර්ධන පංතියේ දිවි පෙවෙත වඩ වඩාත් සැක සහිත වෙයි. එක්, එක් කම්කරුවන් සහ එක්, එක් ධනපතීන් අතර හටගන්නා අරගල එන්ට, එන්ටම පංති දෙකක් අතර අරගලයක ස්වරූපය ගනී. කම්කරුවන් ආරම්භ කරන්නේ ධනපති පංතියට විරුද්ධව සභාග (වෘත්තීය සමිති) සෑදීමට පටන් ගැනීමෙනි. වැටුප් ප්‍රමාණය පහත වැටීම වළක්වාලනු පිණිස ඔව්හු එකට එක්වී ක්‍රියා කරති. සිදුවිය හැකි හැප්පීම්වලට සූදානම්වීම සඳහා ඔවුහු ස්ථාවර සංගමයන් පිහිටුවා ගත්හ. තැන් තැන්වල ඇතිවන මේ හැප්පීම් විවෘත නැගිටීම්වලට පෙරළෙයි.

කම්කරුවන් ඉඳ හිට ජයගත්තද, එම ජයග්‍රහණ තාවකාලික ඒවා විය. ඔවුන්ගේ සටන් අරගලවල නියම ප්‍රතිඵලය වන්නේ ඍජු ක්ෂණික ජය නොව, වඩාත් පුළුල් ලෙස පැතිරෙන කම්කරු එක්සත්කමය. විශාල කර්මාන්තය විසින් බිහිකරන, විවිධ පෙදෙස්වල කම්කරුවන් අතර අන්‍යොන්‍ය සම්බන්ධකමක් ඇතිකරන වඩාත් දියුණු වෙන සම්බන්ධ මාර්ග මෙම එක්සත් සංගමයට ආධාර වෙයි. සමාන ස්වරූපයකින් යුත් විවිධ ප්‍රාදේශීය අරගල ඒකීය ජාතික පංති අරගලයක් තුළට මධ්‍යගත කරලීමට අවශ්‍ය වූයේ මේ සම්බන්ධතාවය පමණකි. එහෙත් හැම පංති සටනක්ම දේශපාලන සටනකි. කාලකණ්ණි මහා මාවත් සහිත මධ්‍යකාලීන යුගවල නාගරිකයින්ට සියවසර කීපයක් තිස්සේ මුදුන් පමුණුවා ගැනීමට නොහැකි වූ මෙම සංගමය සමකාලීන නිර්ධනයෝ දුම්රිය සේවාවන්ට පින් සිදුවන්නට වසර කීපයකින් සපුරා ලූහ.

මේ ලෙස පංතියකට නිර්ධනීන් සංවිධානය කිරීමද, ඒ අනුව ඔවුන්

දේශපාලන පක්ෂයකට සංවිධාන කිරීමද කම්කරුවන් අතර මොහොතක් පාසා පැන නගින තරඟය නිසා විනාශ වෙයි. එහෙත් මෙම සංවිධානය යළිත් වරක් නැඟී සිටින්නේ වඩාත් ශක්තිමත් වෙමිනි, වඩාත් ස්ථිර ලෙසිනි, වඩාත් බලසම්පන්න ලෙසිනි. ධනපතීන්ගේ විවිධ කොටස් අතර ඇතිවන භේදවලින් ප්‍රයෝජනය ගනිමින්, මෙය කම්කරුවන්ගේ තනි ඉල්ලීම්වලට නීත්‍යානුකූල පිළිගැනීමක් දිනා ගැනීමට බල කරයි. එංගලන්තයේ දිනකට පැය දහයේ වැඩ පනත සම්මත කරවා ගත්තේ මේ ආකාරයටය.

පොදුවේ පැරණි සමාජයේ අභ්‍යන්තරික ඝට්ටනය බොහෝ අතින් නිර්ධන පංතියේ සංවර්ධනික ක්‍රියාදාමයට හේතු විය. ධනපති පංතිය ස්ථාවර අරගලයක යෙදී සිටී. ප්‍රථමයෙන් රදළ කුලීනයින්ට විරුද්ධවද, ඉන් ඉක්බිතිව, කර්මාන්ත ප්‍රගමනයට පටහැණි වුවමනාවන් ඇති ධනපති කොටස්වලට විරුද්ධවද, නිත්‍ය වශයෙන්ම සියලු විදේශීය රටවල ධනපතීන්ට විරුද්ධවද ධනපති පංතිය සටන් කරයි. මේ සියලු සංග්‍රාමවලදී නිර්ධන පංතියට ආයාචනා කිරීමටද, එම පංතියේ ආධාර ඉල්ලා සිටීමටද, එමගින් එම පංතිය දේශපාලන ව්‍යාපාරයට ඇද ගැනීමටද ධනපති පංතියට සිදුවෙයි. එම නිසා ස්වකීය දේශපාලනමය හා පොදු අධ්‍යාපනය ධනපති පංතිය නිර්ධන පංතියට ලබා දෙයි, එනම්, ධනපති පංතියට විරුද්ධව සටන් කිරීමට නිර්ධනීන්ට අවි ලබා දෙයි.

තවද, අප දැනටමත් දුටු පරිදි, කර්මාන්ත ප්‍රගමනය මගින්, පාලක පංතීන්ගේ කොටස් නිර්ධන පංතියට ඇද දමනු ලැබේ. නැතහොත්, යටත් පිරිසෙයින් ඒවායේ පැවැත්ම අරභයා වූ තත්ත්වයන්ට තර්ජනය එල්ල කෙරේ. මේ කොටස් නිර්ධන පංතියට ප්‍රබුද්ධත්වයේ සහ ප්‍රගතියේ මූලිකාංග සපයති.

අවසානයේදී, පංති සටනේ තීරණාත්මක මොහොත සමීප වන විට, පාලක පංතිය තුළ, මුළු මහත් පැරණි සමාජය තුළ දිරාපත්වීමේ ක්‍රියාදාමය කෙතරම් ප්‍රචණ්ඩ, කෙතරම් තියුණු ස්වරූපයක් ගන්නේදයත්, පාලක පංතියෙන් සුළු කොටසක් කැඩී වෙන්වී, විප්ලවවාදී පංතියට, අනාගතය හිමි පංතියට එකතු වෙයි. මීට කලින්, රදළ කුලීනයින්ගෙන් කොටසක් ධනපති පංතියට ගියාක් මෙන්ම, දැන් ධනපති පංතියෙන් කොටසක් - එනම්, සමස්තයක් වශයෙන් ඓතිහාසික ක්‍රියාදාමය න්‍යායික ලෙස සාක්ෂාත් කැරැ ගැනීමේ තත්ත්වය දක්වා උසස් වී ඇති ධනපති දෘෂ්ටිවාදීන්ගෙන් කොටසක් - නිර්ධන පංතිය වෙත පැමිණෙයි.

ධනපති පංතියට විරුද්ධව මුහුණට මුහුණ ලා නැඟී සිටින සියලු පංතීන් අතුරෙන්, නිර්ධන පංතිය පමණක් අද නියම විප්ලවවාදී පංතිය වේ. නවීන මහා කර්මාන්තයේ සංවර්ධනය නිසා ඉතිරි සියලු පංතීහු දිරාපත් වීමකට හසුව අවසානයේදී විනාශ වී යති. නිර්ධන පංතිය එහි ස්වකීයම වූත්, අවශ්‍ය වූත් ඵලය වේ.

මැද පංතීන්ගේ කොටස්: කුඩා කර්මාන්ත හිමියා, සුළු වෙළෙන්දා, හස්ත කර්මාන්ත ශිල්පියා, ගොවියා ආදීහු මැද පංතියේ කොටස් වශයෙන් සිය විනාශය වළක්වාලනු පිණිස ධනපති පංතියට විරුද්ධව සටන් කරති. මේ හේතුව නිසා ඔව්හු විප්ලවවාදීන් නොව ගතානුගතිකයින් වන්නාහ. එපමණක් නොව ඔව්හු ප්‍රතිගාමීයෝය. ඉතිහාසයේ ඉදිරි ගමන නැමති රෝදය ආපසු කරකැවීමට ඔවුහු මහන්සි දරති. ඔවුන් විප්ලවවාදී වෙති නම්, එයට හේතුව ඔවුන්ට නොබෝ

දිනකින්ම නිර්ධන පංතියට ඇතුළු වීමට සිදුවී ඇති බැවිනි. ඔවුන් ආරක්ෂා කරන්නේ ඔවුන්ගේ අද්‍යතන වුවමනාවන් නොව, අනාගත වුවමනාවන්ය. ඔවුන් එසේ කරන්නේ, තම ස්ථාවරය අතහැර නිර්ධන පංතික ස්ථාවරය ගැනීම පිණිසය.

''පාදඩ නිර්ධන පංතිය[29]''* හෙවත් සාමාජීය කුණු කන්දල්, නැති නම් පැරණි සමාජයේ පහළ තට්ටුව විසින් ඉවතට දමන ලද අකර්මණ්‍ය ලෙස කුණුවෙමින් පවතින කොටස එක් හෝ තවත් තැනෙක නිර්ධන පංතික විප්ලවයකින් ව්‍යාපාරය තුළට ඇදී ඒමට ඉඩ ඇත. කෙසේවුවද ජීවන තත්ත්වයන් අනුව, ප්‍රතිගාමී කුමන්ත්‍රණවලදී මේ කොටස් අල්ලස්වලට යට වී ක්‍රියා කරන අවි බවට පත්වීමේ නැඹුරුව බෙහෙවින් බලපායි.

පැරණි සමාජයේ තත්ත්වයන්, නිර්ධන පංතික ජීවන තත්ත්වයන් යටතේ සම්පූර්ණයෙන්ම ගිලී යයි. නිර්ධනයාට දේපොළ නැත. ඔහු සහ ඔහුගේ පවුලද, දූ දරුවන්ද අතර ඇති සබඳතාවයන් හා ධනවාදී පවුල් සබඳතාවයන් අතර තවදුරටත් කිසිදු පොදු බවක් නැත. ප්‍රංශයේ මෙන්ම එංගලන්තයේද, ජර්මනියේ මෙන්ම ඇමරිකාවේද එක සමානවූ සමකාලීන කර්මාන්තමය ශ්‍රමයට, සමකාලීන ප්‍රාග්ධනයට යටත්වීම නිසා ඔහුගේ හැම ජාතික ලක්ෂණයක්ම අකා මකා දමා ඇත. නීතිය, සදාචාරය, ආගම ආදිය ඔහුට නම් අන් කිසිවක් නොව, ධනවාදී ප්‍රාග් විනිශ්චයන් පමණකි. මේවා ධනපති අයිතිය වසන් කරන කඩතුරාවන්ය.

මීට පෙර පංති, ආධිපත්‍ය ලබාගත් පසු, ඒවා විසින් ඒ වනවිට ලබාගත් තත්ත්වය තහවුරු කැර ගැනීම සඳහා, ඒවා විසින් අයත් කැර ගත් කොන්දේසිවලට මුළු මහත් සමාජයම පරාධීන කිරීම මගින් තහවුරු කරලීමට පරිශ්‍රම දැරූහ. තම පූර්ව අයත්කැර ගැනීමේ ක්‍රමය විනාශ කරමින්, එමගින් ඊට පෙර පැවැති අයත්කැර ගැනීමේ සියලු ක්‍රම විනාශ කරමින් පමණක් නිර්ධනීන්ට සාමාජයීය නිෂ්පාදනය අයත් කර ගත හැකි වන්නේය. නිර්ධන පංතියට රැක ගැනීමට හෝ ආරක්ෂා කැර ගැනීමට හෝ කිසිවක් නොමැත. මෙතෙක් පෞද්ගලික දේපොළ රැකවල් කිරීම සහ රක්ෂණය කිරීම කළ හැම දෙයක්ම විනාශ කරලීම ඔවුන්ගේ දූත මෙහෙය වන්නේය.

මෙතෙක් පැවැති ඓතිහාසික ව්‍යාපාර සියල්ලම අල්පතරයේ ව්‍යාපාර නැතහොත්, අල්පතරයේ වුවමනාවන් සඳහා වූ ව්‍යාපාර විය. නිර්ධන පංතික ව්‍යාපාරය, අති බහුතරයේ වුවමනාවන් සඳහා වූ අති බහුතරයේ ස්වාධීන ව්‍යාපාරයයි. සමකාලීන සමාජයේ පහළම තට්ටුව වන නිර්ධන පංතියට, තමන් පිට නැගී සිටින නිල සමාජයෙන් සමන්විත උඩු ව්‍යුහය සී සී කඩ විසිර යන සේ වීසි නොකර, නැගිට සිටීමටවත් ඍජු ලෙස කොන්ද කෙළින් කිරීමටවත් නොපුළුවන.

නිර්ධන පංතිය ධනපති පංතියට විරුද්ධව කරන අරගලය හරය අනුව නොවේ නම්, රූපානුකූලව නම්, මුලදී ජාතික අරගලයකි. හැම රටකම ධනපති පංතිය ප්‍රථම කොටම, ස්වකීය ධනපති පංතිය සමග ගනුදෙනු බේරා අවසන් කළ යුතුය.

---

* ඉංග්‍රීසි අනුවාදයෙහි *Lumpen-Proletariat* අනතුරුදායක පංතිය ලෙස සටහන් වී ඇත. - <u>අනුවාදක</u>

නිර්ධන පංතියේ සංවර්ධනය අරභයා වූ ඉතා හොඳ අවධි විස්තර කිරීමේදී, දැනට පවතින සමාජය තුළ අඩු වැඩි වශයෙන් ආවරණය වූ රටවැසි - සිවිල් යුද්ධය, විවෘත විප්ලවයක් බවට පෙරළෙන අවස්ථාවක් දක්වා, ධනපති පංතිය ප්‍රචණ්ඩ ලෙස බලයෙන් පහකර දැමීමෙන් නිර්ධන පංතියේ ආධිපත්‍යය සඳහා පදනම් දැමීම දක්වා අපි සටහන් කළෙමු.

අප දැනටමත් දැක තිබෙන පරිදි, මෙතෙක් හැම සමාජ ක්‍රමයක්ම පදනම් වී තිබෙන්නේ පීඩක සහ පීඩිත පංතීන් අතර වූ ප්‍රතිවිරෝධතාවයන් මතය. එහෙත් යම්කිසි පංතියක් පාගා ගෙන සිටීමට නම් එම පංතියට යටත් පිරිසෙයින්, තම වහල් ජීවිතය පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් වන තත්ත්වයක් පීඩක පංතිය විසින් සහතික කළ යුතුය. ප්‍රවේණිදාස ක්‍රමය පැවැති කාලයේදී, ප්‍රවේණිදාසයා නාගරික සමාජයේ - කොමියුනයේ සාමාජිකයා දක්වා ඉහළ නැංගේය. එලෙසම රදළ පරමවාදයේ වියගසට යටත් වී සිටි සුළු ධනපතියා ධනපතියා දක්වා දියුණු වීමට සමත් විය. එහෙත් එයට පටහැණිව, සමකාලීන කම්කරුවා කර්මාන්තයේ ප්‍රගමනයත් සමග ඉහළ නොයයි. තම පංතියේ පැවැත්මේ තත්ත්වයන්ටත් වඩා පහළට ඇද වැටෙයි. ඔහු අන්ත දිළිඳු බවට පත්වේ. දරිද්‍රතාවය ජනගහණයටත්, ධනයටත් වඩා සීඝ්‍ර ලෙස වර්ධනය වෙයි. සමාජ ආධිපත්‍යය උසුලන පංතිය වශයෙන් තවදුරටත් පැවතීමටත්, තම පංතියේ පැවැත්මට අදාළවූ තත්ත්වයන් මුළු මහත් සමාජය මත සියල්ල මැඩ පවත්වන අනුක්‍රමික නීතියක් ලෙස පැටවීමටත් ධනපති පංතියට නොහැකි බව ඉතා පැහැදිලි ලෙස පෙනේ. ධනපති පංතිය පාලනයට සුදුසු නොවන්නේ සිය වහලාට ඔහුගේ වහල් තත්ත්වය යටතේවත් ජීවත්වීමේ තත්ත්වයන් සහතික කිරීමට එය අපොහොසත් වන බැවිනි. ඔහුගෙන් යැපෙනවා වෙනුවට, ඔහුට යැපීමට සිදුවන තත්ත්වයකට ඔහු පහත වැටීම වලක්වාලීමට එයට නොහැකි බැවිනි. සමාජයට තවදුරටත් ධනපති පංතිය යටතේ ජීවත්විය නොහැකිය, එනම් එහි පැවැත්ම සමාජයට තවදුරටත් නොගැළපෙයි.

ධනපති පංතියේ පැවැත්මට සහ එහි ආධිපත්‍යයට අවශ්‍ය කොන්දේසිය නම්, පුද්ගලයන් කීප දෙනෙකු අත ධනය සමුච්චය වීමත්, ප්‍රාග්ධනය සම්පාදනය වීම සහ එය වැඩිවීමත්ය. ප්‍රාග්ධනය පැවැත්මේ කොන්දේසිය නම්, වැටුප් ශ්‍රමයය. වැටුප් ශ්‍රමය මුළුමනින්ම රඳා පවතින්නේ කම්කරුවන් අතර පවතින තරඟය මතය. ධනපති පංතිය විසින් අනිච්ඡානුගතව වර්ධනය කරන කර්මාන්තයේ ප්‍රගමනය කම්කරුවන් අතර තරඟයෙන් පැන නගින අසමගිය, වෙනුවට ඔවුන්ගේ සමගි සන්ධානයෙන් පැන නගින විප්ලවීය සමගියක් ඇතිකරලයි. එබැවින් සමකාලීන මහා කර්මාන්තයේ සංවර්ධනය ධනපති පංතිය නිෂපාදනය කරන නිෂ්පාදිත භාණ්ඩ අයත් කැරගැනීම පදනම් වී ඇති අත්තිවාරම එහි මුලින්ම හාරා දමයි. එබැවින් ධනපති පංතිය අන් හැම දේටම වැඩියෙන් නිපදවන්නේ තම මිනීවළවල් හාරන්නන්ය. ධනපති පංතියේ වැටීමටත්, නිර්ධන පංතියේ ජයග්‍රහණයත් එකසේ නොවැළැක්විය හැකිය.

## II. නිර්ධනයෝ සහ කොමියුනිස්ට්වාදියෝ

කොමියුනිස්ට්වාදීන් සහ පොදුවේ නිර්ධන පංතිය අතර ඇති සබඳතාවය කුමක්ද ?

කොමියුනිස්ට්වාදිහු වෙනත් කම්කරු පංතික පක්ෂවලට විරුද්ධව දේශපාලන පක්ෂ නොසාදති.

සමස්තයක් වශයෙන් නිර්ධන පංතියේම වුවමනාවන් හැර ඒවාට වෙනස් වූත්, ඒවායින් පරි බාහිර වූත් වෙනත් කිසිදු වුවමනාවන් කොමියුනිස්ට්වාදීන්ට නොමැත.

නිර්ධන පංතික ව්‍යාපාරය හැඩගස්වා වාත්තු කිරීම සඳහා කොමියුනිස්ට්වාදියෝ තමන්ගේම නිකායවාදී මූලධර්ම කිසිවක් ඇති නොකරති.

කොමියුනිස්ට්වාදීන් අනිකුත් නිර්ධන පංතික පක්ෂවලින් වෙන් වී පෙනෙන්නේ මේ කරුණුවලින් පමණකිඃ එක් අතකින් කොමියුනිස්ට්වරු විවිධ රටවල නිර්ධනීන්ගේ අරගලවලදී, ජාතිය කුමක් වුවද, එයට ස්වාධීනව පවතින මුළු මහත් නිර්ධන පංතියේම පොදු වුවමනාවන් වෙන් කොට පෙන්වමින් ඒවා පෙරමුණට ගෙන එති. අනිත් අතින්, ධනපති පංතියට විරුද්ධව ඇති කම්කරු පංති සටන් අරගල ගමන් ගන්නා වූ විවිධ සංවර්ධන අවධිවලදී කොමියුනිස්ට්වරු සෑම විටමත්, සෑම තැනකදීමත් සමස්තයක් වශයෙන් මුළු ව්‍යාපාරයේ වුවමනාවන් නියෝජනය කරන්නෝ වෙති.

මෙම හේතුව නිසා කොමියුනිස්ට්වාදීන් ව්‍යවහාරික වශයෙන් හැම රටකම කම්කරු පංති පක්ෂවල ඉතා අධිෂ්ඨාන සහගත සහ ඉදිරිගමනට ආස්වාදය ලබා දෙන පුරෝගාමී කොටස වේ. න්‍යායික වශයෙන් ඔවුනට නිර්ධන පංතික ව්‍යාපාරයේ තත්ත්වය, ගමන් මාර්ගය හා පොදු ප්‍රතිඵල ගැන පැහැදිලි අවබෝධයක් ඇති බැවින් ඔවුනට නිර්ධන පංතියේ සෙසු බහු ජනතාවට නැති වාසියක් ඇත්තේය.

කොමියුනිස්ට්වාදීන්ගේ ක්ෂණික අරමුණ, අන් සියලු නිර්ධන පංතික පක්ෂ වල ක්ෂණික අරමුණමය. එනම්, පංතියක් වශයෙන් නිර්ධනීන් සංවිධානය කිරීමය, ධනවාදී ආධිපත්‍යය මුලිනුපුටා දමා, නිර්ධන පංතියට දේශපාලන බලය ලබා දීමය.

විශ්ව සමාජ ප්‍රතිසංස්කාරකයකු ලෙස පෙනී සිටීමට තැත් කරන එක් හෝ තවත් පුද්ගලයකු විසින් නිපදවන ලද, නැතිනම් සොයා ගන්නා ලද සංකල්ප හෝ මූලධර්ම මත කොමියුනිස්ට්වාදීන්ගේ න්‍යායික නිගමනයන් කිසි ලෙසකින්වත් පදනම් වී නැත.

හුදෙක් වාස්තවික ලෙස පවතින පංති අරගලයක් තුළින්, අපේ ඇස් ඉදිරියේම කෙරීගෙන යන, ඓතිහාසික ක්‍රියාදාමයක් තළින් පැන නගින සබඳතාවයන් පොදුවේ ප්‍රකාශ කිරීම පමණක් මේ න්‍යායික නිගමනයන් කෙරේ. දනට පවතින දේපොළ සබඳතාවයන් අහෝසි කැරැ දැමීම කිසිසේත්ම කොමියුනිස්ට්වාදයේ විශේෂ ලක්ෂණයක් නොවේ.

අතීතයේ සියලු දේපොළ සබඳතාවයන් ඓතිහාසික තත්ත්වයන්ගේ වෙනස් වීමේ විපාකයක් වශයෙන් ඓතිහාසික වෙනස්වීම්වලට අවිච්ඡින්න ලෙසම භාජනය වී ඇත.

ප්‍රංශ විප්ලවය නිදසුනක් වශයෙන්, ධනපති දේපොළ ක්‍රමය ඇති කරලීමෙන්, රදළවාදී දේපොළ ක්‍රමය අහෝසි කළේය.

දේපොළ පොදු වශයෙන් අහෝසි කර දැමීම නොව ධනවාදී දේපොළ ක්‍රමය

අවලංගු කර දැමීම කොමියුනිස්ට්වාදයේ විශේෂ ලක්ෂණය වේ.

එහෙත් සමකාලීන ධනවාදී පෞද්ගලික දේපොළ ක්‍රමය, පංති ප්‍රතිවිරෝධතා මත, ටික දෙනෙකු විසින් වැඩි දෙනෙකු සූරාකෑම මත පදනම් වූ නිෂ්පාදනය කිරීම සහ නිෂ්පාදිත භාණ්ඩ අයත් කැරැ ගැනීම පිළිබඳව අවසාන වූත් අති පූර්ණ වූත් ප්‍රකාශනයයි.

මේ අර්ථයෙන් කොමියුනිස්ට්වාදීන්ගේ න්‍යායයට මෙවැනි අර්ථ කථනයක් දිය හැකියඃ එනම්, පෞද්ගලික දේපොළ ක්‍රමය අහෝසි කර දැමීමය.

කොමියුනිස්ට්වාදීන් වන අපට දෝෂාරෝපණයන් එල්ල කොට ඇත්තේ, සියලු පෞද්ගලික නිදහසේ, ක්‍රියාකාරීත්වයේ සහ ස්වාධීනත්වයේ පදනම යැයි කියනු ලබන, මිනිහකුට තම ශ්‍රමයේ ඵලයක් වශයෙන් පෞද්ගලිකව අයිති කර ගත හැකි දේපොළ අයිතිය අහෝසි කැරැ දැමීමේ අභිලාෂයක් අප තුළ තිබෙන බැවිනි.

අමාරුවෙන් දිනාගත්, ස්වයං උපාර්ජිත, ස්වයං ශ්‍රමයෙන් ලබාගත් දේපොළ! ඔබ කියන්නේ ධනවාදී දේපොළ ක්‍රමයට පෙර පැවති, කුඩා හස්ත කර්මාන්ත ශිල්පියාගේ සහ කුඩා ගොවියාගේ දේපොළ ගැනද? එම දේපොළ විනාශ කරලීමට අපට කිසිදු වුවමනාවක් නැත. කර්මාන්ත සංවර්ධනය විසින් අති විශාල වශයෙන් මෙය විනාශ කර ඇත. එය දැනටමත් දිනපතා එය විනාශ කරමින් සිටී.

නැතිනම්, ඔබ සමහර විට කතා කරන්නේ සමකාලීන ධනපති පංතියේ දේපොළ ගැනද?

එහෙත් වැටුප් ශ්‍රමය, නිර්ධනයාගේ ශ්‍රමය ඔහුට කිසියම් දේපොළක් නිර්මාණය කරයිද? කොහෙත්ම නැත. එය නිර්මාණය කරන්නේ ප්‍රාග්ධනයයි. එනම්, එය වැටුප් ශ්‍රමය සූරාකන දේපොළ නිර්මාණය කරයි. අළුතින් සූරාකෑම සඳහා අළුත් වැටුප් ශ්‍රම තොගයක් ලබා ගැනීමේ තත්ත්වය යටතේ මිස අන් ලෙසකින් වැඩි වීමට නොහැකි දේපොළය. වත්මන් ආකාරය සහිත දේපොළ පදනම් වී ඇත්තේ ප්‍රාග්ධනයත්, වැටුප් ශ්‍රමයත් අතර වූ ප්‍රතිවිරෝධීතා මතය. අපි දැන් මේ ප්‍රතිසතතාවයේ දෙපැත්ත පිරික්සා බලමු.

ධනපතියකු වීමට නිෂ්පාදනයෙහි හුදෙක් පෞද්ගලික තත්ත්වයක් පමණක් නොව, සාමාජීය තත්ත්වයක්ද අවශ්‍ය වෙයි. ප්‍රාග්ධනය සාමූහික ඵලයකි. එය නිර්මාණය කොට ක්‍රියා කර විය හැක්කේ සමාජයේ සාමාජිකයින් බොහෝ දෙනෙකුගේ ක්‍රියාකාරිත්වය තුළින් පමණකි. එපමණක් නොව, අවසානයේදී, සමාජයේ සාමාජිකයින්ගේ එක්සත් ක්‍රියාකාරීත්වය තුළින් පමණකි.

එබැවින් ප්‍රාග්ධනය පෞද්ගලික නොව සමාජ බලයකි.

එම නිසා, ප්‍රාග්ධනය පොදු දේපොළ බවට, සමාජයේ සියලු සාමාජිකයින්ගේ දේපොළ බවට පරිවර්තනය කරන විට, එමගින් පෞද්ගලික දේපොළ සාමාජීය දේපොළ බවට පරිවර්තනය නොවෙයි. දේපොළවල සමාජමය ස්වරූපය පමණක් වෙනස් වෙයි. එහි පංති ස්වරූපය නැති වෙයි.

දැන් අපි වැටුප් ශ්‍රමය ගෙන බලමු.

වැටුප් ශ්‍රමයේ සාමාන්‍ය මිල නම්, අවමය වැටුපයි, එනම් කම්කරුවා හුදු කම්කරුවකු ලෙස යම්තම් ජීවත් කොට තබා ගැනීමට අවශ්‍ය, නිරපේක්ෂ යැපුම් මාධ්‍යයන්ගේ සමස්තයයි. එබැවින් වැටුප් ශ්‍රමිකයා තම ශ්‍රමය මගින් අයත් කර ගන්නේ තම ජීවිතය දිග්ගැස්සවීමට සහ එය ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවශ්‍ය අවම ප්‍රමාණයක් පමණකි. මේ ආකාරයේ ශ්‍රම ඵලයක් විනාශ කර දැමීමට අප කොහෙත්ම අදහස් නොකරන්නේ, එය මිනිස් ජීවිතය පවත්වාගෙන යාම සඳහාත් මිනිස් ජීවිතය ප්‍රති නිෂ්පාදනය කිරීම සඳහාත් වැය වන අතර එය අනුන්ගේ ශ්‍රමය සූරාකන පාලනයක් ඇති කරන අතිරික්තයක් ඉතිරි නොකරන බැවිනි. අපට විනාශ කිරීමට වුවමනා වී ඇත්තේ මේ අයත් කැර ගැනීමේ කාලකණ්ණි ස්වරූපය පමණකි. මේ අයත් කැර ගැනීම යටතේ කම්කරුවා ජීවත් වන්නේ හුදෙක් ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහාය. එමෙන්ම පාලක පංතියේ වුවමනාවන්ට අවශ්‍ය වන තෙක් ඔහුට ජීවත් වීමට ඉඩ දී ඇත.

ධනපති සමාජය තුළ ජීවමාන ශ්‍රමය, සමුච්ච ගත කරන ලද ශ්‍රමය වැඩිකරලීමේ මාධ්‍යයක් පමණකි. කොමියුනිස්ට්වාදී සමාජයක් තුළ සමුච්ච ගත කරන ලද ශ්‍රමය කම්කරුවාගේ පැවැත්ම පුළුල් කිරීමටත්, එය පොහොසත් කරලීමටත්, පහසු කරවීමටත් යොදන මාධ්‍යයක් පමණකි.

ඒ අනුව ධනවාදී සමාජය තුළ වර්තමානය මැඩ අතීතය ආධිපත්‍යය උසුලයි. කොමියුනිස්ට්වාදී සමාජය තුළ අතීතය මැඩ වර්තමානය ආධිපත්‍යය උසුලනු ඇත. ධනවාදී සමාජය තුළ ප්‍රාග්ධනය ස්වාධීනය, පෞද්ගලිකත්වයෙන් යුක්තය, එහෙත් ජීවමාන වැඩ කරන පුද්ගලයා පරාධීනය, පෞද්ගලිකත්වයෙන් තොරය.

මෙවැනි සබඳතාවයන් විනාශ කරලීම ධනපති පංතිය හඳුන්වන්නේ පෞද්ගලිකත්වය සහ නිදහස නැති කරලීමක් ලෙසිනි! ඔවුන් නිවැරදිය. ඇත්ත වශයෙන්ම මෙහිදී අපේ අරමුණ වී තිබෙන්නේ, ධනවාදී පෞද්ගලිකත්වයත්, ධනවාදී නිදහසත්, ධනවාදී ස්වාධීනත්වයත් නැති කරලීමය.

නිෂ්පාදනය පිළිබඳ අද්‍යතන ධනපති තත්ත්වයන් යටතේ නිදහස යනු වෙළඳමේ නිදහසය, අළෙවි කිරීමේ නිදහසය, මිලදී ගැනීමේ නිදහසය.

එහෙත් අළෙවි කිරීම සහ මිලදී ගැනීම අතුරු දහන් වන්නේ නම්, නිදහස් වෙළඳම සහ නිදහස් මිලදී ගැනීමත් අතුරුදහන් වෙයි. නිදහසේ අළෙවි කිරීම සහ මිලදී ගැනීම අරබයා වූ මේ කතාවේත්, පොදුවේ නිදහස අරබයා වූ අපේ ධනපති පංතියේ අන් සියලු ''පම්පෝරි කතාවලත්'' කිසියම් තේරුමක් ඇතොත්, ඇත්තේ එම මධ්‍යකාලීන යුගවල පැවති ස්වාධීනත්වයෙන් තොරවූ සීමා සහිත අළෙවි කිරීම හා මිලදී ගැනීම සහිතව වහල් තත්ත්වයේ සිටි වෙළෙන්දන් සමග සන්සන්දනය කරන විට පමණකි. එහෙත් අළෙවි කිරීම සහ මිලදී ගැනීමත්, නිෂපාදනය කිරීමේ ධනවාදී සබඳතාවයන් සහ ධනපති ක්‍රමයත් විනාශ කරලීමේ කොමියුනිස්ට් ක්‍රමය සමඟ සන්සන්දනය කරන විට එහි කිසිදු තේරුමක් නැත.

ඔබ තැති ගෙන සිටින්නේ පෞද්ගලික දේපොළ නැති කැර දැමීමේ අපගේ අභිප්‍රාය ගැනය. එහෙත් දැනට පවතින ඔබේ සමාජය තුළ දහයෙන් කොටස්

නවයකටම පෞද්ගලික දේපොළ දැනටමත් නැති කර දමා ඇත. සමාජයේ දහයෙන් කොටස් නවයකටම පෞද්ගලික දේපොළ නැති හේතුව නිසාම, ස්වල්ප දෙනෙකුට එය ඇත්තේය. එබැවින්, සමාජයේ අති බහුතරයට කිසිදු දේපොළක් නොතිබීම, ස්වකීය පැවැත්ම සඳහා අවශ්‍ය තත්ත්වය වශයෙන් පවතින දේපොළ ක්‍රමය නැති කර දැමීමට අප අදහස් කරන නිසා ඔබ අපට දෙස් පවරන්නෙහිය.

එක වචනයකින් කියතොත්, ඔබේ දේපොළ නැති කිරීමට අදහස් කිරීම ගැන ඔබ අපට දෙස් පවරන්නෙහිය. සත්තකින්ම එසේය. අපි ඇත්ත වශයෙන්ම එසේ කිරීමට අදහස් කරමු.

ශ්‍රම ශක්තිය ප්‍රාග්ධනය, මුදල්, ඉඩම් බදු කුලිය බවට තවදුරටත් පරිවර්තනය කිරීමට නොහැකි, කෙටියෙන් කියතොත්, ඒකාධිකාරී බලයකට නතු කළ හැකි සාමාජීය බලයට පරිවර්තනය කළ නොහැකි මොහොතේ සිට එනම්, පෞද්ගලික දේපොළ ධනවාදී දේපොළ බවට තවදුරටත් පරිවර්තනය කළ නොහැකි මොහොතේ සිට, පෞද්ගලිකත්වය විනාශ වෙතියි ඔබ කියන්නෙහිය.

එබැවින් පුද්ගලයා යනුවෙන් ඔබ අදහස් කරන්නේ ධනපතියා හැර, නැතහොත් ධනවාදී දේපොළ හිමියා හැර අන් කිසිවකු නොවන බව ඔබ නොසඟවා පිළිගත යුතුය. මෙවැනි පුද්ගලයකු සැබවින්ම නැතිකර දැමිය යුතුය.

කොමියුනිස්ට්වාදය සමාජයේ ඵල අයත් කැර ගැනීමේ හැකියාව කිසිවකුගෙන් පැහැර නොගනී. එවැනි අයත් කැර ගැනීම් මගින් අනුන්ගේ ශ්‍රමය වහල් කැර ගැනීමේ හැකියාව ඔහුගෙන් උදුරා ගැනීම පමණක් එය ඉටු කරලයි.

පෞද්ගලික දේපොළ අහෝසි කැර දැමීමෙන් ඉක්බිතිව, හැම වැඩක්ම නතර වී, සමස්ත ලෝක අලසභාවයක් රජ කරනු ඇතැයිද යනුවෙන් විරුද්ධත්වයක් මතු කොට ඇත.

මෙය සත්‍යයක් නම්, අලසකම නිසා ධනවාදී ලෝකය විනාශ වී යා යුතුව තිබුණේ මීට බොහෝ කලකට පෙරය. මන්දයත්, එම සමාජය තුළ වැඩ කරන අය සතුව කිසිවක් නොතිබුණු බැවිනි. සියලු දේපොළ අයත් කරගෙන සිටිනවුන් වැඩ නොකරන බැවිනි. ප්‍රාග්ධනය තවදුවරටත් නොපවතින කල්හි, වැටුප් ශ්‍රමයකටද පැවැතිය නොහැකි යැයි කියන විට මුළු මහත් විරුද්ධත්වය අන් කිසිවක් නොව පුනර්වාචකයේ තවත් ප්‍රකාශනයක් පමණකි.

ද්‍රව්‍යමය භාණ්ඩ නිපැදවීමේ සහ අයත් කැර ගැනීමේ කොමියුනිස්ට්වාදී ආකාරයට එරෙහිව ඉදිරිපත් කරන සියලු විරුද්ධත්වයන් බුද්ධිමය ඵල නිපදවීමේ සහ අයත් කැර ගැනීමේ කොමියුනිස්ට්වාදී ආකාරවලට එරෙහිවද එලෙසම ඉදිරිපත් කර ඇත. ධනපති පංතියට අයත් දේපොළ අහෝසි කර දැමීම, මුළු මහත් නිෂ්පාදනයම අහෝසි කර දැමීමක් ලෙස ධනපතියා විසින් ගණන් ගනු ලබන්නේ යම්සේද එසේම ධනපති පංතියට අයත් සංස්කෘතිය අහෝසි කරලීම, සංස්කෘතිය සමස්තයක් වශයෙන් අහෝසි කරලීමක් සේ ඔහු සලකයි.

නැති වී යාම නිසා ඔහුගේ දොම්නසට භාජනය වී ඇති ඒ සංස්කෘතිය අති මහත් බහුතරයට නම්, යන්ත්‍රයක් වශයෙන් ක්‍රියා කිරීම සඳහා දෙනු ලබන පුහුණුවක්

පමණකි.

එහෙත් ධනවාදී දේපොළ අහෝසි කරලීම මැන බැලීම පිණිස ස්වාධීනත්වය, සංස්කෘතිය සහ නීතිය ආදිය පිළිබඳවූ ඔබේ සංකල්ප යොදන තුරු ඔබ අප සමග විවාද නොකරන්න. ඔබගේ නීති සංග්‍රහය, සියලු දේ මත බලපාන නීතියක් දක්වා උසස් කරන ලද ඔබ පංතියේම අභිමතය වන්නා සේම, ඔබේ පංතියේ පැවැත්ම පිළිබදව වූ ද්‍රව්‍යමය තත්ත්වයන් මගින් තීරණය කරනු ලබන අභිමතයක් වන්නා සේම, ඔබේ සංකල්පද ධනපති නිෂ්පාදන සබඳතාවයන් සහ ධනපති දේපොළ අයිතිය පිළිබඳ ධනවාදී සබඳතාවයන්ගේ ඵලය වෙයි.

නිෂ්පාදන සබඳතාවයන්ගෙන් සහ දේපොළ පිළිබඳ සබඳතාවයන්ගෙන් පැන නගින සාමාජීය ස්වරූපයන් නිෂපාදන සංවර්ධන ක්‍රියාදමයේදී ඇති වී, නැති වී යන ඓතිහාසික සබඳතාවයන් ස්වභාව ධර්මයේ සහ ප්‍රබුද්ධත්වයේ සදකාලීන නීති බවට පරිවර්තනය කිරීමට ඔබ පොළඹවාලන ඒ ආත්මාර්ථකාමී සාවද්‍ය විකල්පනය ඔබට පමණක් සීමාවූවක් නොව, ඔබට කලින් පැවැති සහ අභාවයට ගිය හැම පාලක පංතියකටම පොදු වූවකි. පෞරාණික දේපොළ පිළිබඳවත්, රදළවාදී දේපොළ පිළිබඳවත් ඔබේ වැටහීම හා ඔබේ පිළිගැනීම ධනවාදී දේපොළ සම්බන්ධයෙන් ඔබ වටහා ගැනීමට කොහෙත්ම පිළිගැනීමට සූදානම් නැත.

පවුල විනාශ කර දැමීම! අති රැඩිකල්වාදී පුද්ගලයා පවා මෙම ඉතා අපකීර්තිමත් අභිප්‍රාය නිසා කෝපාන්විත වෙයි.

සමකාලීන, ධනවාදී පවුල පදනම් වී තිබෙන්නේ කුමන අත්තිවාරමක් මතද? ප්‍රාග්ධනය මතය, පෞද්ගලික ලාභය මතය. සම්පූර්ණ ලෙස වර්ධනය වූ ස්වරූපයකින් මේ පවුල පවතින්නේ ධනපති පංතිය සඳහා පමණකි. එහෙත් මේ තත්ත්වයෙහි අනුපූරකය වී ඇත්තේ නිර්ධනීන් අතර නියම පවුල් ජීවිතයක් නොමැති වීමත් ප්‍රසිද්ධ ගණිකා වෘත්තියක් තිබීමත්ය.

මේ අනුපූරකය අතුරුදහන් වන විට, ධනවාදී පවුලද ස්වභාවයෙන්ම අතුරුදහන් වෙයි. ප්‍රාග්ධනය අතුරුදහන් වීමත් සමගම මේ දෙකම අතුරුදහන් වන්නේය.

ඔබ අපට චෝදනා කරන්නේ, දරුවන් ස්වකීය දෙමාපියන් විසින් සූරා කෑම නවත්වාලීමට අපට වුවමනා නිසා ද? මේ අපරාධයට වැරදිකරුවන් බව අපි පිළිගනිමු.

එහෙත් ගෘහමය අධ්‍යාපනය නැති කැරැ දමා ඒ වෙනුවට සාමාජීය අධ්‍යාපනයක් ඇති කරන විට, මිනිසාට අතිශයින්ම වටනා සබඳකම් අප විනාශ කරතියි ඔබ පවසන්නෙහිය.

ඔබේ අධ්‍යාපනය සාමාජීය නොවන්නේද? නියම හෝ අනියම් හෝ වශයෙන් කැරෙන සමාජයේ මැදිහත්වීම මගින් පාසල් මාධ්‍යයෙන් ඔබ අධ්‍යාපනය දෙන්නේ යම් සාමාජීය තත්ත්වයන් යටතේද, එම සාමාජීය තත්ත්වයන් මගින් එය තීරණය නොවන්නේද? අධ්‍යාපනය දීමේදී සමාජයේ බලපෑම කොමියුනිස්ට්වාදීන් විසින් මවනු ලැබූ දෙයක් නොවේ. එම අධ්‍යාපනයේ ස්වරූපය පමණක් වෙනස්

කිරීම කොමියුනිස්ට්වාදීන්ගේ වෑයම වෙයි. පාලක පංතියේ බලපෑමෙන් අධ්‍යාපනය ගලවා ගැනීම පමණකි.

සමකාලීන මහා පරිමාණ කර්මාන්තයේ සංවර්ධනය මගින් නිර්ධනීන් අතර ඇති සියලු පවුල් සබඳතාවයන් ඉරා දමන තරමට නිර්ධනීන්ගේ දූ දරුවන් සරල වෙළඳ භාණ්ඩ බවට හා ශ්‍රම උපකරණ බවට පරිවර්තනය කරන තරමට, පවුල සහ අධ්‍යාපනය ගැනත්, දෙමාපියන් සහ දූ දරුවන් අතර මෘදු සබඳකම් ගැනත් වූ ධනවාදී පංතියේ රැවටිලි සහගත හිස් ප්‍රලාප තවදුරටත් පිළිකුල් සහගත වෙයි.

එහෙත් කොමිනියුස්ට්වාදීන් වන නුඹලා ස්ත්‍රීන් පොදුවේ පාරිභෝග කිරීමකට ඉදිරිපත් වී ඇතැයි ධනපතීහු එකහඬින් බෙරිහන් දෙති.

ධනපතියා සිය බිරිඳ සලකන්නේද හුදෙක් නිෂ්පාදන උපකරණයක් ලෙසටය. සියලු නිෂ්පාදන උපකරණ පොදුවේ පාවිච්චි කිරීමට යන බවක් ඔහුට ඇසෙයි. ඒ අනුව ස්වභාවයෙන්ම පොදු පාරිභෝජනයේ ඉරණම එලෙසම ස්ත්‍රීන්ටද බලපාතියි යන අදහස හැර වෙනත් දෙයක් සිතාගැනීමට හේ අපොහොසත් වෙයි.

ස්ත්‍රීන් හුදෙක් නිෂ්පාදන උපකරණ පමණක් හැටියට සිටීමේ තත්ත්වයෙන් ඔවුන් මුදවාලීම අපේ අරමුණ යැයි අනුමාන වශයෙන් කල්පනා කිරීමට තරම්වත් ඔහුට ශක්තියක් නැත.

කොමිනියුනිස්ට්වරුන් නිල වශයෙන් පිහිටුවාලීමට යතියි ධනපතීන් කියන ස්ත්‍රීන් පොදුවේ පාරිභෝජනය කිරීමේ ක්‍රමය කෙරෙහි ධනපතීන් දක්වන උසස් අධ්‍යාත්මික කෝපයට වඩා හාස්‍යජනක දෙයක් තවත් නැත. ස්ත්‍රීන් පොදුවේ පාරිභෝජනය කිරීම කොමිනියුස්ට්වරුන්ට අළුතින් ඉදිරිපත් කිරීමට වුවමනාක් නැත. එය අනාදිමත් කාලයක සිට පැවත එන්නකි.

අපේ ධපතියෝ ප්‍රසිද්ධ ගණිකාවන් හැරුණු විට, නිර්ධනීන්ගේ බිරියන් හා දූවරුන් ද තමනට රිසි සේ පාවිච්චි කරති. ඔවුනොවුන්ගේ බිරියන් සමග අනාචරයේ හැසිරෙමින් ඉන් ඉමහත් තෘප්තියක් ලබති.

ධනවාදී විවාහය සැබවින්ම පොදු භාර්යා ක්‍රමයකි. එබැවින් කොමියුනිස්ට්වාදීන්ට විරුද්ධව ධනපතීන්ට කළ හැකි උපරිමය දෝෂාරෝපණය වන්නේ වංචනික ලෙස සඟවා ඇති පොදු භාර්යා ක්‍රමය නිල වශයෙන් විවෘත ලෙස කිරීමට යන්නේය කියාය. වත්මන් නිෂ්පාදන ක්‍රමය අහොසි කර දැමීමත් සමගම ඒ සමාජ ක්‍රමයයෙන් පැන නැගි පොදු භාර්යා ක්‍රමයත්, එනම් ප්‍රසිද්ධියේ සහ අප්‍රසිද්ධියේ කැරෙන ගණිකා වෘත්තියත් අහෝසි විය යුතු යැයි මින් ප්‍රත්‍යක්ෂ ලෙසම පැහැදිලි වෙයි.

කොමියුනිස්ට්වාදීන් වෙත එල්ල කරන තවත් දෝෂාරෝපණයක් නම්, රට, ජාතිය අහෝසි කර දැමීමට ඔවුන් ඉදිරිපත් වී සිටින බවය.

වැඩ කරන කම්කරුවන්ට රටක් නැත. ඔවුනට නැති දෙයක් ඔවුන්ගෙන් පැහැර ගත නොහැකිය. නිර්ධන පංතිය ප්‍රථම කොටම, දේශපාලන ආධිපත්‍යය ලබාගත යුතු බැවින්, ජාතික පංතිය දක්වා උසස් විය යුතු බැවින්, මත ජාතියෙන්ම

සමන්විත විය යුතු බැවින්, එතරම් දුරට එය ජාතික විය යුතුය. එහෙත් ධනවාදී අර්ථය අනුව ජාතික ලෙස නොවේ.

ධනපති පංතියේ වර්ධනයද, නිදහස් වෙළඳාමද, සමස්ත ලෝක වෙළඳ පොළද, කර්මාන්ත නිෂ්පාදනයේ ඒකතානමය භාවයද, ඊට අනුරූපී ජීවන තත්ත්වයන්ද හේතු කොට ගෙන, ජනතාවන් අතර ජාතික වෙනස්කම් සහ ප්‍රතිසතිතයන්ද වඩ වඩාත් අතුරුදහන් වෙමින් පවතී.

නිර්ධන පංතික ආධිපත්‍ය විසින් මේ අතුරුදහන් වීම වඩාත් වේගවත් කරනු ඇත. යටත් පිරිසෙයින් සභ්‍ය රටවල ඒකීය ක්‍රියාකාරීත්වය නිර්ධන පංතියේ විමුක්තිය සඳහා අවශ්‍ය මුල් කොන්දේසිවලින් එකකි.

එක් පුද්ගලයෙක් තවත් පුද්ගලයකු සූරාකෑම අවසන් කර දමන ප්‍රමාණයට සමානුපාතිකව එක් ජාතියක් තවත් ජාතියක් සූරාකෑමද අහෝසිකර දමනු ඇත.

එක් ජාතියක් තුළ පංතීන් අතර ඇති විරෝධය අතුරුදහන් වන ප්‍රමාණයට සමානුපාතිකව ජාතීන් අතර ඇති සතුරු ආකල්පයන්ද අඩු වනු ඇත.

ආගමික, දර්ශනික සහ දෘෂ්ටිමය ස්ථාවරයන් මත පිහිටා කොමිනියුස්ට්වාදයට විරුද්ධව එල්ල කරන චෝදනා බැරෑරුම් පිරික්සුමට හසු කිරීමට තරම් සුදුසු ඒවා නොවේ.

ජීවන තත්ත්වයන් සමග, එහි සාමාජීය සබඳතාවයන් සමග, සාමාජීය ජීවිතයෙහි ඇති වන හැම වෙනස්වීමක් සමග මිනිසාගේ අදහස්, දෘෂ්ටිය සහ සංකල්පනා, එක වචනයකින් කියතොත්, ඔහුගේ සවිඥානය වෙනස් වන බව වටහා ගැනීමට විශේෂ ගැඹුරු බුද්ධියක් අවශ්‍ය වන්නේද ?

ද්‍රව්‍යමය නිෂ්පාදනය වෙනස් වන තරමට, ඊට සමානුපාතිකව අධ්‍යාත්මික නිෂ්පාදනය වෙනස් වන්නේ යැයි හැරුණු විට, සංකල්ප පිළිබඳ ඉතිහාසය වෙන කුමක් ඔප්පු කරන්නේද? හැම කාලයකටම බලපෑ අදහස් එම කාලයේ පාලක පංතියේ අදහස් විය.

මුළු මහත් සමාජය විප්ලවයට හසු කරන සංකල්ප ගැන පවසති; එයින් අදහස් කරන්නේ අන් කිසිවක් නොව, පැරණි සමාජයක් තුළ අළුත් සමාජයක බීජයක් හටගෙන තිබෙන බවය, ජීවත්වීමේ පැරණි තත්ත්වයන් අභාවයට යන අතර එයත් සමග අත් වැල් බැඳගෙන පැරණි සංකල්පයන් ද අභාවයට යන බවය.

පැරණි ලෝකය විනාශයේ ගැට්ට වෙත ළංවූ විට, පැරණි ආගම් පරදවා ක්‍රිස්තියානි ආගම ජය ගත්තේය. 18 වැනි ශතවර්ෂයේදී ක්‍රිස්තියානි සංකල්ප තාර්කික හේතුවාදී සංකල්පයට යටවී අභාවයට යත්ම, රදළවාදී සමාජය එවකට විප්ලවවාදී වැ සිටි ධනවාදී පංතියට විරුද්ධව මාරක සටනක යෙදුණේය. ආගමික නිදහස සහ හෘදය සාක්ෂියේ නිදහස අරභයා වූ සංකල්ප පිළිබඳ ක්ෂේත්‍රයේ නිදහස් තරඟයේ ආධිපත්‍යය පමණක් ප්‍රකාශ කළේය.

''ඓතිහාසික සංවර්ධන ක්‍රියාදාමයේ දී ආගමික, සදාචාරාත්මක, දර්ශනික, දේශපාලනමය සහ නීතිමය සංකල්ප විකරණයට භාජනය වූ නමුදු ආගම, සදාචාරය,

දර්ශනවාදය, දේශපාලන විද්‍යාව සහ නීතිය මේ වෙනස් වීමට හසු නොවී ආරක්ෂා වී ඇතැ'' යි අපට කියනු ඇත.

''එපමණක් නොව, සමාජ සංවර්ධනයේ සියලු අවධිවලට පොදු වූ නිදහස, සාධාරණත්වය, ආදී සදකාලික සත්‍යයන්ද ඇත. එහෙත් කොමියුනිස්ට්වාදය සියලු සදකාලික සත්‍යයන් අවලංගු කරයි. ආගම් සහ සදචාරයන් නව පදනමක් මත පුනඃස්ථාපනය කරනවා වෙනුවට කොමින්යුස්ට්වාදය ඒවා සියල්ල අවලංගු කරයි. ඒ අනුව එය මෙතෙක් පැවති සියලු ඓතිහාසික ක්‍රියාදාමයේ අත්දැකීම්වලට විරුද්ධය."

මේ චෝදනාවේ තේරුම කුමක්ද? සියලු අතීත සමාජවල ඉතිහාසය, විවිධ යුගවලදී විවිධ ස්වරූපයන් ගත් පංති ප්‍රතිසතවල සංවර්ධනයෙන් සමන්විත වී තිබීමය.

එහෙත් අතීත යුග කිනම් ස්වරූපයක් ගත්තද, ඒ සියලු යුගවලට පොදු වූයේ සමාජයේ එක් කොටසක් අනිත් කොටස් සූරාකෑමයි. එබැවින් අතීත යුගවල සාමාජීය විඥනය අනේක විවිධත්වයක් සහ නානාත්වයක් ප්‍රදර්ශනය කළද, එය පංති ප්‍රතිසතිතයන්ගේ පූර්ණ අතුරුදහන් වීමක් සමග මිස, සම්පූර්ණයෙන් අතුරුදහන් විය නොහැකි යම් පොදු ආකාරයන් තුළම මිස, පොදු සංකල්පයන් තුළම ගමන් කිරීම මවිතයට කරුණක් නොවේ.

කොමියුනිස්ට් විප්ලවය සාම්ප්‍රදයික දේපොළ සබඳතාවලින් සම්පූර්ණයෙන්ම කැඩී යාමක් ඇති කරයි. එය සිය සංවර්ධනයේදී සාම්ප්‍රදයික අදහස්වලින් හාත්පසින්ම කැඩී වෙන්වී යාමක් ඇති කිරීම විමතියට හේතුවක් නොවේ.

එසේ වුවද, කොමිනියුස්ට්වාදයට විරුද්ධව නගන ධනවාදී චෝදනාවලට පිළිතුරු සැපයීම මින් නවත්වමු.

කම්කරු පංති විප්ලවයේ ප්‍රථම පියවර වන්නේ නිර්ධන පංතිය පාලක පංතිය බවට නගා සිටුවීම බවත්, ප්‍රජාතන්ත්‍රවාදය දිනා ගැනීම බවත් අපි ඉහතින් දුටිමු.

පියවරෙන් පියවර සකල විධ ප්‍රාග්ධනය ධනපති පංතියෙන් උදුරා ගැනීමටද, රාජ්‍ය හස්තයෙහි, එනම් පාලක පංතිය ලෙස සංවිධානය වන නිර්ධන පංතිය අතෙහි සියලු නිෂ්පාදන උපකරණ මධ්‍යගත කිරීමටද, හැකි තරම් අධික වේගයකින් නිෂ්පාදන බලවේගයන්ගේ සමස්තය වැඩි කරලීමටද නිර්ධන පංතිය ස්වකීය දේශපාලනමය ආධිපත්‍ය පාවිච්චි කරනු ඇත.

සත්තකින්ම පටන් ගැනීමේදී දේපොළවල අයිතිවාසිකම් තුළට, ධනවාදී නිෂ්පාදන සබඳතාවයන් තුළට ඒකාධිපති ලෙස කඩා වදින්නේ නැතිව, එනම් ආර්ථික වශයෙන් නොසෑහෙන සහ තහවුරු කළ නොහැකි ඒවා සේ පෙනෙන, එනමුදු ව්‍යාපාරය ගෙනයාමේදී තවදුරටත් ඉදිරියට ගමන් කරන, පැරණි සමාජ ක්‍රමය තුළට තවදුරටත් කඩා වැදීම අවශ්‍ය කරන්නාවූ මුළු මහත් නිෂ්පාදන විධියේ පෙරළියක් සඳහා මාධ්‍යයක් වශයෙන් අනිවාර්ය වූ පියවරවල් නොගෙන, මෙය සපුරාලිය නොහැකිය.

සත්තකින්ම මේ පියවරවල් විවිධ රටවල විවිධාකාර වන්නේය.

එසේ වුවද, පහත සටහන් පියවරයන් ඉතා දියුණු රටවල්වලට පොදුවේ බොහෝ දුරට ගැළපේ:

1. ඉඩම් අයිතිය අහෝසි කරලීම සහ ඉඩම්වලින් ලැබෙන සියලු බදුකුලී රජයේ වියදම් සඳහා යෙදවීම.

2. ඉහළ මට්ටමේ අනුක්‍රම අය බද්දක් හෝ ක්‍රමාංකික අයබද්දක් පැනවීම.

3. ජන්මයෙන් දේපොළ අයිතිවීමේ සියලු අයිතිය අහෝසි කරලීම.

4. සියලු විශ්‍රාමිකයින්ගේ සහ සියලු කැරළි කරුවන්ගේ දේපොළ රාජසන්තක කිරීම.

5. රාජ්‍ය ප්‍රාග්ධනයෙන් සහ සුවිශේෂ ඒකාධිකාරයකින් යුත් ජාතික බැංකුවල මාධ්‍යයෙන් ණය ගනු දෙනු රජය අත මධ්‍යගත කිරීම.

6. ප්‍රවාහන මාධ්‍යයන් රාජය අත මධ්‍යගත කිරීම.

7. රජය සතු කර්මාන්ත ශාලාවලත්, නිෂ්පාදන උපකරණවලත් සංඛ්‍යාව වැඩි කිරීම, පොදු සැලැස්මකට අනුකූලව මුඩු බිම් වගා කිරීම සහ පස සශ්‍රික කිරීම.

8. සියලු දෙනාටම එක හා සමාන ශ්‍රම වගකීමක් ඇති කරලීම. කෘෂිකර්මය සඳහා විශේෂ වූ සහ වෙනත් කාර්මික හමුදා ද පිහිටුවාලීම.

9. කෘෂිකර්මය කර්මාන්තය සමග සම්බන්ධ කරලීම. ජනගහණය වඩාත් සමාන ලෙස රට පුරා විසුරුවා හැරීම මගින් නගරයත් ගමත් අතර ඇති වෙනස තුරන් කරලීම.

10. සියලු ළමයින්ට ප්‍රසිද්ධ පාසල්වල නොමිලේ අධ්‍යාපනය ලබාදීම, කර්මාන්ත ශාලාවල ළමයින්ගෙන් වැඩ ගැනීමේ අද්‍යතන ක්‍රමය අහෝසි කිරීම, අධ්‍යාපනය කාර්මික නිෂ්පාදනය සමග සංයෝජනය කරලීම, ආදිය වේ.

සංවර්ධන ක්‍රියා සන්තතියේදී පංති ප්‍රභේද නැති වී, මුළු මහත් නිෂ්පාදනයම පුද්ගලයින්ගේ දැවැන්ත සමාගමයක් තුළ සංකේන්ද්‍රනය වූ විට, පොදු බලයේ දේශපාලනමය ස්වරූපය අහෝසි වී යනු ඇත. වචනයේ පරිසමාප්ත අර්ථය අනුව දේශපාලන බලය යනු එක් පංතියක් විසින් තවත් පංතියක් පෑගීම සඳහා සාද ඇති සංවිධානාත්මක බලයයි. නිර්ධනීන් ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේදී අනිවාර්යයෙන්ම පංතියක් වශයෙන් සමගි වන්නේ නම්, විප්ලවීය මාර්ගයෙන් එය පාලක පංතිය බවට පත්වන්නේ නම්, පාලක පංතිය ලෙස එය පැරණි නිෂ්පාදන සබඳතාවයන් බලාත්කාරයෙන් ඉවත ලන්නේ නම් එවිට නිර්ධන පංතිය, පංති ප්‍රතිසතයන් පැවැත්මේ තත්ත්වයන් නැති කරලයි, පොදුවේ පංතීන්ගේ පැවැත්මද අහොසි කර දමයි. එසේ කිරීමෙන් පංතියක් වශයෙන්, ස්වකීය ආධිපත්‍යයද අහෝසි කරලයි.

පංතිවලින් සහ පංති ප්‍රතිසතිතවලින් සමන්විත පැරණි ධනවාදී සමාජය වෙනුවට, හැම කෙනෙකුගේම ස්වාධීන සංවර්ධනය, සියලු දෙනාගේම ස්වාධීන

සංවර්ධනයේ කොන්දේසිය බවට පත්වන සමාගමයක් ඇති වන්නේය.

# III. සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍ය

## 1. ප්‍රතිගාමී සමාජවාදය

### (අ) රදළ සමාජවාදය

ප්‍රංශ හා ඉංග්‍රීසි රදළ පෙළැන්තිය සිය ඓතිහාසික තත්ත්වයන් නිසාම, සමකාලීන ධනවාදී සමාජයට විරුද්ධව පත්‍රිකා ලිවීම වෘත්තියන් බවට පත් කරගත්තේය. 1830 ජුලි මස සිදු වූ ප්‍රංශ විප්ලවයේදීද, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණය[30] සඳහා එංගලන්තයේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරයේදීද, තම වෛරයට පාත්‍ර වූ මේ උද්දච්චයා යළිත් වරක් මේ රදළ පෙළැන්තියට පරාජය ගෙන දුන්නේය. එතැන් සිට බැරෑරුම් දේශපාලන අරගලයක් කිරීම ගැන සිතීමට පවා නොහැකි විය. ඉන් පසු කළ හැකි වූයේ සාහිත්‍යමය අරගලයක් පමණකි. එහෙත් සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි වුවද, පුනඃස්ථාපන යුගය* යළි පිහටුවාලීම සඳහා යෙදූ පැරණි වාක්‍ය ඛණ්ඩ යෙදවීම තවදුරටත් කළ නොහැකි විය.

අනුකම්පාව ඇවිස්සවීම සඳහා, තම අයිතිවාසිකම් සහ වුවමනාවන් අමතක කර දමා ඇති බවක් මවාපාමින්, සූරාකෑමට භාජනය වූ කම්කරු පංතියේ අයිතිවාසිකම් හා වුවමනාවන් වෙනුවෙන් පමණක් ධනපත් පංතියට විරුද්ධව චෝදනාවන් ඉදිරිපත් කරන බවක් පෙන්වීමට රදළ පෙළැන්තියට සිදුවිය. තම නව ස්වාමියාට විරුද්ධව නින්ද සහගත ලිපි ලියමින් සහ ළඟාවෙමින් පවතින විනාශය ගැන අනාවැකි ඔහුගේ කනට කොඳුරා කියමින් සෑහීමට පත්වීමට රදළ පෙළැන්තියට සිදු විය.

රදළ සමාජවාදය බිහි වූයේ මේ ලෙසිනිඃ එය අර්ධ විලාපයකි. අඩ වශයෙන් නින්ද සහගත ලියවිල්ලකි. අතීතයේ අර්ධ දෝංකාරයකි. අනාගතය අරභයා වූ අර්ධ තර්ජනයකි. එය සමහර විට, සිය තිත්ත, උපහාසජනක, තියුණු ලෙස කා වදින විවේචන මගින් ධනපති පංති හදවතේ අරටුවට පහර එල්ල කරයි. එනමුදු හැම විටම එය සමකාලීන ඉතිහාසයේ ඉදිරි ගමන වටහා ගැනීමට සම්පූර්ණයෙන්ම අපොහොසත් වන බැවින්, හැමදම පූර්ණ හාස්‍යජනක හැඟීමක් ඇති කරලයි.

මහ ජනතාව තමා වටා එක්රැස්කරගනු පිණිස රදළ පෙළැන්තිය ධජයක් වෙනුවට නිර්ධන පංතියේ හිඟන පසුම්බිය වැනුවේය. එහෙත් ජනතාව ඔවුන් සමග එක්වූ හැම විටෙකම, ඔවුන්ගේ පසු පස පැරණි රදළ වැස්ම දුටුවෙන්, හඬ නගමින් සහ ගරු සරු රහිත සිනහ පාමින් ඔවුහු ඔවුන්ගෙන් ඈත් වූහ.

---

*(ඉංග්‍රීසි පුනඃස්ථාපන සමය (1660-1689) නොව ප්‍රංශ පුනඃස්ථාපන සමය (1814-1830) ගැනය. (1888 සංස්කරණයට එංගල්ස් විසින් ලියන ලද සටහනකි. )

ප්‍රංශ ලෙජිටිමිස්ට් වරුන්ගේන් කොටසක් සහ ''යෞවන එංගලන්ත කාරයෝ''[31] මේ හාස්‍යජනක නාටකය රඟ පෑහ.

රදළයෝ සූරාකෑමේ විධිය, ධනවාදී සූරාකෑමට වඩා වෙනස් බව පෙන්වා දෙන්නෝ නම්, ඔවුහු මීට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වූද, දැනට යල්පැන ඇත්තා වූද අවස්ථාවන් හා තත්ත්වයන් යටතේ සූරා කෑ බව අමතක කරති. සිය පාලනය යටතේදී වත්මන් නිර්ධන පංතිය කිසි කලෙකත් නොපැවති බව පෙන්වා දෙන ඔවුහු, සමකාලීන ධනපති පංතිය තම සමාජ ක්‍රමයේ අනිවාර්ය ඵලයක් බවද අමතක කරති.

කෙසේ වුවද, ඔවුන් තම විවේචනයෙහි වූ ප්‍රතිගාමී ස්වරූපය කෙතරම් අල්ප වශයෙන් සඟවතිදයත්, ධනපති පංතියට විරුද්ධව ඔවුන් ඉදිරිපත් කරන ප්‍රධාන චෝදනාවේ තේරුම, පැරණි සමාජ ක්‍රමය පුපුරුවා දමන පංතියක් ධනපති ආධිපත්‍යය යටතේ වර්ධනය වෙමින් පවතින්නේය යනුයි.

ධනපති පංතිය නිර්ධන පංතියක් බිහි කිරීම ගැන නොව, විප්ලවවාදී නිර්ධන පංතියක් බිහි කිරීම ගැන රදළයෝ වඩාත් වැඩියෙන් ධනපති පංතියට චෝදනා කරති.

එබැවින් දේශපාලන ප්‍රායෝගික කටයුතුවලදී රදළයෝ කම්කරු පංතියට විරුද්ධව සියලු ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සහභාගි වෙති. එමෙන්ම සාමාන්‍ය ජීවිතයේදී ඔවුහු කෙතරම් වාගාඩම්බර කථා දෙසා බෑවද, කර්මාන්තය නැමැති කප් රුකෙන් ස්වර්ණමය ඵල* නෙලා ගැනීමටද, බැටළු ලොම්, බීට් අලවලින් සාදන සීනි සහ අර්තාපල්වලින් පෙරන ලද මත්පැන් විකිණීම සඳහා භක්තිය, ආලය සහ ගරුත්වය හුවමාරු කර ගැනීමේ තත්ත්වය දක්වා පහතට වැටී සිටිති.

පූජකයා හැමදම ඉඩම් හිමි රදළයා සමග අත්වැල් බැඳගෙන ගමන් කළාක් මෙන්ම, පූජක සමාජවාදයද, රදළ සමාජවාදය සමග අත්වැල් බැඳගෙන ගමන් කරයි.

ක්‍රිස්තියානි තපසට සමාජවාදී පැහැයක් දීම තරම් වෙනත් පහසු දෙයක් නොමැත. කිතුණු දහම පෞද්ගලික දේපොළවලට විරුද්ධවත්, විවාහයට විරුද්ධවත්, රජයට විරුද්ධවත් ව්‍යක්ත ඝෝෂාවක යෙදී නැතිද? මේවා වෙනුවට කිතුනු දහම දන්දීම සහ දුගී බවද, බ්‍රහ්මචරියාව සහ කයට වධදීමද, ආශ්‍රම ජීවිතයද දේශනා නොකළේද? කිතුනු සමාජවාදය අන් කිසිවක් නොව, රදළයාගේ කෝපය නිවාලනු පිණිස පූජකයා ඉසින ආසිරිපැන් පමණකි.

## (ආ) සුළු ධනපති සමාජවාදය

ධනපති පංතිය විසින් විනාශ කර දමනු ලැබූ, සමකාලීන ධනවාදී සමාජය තුළ සිය

---

* (මෙය ජර්මනියට ප්‍රධාන වශයෙන් ගැලපෙයි. එහි ඉඩම් හිමි රදළ පෙළැන්තිය සහ ගම්බද ඉඩම් හිමි යුන්කර්වරු තම වතු හා ඉඩම්වලින් අති විශාල කොටසක් බාරකරුවන්ගේ මාර්ගයෙන් වගා කරවා ගත්හ. එමෙන්ම ඔව්හු බීට් සීනිවලින් සහ අර්තාපල්වලින් මත් පැන් පෙරන්නන්ද වූහ. වඩාත් පොහොසත් බ්‍රිතාන්‍ය රදළ පෙළැන්තිය මෙතරම් පහතට වැටී නැත. එහෙත් ඔවුහු ද ව්‍යාජමය බද්ධ ව්‍යාපාර වස්තු වෙළඳ සමාගම් සෑදීමට තම නම් පාවිච්චි කිරීමට ඉඩ දීම මගින් පහත වැටෙමින් පවතින බදු මුදල්වල පාඩුව පිරිමසාලීමේ ආකාරය නොදන්නෝ නොවෙති. (1888 ඉංග්‍රීසි මුද්‍රණයට එංගල්ස් ලියූ සටහනකි.)

ජීවන තත්වයන් හීන වී ගිය, සහ අභාවයට පත් වී ගිය එකම පංතිය රදළ පෙළැන්තිය පමණක් නොවේ. මධ්‍යකාලීන යුගයේ නගරවැසි කොටස්ද, සුළු ඉඩම් හිමි ගොවියෝද සමකාලීන ධනපති පංතියේ පුරෝගාමීන් වූහ. කර්මාන්තය සහ වෙළඳාම විශාල සංවර්ධනයක් ලබා නැති රටවල මේ පංතීන් දෙක දියුණු වෙමින් සිටින ධනපති පංතිය අසලින් අකර්මණ්‍ය ජීවිතයක් ගෙවති.

නවීන ශිෂ්ටත්වය පූර්ණ වර්ධනයක් ලබා ඇති රටවල ධනපති සමාජයේ අතිරේක කොටසක් ලෙස, නිතර අළුත් වැඩියා වෙමින් පවතින සුළු ධනවාදීන්ගේ නව පංතියක් සෑදී ඇත. මෙය නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර වැනෙමින් පවතී. එහෙත් තරඟයේ ප්‍රතිඵලයක් වශයෙන්, මේ පංතියට අයත් තනි, තනි සාමාජිකයෝ නිරන්තරයෙන්ම නිර්ධන පංතියට ඇද වැටෙති. එමෙන්ම මහා පරිමාණ කර්මාන්ත වර්ධනය වීමට පටන් ගැනීමත් සමගම, සමකාලීන සමාජයේ ස්වාධීන කොටසක් ලෙස සම්පූර්ණයෙන්ම අතුරුදහන් වීමත්, භාණ්ඩ නිෂ්පාදනයෙහි, කෘෂිකර්මයෙහි සහ වාණිජයෙහි තමන්ට අයත් වැ තිබූ ස්ථානවලට ඕවර්සියර්වරුන්, වතු කළමනාකරුවන් සහ වැටුප් ලබන සේවකයින් පවත්වන සැටි ඔවුනට පෙනේ.

ජනගහණයෙන් හරි අඩකටත් වඩා බොහෝ වැඩියෙන් ගොවීන් සිටින ප්‍රංශය වැනි රටවල ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතියේ පැත්ත ගත්, ගත්කරුවන් ඇති වීම ස්වභාවික දෙයක් විය. මොවුහු ධනපති පාලනයට විරුද්ධව කළ විවේචනවලදී සුළු ධනපතියාගේ සහ සුළු ගොවියාගේ මිම්ම පාවිච්චි කරමින්, සුළු ධනවාදී ස්ථාවරයක පිහිටා කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළහ. මෙලෙස සුළු ධනවාදී සමාජවාදය බිහිවිය. ප්‍රංශයෙහි පමණක් නොව එංගලන්තයෙහිද සිස්මොන්ඩ්[32] මේ දර්ශනවාදී නිකායේ ප්‍රධානියා වූයේය.

මේ සමාජවාදී නිකාය සමකාලීන නිෂ්පාදනමය සබඳතාවයන්ගේ පරස්පර විරෝධීතාවයන් අති තියුණු ලෙස පිරික්සුමට හසු කළේය. ආර්ථිකවාදීන් කෛරාටික ලෙස නිදහසට කරුණු දැක්වීමේ ඇති හිස්බව එය විසින් හෙළිදරවු කැරිණි. එය යන්ත්‍ර මගින් නිෂ්පාදනය කිරීමේද ශ්‍රම විභජනයේද විනාශකාරී විපාක ඵලයන් විවාද රහිතව පිළිගැනෙන සේ ඔප්පු කළේය. ප්‍රාග්ධනය සහ ඉඩම් අතලොස්සක් දෙනා අත සංකේද්‍රණ වීමද, අධි නිෂ්පාදනය, අර්බුද, සුළු ධනපතියාගේ සහ ගොවියාගේ නොවැළැක්විය හැකි විනාශයද, නිර්ධනීන්ගේ අන්ත දුගී භාවයද, නිෂ්පාදනයේ අරාජිකතාවයද, ධනය බෙදුහැරීමේදී ඇති වී තිබෙන සාපරාධී අසමානතාවයද, ජාතීන් අතර පවතින සමූල ඝාතන කාර්මික යුද්ධයද, පැරණි' සදචාරමය බැඳීම් දියවීයාමද, පැරණි පවුල් සබඳතාවයනුත් පැරණි ජාතීනුත් අහෝසි වී යාමද එය පෙන්වා දුනනේය.

එසේ වුවද මේ පන්නයේ සමාජවාදය සිය යථානුභූත පරමාර්ථ අතින් එක්කෝ භාණ්ඩ නිෂ්පාදනය සහ හුවමරුව අරභයා පැරණි ක්‍රමත් ඒවා සමග පැරණි දේපොළ සබඳතාවයන් පුනඃස්ථාපනය කිරීමට හෝ නැතිනම් නිෂ්පාදනය සහ හුවමාරුව අතින් දැනටමත් පුපුරුවා දමා ඇති හා අත්‍යාවශ්‍ය ලෙසම පුපුරුවා දැමිය යුතු පැරණි දේපොළ සබඳතාවයන්ගේ රාමුව තුළ නිෂ්පාදනය සහ හුවමාරුව පිළිබඳ සමකාලීන මාධ්‍යයන් බලාත්කාරයෙන් සිරකිරීමකට භාජනය කිරීමට අභිලාෂයක් දන්වයි. මේ සිද්ධීන් දෙකෙහිදී සුළු ධනපති සමාජවාදය එකවරම ප්‍රතිගාමීය, මනෝරාජික වාදීය.

කර්මාන්තයෙහි ශ්‍රෙණි සංවිධානයද, කෘෂිකර්මයෙහි පීතෘ මූලික සබඳතාවයන්ද මේ පන්නයේ සමාජවාදයේ අවසාන වචන වන්නනේය.

තවදුරටත් සිය සංවර්ධනයේදී මේ ප්‍රවණතාවය බිය සුලු මූර්ඡාවකට ඇද වැටෙයි.

## (ඇ) ජර්මන් හෙවත් ''සැබෑ'' සමාජවාදය

ආධිපත්‍යයට පැමිණ සිටින ධනපති පංතියේ පීඩනය යටතේ ඇති වූ, මෙම ආධිපත්‍යයට විරුද්ධව ගෙන ගිය අරගල ප්‍රකාශයට පත් කළ සාහිත්‍යයක් වූ ප්‍රංශයේ සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍යය ජර්මනියට ඉදිරිපත්කරනු ලැබුවේ එරටේ ධනපති පංතිය රදළවාදී ඒකාන්තවාදයට විරුද්ධව සිය අරගලය ආරම්භ කළ කාලයේදීමය.

ජර්මන් දර්ශනිකයෝද, අර්ධ දර්ශනිකයෝද, අලංකාර වාග් පාඨ දෙඩවීමෙහි රිසියෝ ද ඉමහත් ආශාවකින් යුතුව මෙම සාහිත්‍යය බද වැළඳගත් නමුදු, මේ සාහිත්‍ය කෘතීන් ප්‍රංශයේ සිට ජර්මනියට සංක්‍රමණය වන විට, ඒ සමගම ප්‍රංශයේ සමාජය තත්ත්වයන්ද ජර්මනියට සංක්‍රමණය නොවූ බව ඔවුහු අමතක කළහ. ජර්මනියේ සමාජ තත්ත්වයන් ඉදිරියේ මේ ප්‍රංශ සාහිත්‍යයෙහි ඍජු ව්‍යවහාරික වැදගත්කම සම්පූරණයෙන් නැති වී, හුදු සාහිත්‍යමය ප්‍රවණතාවයක් පමණක් ගත්තේය. විය යුතු පරිද්දෙන්ම, මානව හරය සපුරාලීම පිළිබඳව, පුහු බුද්ධිමය ස්වරූපයක් එය ගත යුතු විය. මෙලෙස දහඅට වැනි සියවසරේ ජර්මන් දර්ශනිකයින්ට පළමුවැනි ප්‍රංශ විප්ලවයේ ඉල්ලීම්, හුදෙක් ''ව්‍යවහාරික බුද්ධියේ'' ඉල්ලීම් හැටියට පෙනිණි. විප්ලවවාදී ප්‍රංශ ධනපති පංතියේ අධිෂ්ඨානය පිළිබඳ ප්‍රකාශනය, නිර්මල අධිෂ්ඨානයේ, විය යුතු ලෙසම වූ අධිෂ්ඨානයේ, පොදු වශයෙන් වූ නියම මානව අධිෂ්ඨානයේ නීති ලෙස ඔවුනට පෙනිණි.

අභිනව ප්‍රංශ සංකල්ප සිය පැරණි දර්ශනික හෘදය සාක්ෂිය සමග සංගතික ලෙස ගළපා ගැනීමට පමණක් නැතිනම් සිය දර්ශනික අදහස් බැහැර නොකර ප්‍රංශ සංකල්ප ඇඳා ගැනීම තම කෘති මගින් ජර්මන් සාහිත්‍ය වේදීහු කළහ.

අනුවාදය මගින් විදේශීය භාෂාවක් උකහා ගන්නා අන්දමට, මෙම උකහා ගැනීමද සිදු විය.

කිතුනු සමය නොදත් පැරණි ලෝකයේ ආවීර්ණ කල්පික ග්‍රන්ථවල මුල් පිටපත් මතු පිට පූජකයින් විසින් කතෝලිකාගමේ ශුද්ධවන්තයින්ගේ ජීවන චරිත අමන ලෙස ලියන ලද ආකාරය සුප්‍රකටය. ධර්ම ඥනයෙන් තොර වූ ලෞකික සාහිත්‍ය අරභයාද, ජර්මන් සාහිත්‍ය වේදියෝ මෙම ක්‍රියාදමය අනික් අතට යෙදවූහ. ප්‍රංශ මුල් පිටපත්වලට යටින්, ඔවුහු සිය දර්ශනික පල්හැලි ලියා තැබූහ. නිදසුනක් වශයෙන්, මුදල්වල ආර්ථික කාර්යයන් පිළිබඳව ප්‍රංශ විවේචනයට යටින් ඔවුහු ''මනුෂ්‍යත්වය අන්සතු කිරීම'' ලියූහ. ධනවාදී රජය පිළිබඳව ප්‍රංශ විවේචනයට යටින් ''වියුක්ත-ව්‍යාප්තියේ ආධිපත්‍ය නැති කර දැමීම'' ආදිය ලියූහ.

ප්‍රංශ න්‍යායයට යටින් සිය දර්ශනවාදී වාක්‍ය ඛණ්ඩ ඉදිරිපත් කිරීම ඔවුන්

හැඳින්වූයේ ''ක්‍රියාකාරීත්වයේ දර්ශනවාදය'', ''සැබෑ සමාජවාදය'', ''සමාජවාදයේ ජර්මන් විද්‍යාව'', ''සමාජවාදයේ දර්ශනික පදනම'' ආදී වශයෙනි.

මේ අන්දමට ප්‍රංශ සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍යය සම්පූර්ණයෙන්ම දුර්වල කරන ලදි. තවද ජර්මන් කාරයා අතට පත් වූ එම සාහිත්‍යයෙන් එක් පංතියක් තවත් පංතියකට විරුද්ධව ගෙනයන අරගලය ප්‍රකාශ කිරීම නිමාවට පත් වූ නිසා මෙයින් ''ප්‍රංශ ඒක පාර්ශ්විකත්වය'' අභිභවා නැගී සිටියේ යැයිද, සත්‍ය වුවමනාවන් නොව, සත්‍යයේ වුවමනාවන්, නිර්ධන පංතික වුවමනාවන් නොව, මිනිස් ස්වභාවයේ වුවමනාවන්, කිසිදු පංතියකට අයත් නැති, යථාර්ථවාදී නොවන දර්ශනවාදී මනස් සෘෂ්ටිය නැමැති මීදුම් පටලයක් තුළ පවතින මිනිසාගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බව ඔහුට හැඟිණි.

තම සිප්කැම් අභ්‍යාසය මෙතරම් භාර දූර ලෙස සහ ගාම්භීර ලෙස හිසට ගත්තා වූ සහ එය මෙතරම් කෑකෝ ගසමින් වර්ණනා කළා වූ මෙම ජර්මන් සමාජවාදය, සිය පණ්ඩිත මානීත්වය ටිකෙන් ටික නැති කර ගත්තේය.

රදළ පෙළැන්තියට සහ නිරපේක්ෂ රාජාණ්ඩුවට විරුද්ධව ගෙනගිය ජර්මන් ධනපති පංතියේ, විශේෂයෙන් ප්‍රුසියන් ධනපති පංතියේ සටන, එක් වචනයකින් කියතොත්, ලිබරල්වාදී ව්‍යාපාරය වඩාත් බැරෑරුම් විය.

දේශාපලන ව්‍යාපාරය ඉදිරිපිට සමාජවාදී ඉල්ලීම් ඉදිරිපත් කිරීමටත්, ලිබරල්වාදයට විරුද්ධවද, නියෝජිත ආණ්ඩු ක්‍රමයට විරුද්ධවද, ධනවාදී තරඟයට, ධනවාදී පුවත්පත් නිදහසට, ධනවාදී ව්‍යවස්ථාපනයට, ධනවාදී නිදහසට සහ සමානාත්මතාවයට විරුද්ධවද පාරම්පරික අභිශාප ඉදිරිපත් කිරීමටත්, මේ ධනවාදී ව්‍යාපාරය මගින් තමන්ට දිනා ගැනීමට කිසිවක් නැති අතර හැම දෙයක්ම නැති වී යාමේ අනතුරට මූණ පාන බව දේශනා කිරීමටත්, මේ මගින් ''සැබෑ'' සමාජවාදයට දිගු කලක් තිස්සේ පතමින් සිටි ස්වර්ණමය අවස්ථාව ලැබිණි. ජර්මනියේ, ඒවා දිනා ගැනීම අවශ්‍යය යන අරමුණු වල පමණක් තවමත් තිබෙන පූර්වාවයවයන්, එනම් ආර්ථිකමය ජීවන තත්ත්වයන් සහ එයට ගැළපෙන සේ සකස්වුණු දේශපාලන ව්‍යවස්ථාවකින් යුක්තව සමකාලීන ධනවාදී සමාජය පවතින බව ප්‍රංශ විවේචනය පූර්ව කල්පනාවෙක යෙදුණු බැව්, එහිම සංවේගදයී දෝංකාරයක් වූ ජර්මන් සමාජවාදය අවශ්‍යතම මොහොතේදීම අමතක කළේය.

පූජකයින්, පාඨශාලා අධිකාරීන්, ගම්බද ඉඩම් හිමි යුන්කරයින්[33] සහ නිළධාරීන් පිරිවර කොට ගත් ඒකාන්තවාදී නිරපේක්ෂ ආණ්ඩුවලට නම් මේ සමාජවාදය, තමන්ට තර්ජනය කරමින් නැඟී එන ධනපති පංතියට විරුද්ධව පාවිච්චි කළ හැකි පඹයකු විය.

එය, ජර්මන් කම්කරු පංතික කැරළි පාගා දැමීම පිණිස මේ ආණ්ඩුව දුන් කස පහරවල් සහ වෙඩි උණ්ඩ නැමැති තිත්ත පානයෙන් ඉක්බිතිව දෙන ලද මිහිරි පානයක් බඳු විය.

''සැබෑ'' සමාජවාදය ජර්මන් ධනපති පංතියට විරුද්ධව සටන් කිරීම පිණිස අවියක් ලෙස ආණ්ඩුවලට ආධාර වූ අතර එය ඒ සමගම ප්‍රතිගාමී වුවමනාවන්, එනම් ජර්මන් අවරසිකයින්ගේ වුවමනාවන් සෘජු ලෙසම නියෝජනය කළේය.

දහසයවැනි සියවසරේ අවශේෂයක් වූ, එතැන් සිට එක් හෝ තවත් ආකාරයකින් නිරන්තරයෙන්ම යළි යළිත් මතුවෙමින් පැවති සුළු ධනපති පංතිය ජර්මනියේ දැනට පවතින තත්ත්වයන්ගේ යථාර්වාදී සාමාජීය පදනම වේ.

මේ පංතිය රැක ගැනීම, ජර්මනියෙහි දැනට බලපාන තත්ත්වය ආරක්ෂා කර ගැනීමය. ධනපති පංතියේ කාර්මික සහ දේශපාලනමය ආධිපත්‍යය එක් අතකින් ප්‍රාග්ධනය සංකේන්ද්‍රණය කිරීමෙන්ද, අනික් අතින් විප්ලවවාදී නිර්ධන පංතියේ වර්ධනයෙන්ද මෙම පංතිය සිය විනාශය බියෙන් යුතුව බලා සිටී. එක් වෙඩි පහරකින් හාවුන් දෙදෙනෙකු මරා දැමීමට ''සැබෑ'' සමාජවාදය බිහි වී තිබෙන බව එයට දැනුණාක් මෙනි. ''සැබෑ'' සමාජවාදය වසංගතයක් මෙන් පැතිරිණි.

අලංකාරෝක්තිය නැමති පුෂ්පයෙන් ගෙත්තම් කළ, මෘදු චිත්තවේගය නැමැති කඳුලෙන් පොඟවා, කාල්පනිකය නැමැති මකුළු දැලෙන් ගොතන ලද මායාකාරී වස්ත්‍රය, ජර්මන් සමාජවාදීන් විසින් සිය කෙට්ටු ''සදාකාලික සත්‍යයන්'' දැවටීම සඳහා පාවිච්චි කළ මේ උත්කෘෂ්ට වස්ත්‍රය, එබඳු ජනගහණයක් ඉදිරියෙහි ඔවුන්ගේ භාණ්ඩ අලෙවිය වැඩි කිරීමට පමණක් උපකාරී විය.

ජර්මන් සමාජවාදාය තම පැත්තෙන්, සුළු ධනපති අවරසිකත්වයේ පුරාජේරුකාර නියෝජිතයා වශයෙන් වූ තම කාර්ය කොටස වඩාත් හොඳින් වටහා ගත්තේය.

ආදර්ශවත් ජාතිය ජර්මන් ජාතිය බවත්, නියම ආදර්ශවත් මිනිසා ජර්මන් සුළු ධනවාදී අවරසිකයා බවත් එය ලොවට ප්‍රකාශ කළේය. මෙම ආදර්ශවත් මිනිසා කරන සෑම දුෂ්ට නීච ක්‍රියාවකටම, එය එම ක්‍රියාවේ සැබෑ මූණුවරට වඩා හාත්පසින්ම වෙනස් වූ ගුප්තමය, උසස් සමාජවාදී අර්ථ කථනයක් දුන්නේය. ''රළු ලෙස විනාශකාරී වූ'' කොමියුනිස්ට්වාදී ප්‍රවණතාවයට ඍජු ලෙසම විරුද්ධ වීමත්, සියලු පංති අරගල කෙරෙහි වූ සිය උත්තරීතර පිළිකුල ප්‍රකාශ කරලීමටත් තරම් වූ අන්තයකට එය ගියේය. ජර්මනියෙහි දැනට (1847) ප්‍රචාරය වන ඊනියා සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී පොත් පත්වලින් ඉතා සුළු සංඛ්‍යාවක් හැර අන් සියල්ල මෙම තුච්ච, දුර්වල සාහිත්‍ය* ගණයට අයත්ය.

## 2 ගතානුගතික හෙවත් ධනපති සමාජවාදය

ධනපති සමාජයේ පැවැත්ම සහතික කරනු පිණිස සමාජීය දුක්ගැනවිලිවලට පිළියම් කිරීමට ධනපති පංතියෙන් සෑහෙන කොටසක් කැමැත්ත දක්වයි.

මෙම කොටසට ආර්ථිකවේදීන්, පරාර්ථචර්යාවාදියෝ, මානව හිතවාදියෝ, කම්කරු පංතියේ තත්ත්වය උසස් කිරීමට ආශා කරන්නෝ, පුණ්‍ය කර්මයන් සංවිධාන කරන්නෝ, තිරිසනුන්න ට වධදීම වළක්වන සමාජ වල සාමාජිකයෝ,

---

* 1848 කුණාටුව මේ අශෝභන ප්‍රවණතාවය එහෙම පිටින්ම ඉවතට ගෙන ගොස්, සමාජවාදය අත ගැමට ආශා කළ ධාරකයින්ගෙන් එය උදුරා ගන්නා ලදි. මෙම ප්‍රවණතාවයේ ප්‍රධාන නියෝජිතයා සහ සදතනික ආකෘතිය වූයේ කාල් ග්‍රැන්ය[34] (1890 ජර්මන් මුද්‍රණයට එංගල්ස් විසින් ලියන ලද සටහනකි.)

අමද්‍යප වීරයෝ, හැම තැනම සිටින විවිධ සමාජ ප්‍රතිසංස්කරණවාදියෝ ආදිය අයත් වෙති. මේ වර්ගයේ සමාජවාදය අංග සම්පූර්ණ පද්ධති බවට සකස් කොට ඇත.

ප්රුදොන් විසින් ලියන ලද ''දුගී බවේ දර්ශනවාදය'' මේ වර්ගයට නිදසුනක් සේ දැක්විය හැකිය.

සමකාලීන සමාජ තත්ත්වයන් නිසා අනිවාර්යයෙන්ම පැන නගින අරගලයන් සහ අනතුරු රහිතව තම පැවැත්මේ තත්ත්වයන් ආරක්ෂා කර ගැනීමට ධනපති සමාජවාදීන්ට අවශ්‍ය වී ඇත. විප්ලවවාදී සහ දිරාපත් කරවන කොටස්වලින් තොරව, දැනට පවතින ධනපති ක්‍රමය රැකගැනීම ඔවුන්ගේ අභිප්‍රාය වන්නේය. නිර්ධන පංතියක් රහිත ධනපති ක්‍රමයක් ඔවුනට උවමනාය. ධනපති පංතියේ ආධිපත්‍යය ඇති ලෝකයක් ඉතාම හොඳ ලෝකය බව එම පංතිය අදහස් කිරීම ස්වභාවික දෙයකි. ධනපති සමාජවාදය මේ සැනසිලිදයක සංකල්පනය අඩු වැඩි වශයෙන් අංග සම්පූර්ණ පද්ධති බවට වර්ධනය කරයි. එවැනි සමාජවාදී ක්‍රමයක් ක්‍රියාවේ යොදවන ලෙසද, එය ඔස්සේ සාමාජීය නව ජෙරුසෙලෙමක් කරා එක එල්ලේම ගමන් කරන ලෙසද, එය නිර්ධන පංතියට යෝජනා කරන විට, එය සැබවින්ම ඉල්ලා සිටින්නේ නිර්ධන පංතිය දැනට පවතින ධනපති සමාජයේ සීමාවන් තුළ සිටි යුතු බවය. එහෙත් ඒ අතරම නිර්ධන පංතිය ධනපති පංතියට තවදුරටත් වෛර නොකළ යුතු බවද එය ඉල්ලා සිටී.

ජීවත්වීමේ ද්‍රව්‍යමය තත්ත්වයන්, ආර්ථික සබඳතාවයන් වෙනස් කිරීමෙන් පමණක් මිස, හුදු දේශපාලන ව්‍යාපාරයෙන් කිසි සෙතක් ඇති නොවන බව පෙන්වා දීමෙන්, කම්කරු පංතිය ඉදිරියෙහි හැම විප්ලවවාදී ව්‍යාපාරයක්ම හෙළා දැකීමට මෙම සමාජවාදයේම, එනමුදු වඩාත් වැඩියෙන් ප්‍රායෝගික, වඩාත් අඩුවෙන් ක්‍රමානුකූල තවත් වර්ගයක් වෑයම් කළේය. ජීවත්වීමේ ද්‍රව්‍යමය තත්ත්වයන් වෙනස් කිරීම යන්නෙන් මේ වර්ගයේ සමාජවාදය, විප්ලවයකින් පමණක් සිදු කළ හැකි ධනවාදී නිෂ්පාදන සබඳතාවයන් විනාශකර දැමීමක් කොහෙත්ම අදහස් නොකරයි. එහෙත් එය ධනවාදී නිෂ්පාදන සබඳතාවයක් මත පදනම් වූ පරිපාලන ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම පමණක්, ප්‍රාග්ධනයත්, ශ්‍රමයත් අතර ඇති සබඳතාවයන්ට කිසිදු හානියක් නො කරන නමුදු හොඳටම වැඩි වුණොත් ධනපති ආණ්ඩුවේ පරිපාලන වියදම් අඩු කරන සහ එම පරිපාලනය ලිහිල් කරන ප්‍රතිසංස්කරණ ඇති කිරීමක් අදහස් කරයි.

ධනපති සමාජවාදය එයට සෑහෙන පමණින් පැහැදිලි ලෙස ප්‍රකාශ වන්නේ, එය හුදු අලංකාර භාෂා ශෛලියකට පරිවර්තනය වූ විට පමණකි.

නිදහස් වෙළඳම! කම්කරු පංතියේ අභිවෘද්ධිය සඳහාය. ආරක්ෂක තීරු බදු! කම්කරු සෙත පිණිස වන්නේය. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ! කම්කරු පංතියේ වුවමනාවන් සඳහාය - අවසාන වචන ධනපති සමාජවාදය බැරෑරුම් අර්ථයකින් යුතුව ප්‍රකාශ කළ එකම වචනයයි.

ධනපති සමාජවාදයේ හරය එක් පාඨයක් තුළ සම්පිණ්ඩනය වී ඇත - එනම් ධනපතියා ධනපතියෙකි, එහෙත් කම්කරු පංතියේ අභිවෘද්ධිය පිණිසය.

# 3 විවේචක-මනෝරාජික සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය

නූතන කාලයේ හැම ශ්‍රේෂ්ඨ විප්ලවයකදීම නිර්ධන පංතියේ ඉල්ලීම් ප්‍රකාශ කළ (බබේෆ්[35] ආදීන්ගේ කෘති වැනි) සාහිත්‍යය ගැන අපි මෙහිදී සටහන් නොකරමු.

රදළවාදී සමාජ ක්‍රමය පෙරළා දැමූ අවධියේදී, හැම තැනම කැළඹීම් පැවති කාලයේදී සිය අරමුණු ඉටු කැරගැනීම සඳහා නිර්ධන පංතිය ඍජු ලෙසම දැරූ ප්‍රථම වෑයම, එවකට නිර්ධන පංතියේ පැවැති නොදියුණු තත්ත්වය නිසාත්, තම පංතියේ විමුක්තිය සඳහා අත්‍යාවශ්‍ය ආර්ථික තත්ත්වයන් නොතිබුණු නිසාත් (නොමැති වීම නිසාත්) නොවැළැක්විය හැකි සේ අසාර්ථක විය. මන්දයත් එම අත්‍යවශ්‍ය තත්ත්වයන් ධනවාදී අවධිය විසින් බිහි කළ යුතුව තිබුණු තත්ත්වයන් බැවිනි. නිර්ධන පංතියේ මේ ප්‍රථම ව්‍යාපාර සමග පැන නැගි විප්ලවවාදී සාහිත්‍යයට අනිවාර්ය ලෙසම ප්‍රතිගාමී ස්වරූපයක් තිබිණි. එය විශ්ව තපස් දහමත් ඉතා රළු වර්ගයේ සාමාජීය සමතලා කිරීමකුත් දේශනා කළේය.

සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී ක්‍රමයන් යැයි යෝග්‍ය ලෙස නම් කරන ලද සෙන්-සිමෝන්, පූරියේ, ඕවන්[36] ආදීන්ගේ ක්‍රම බිහිවූයේ ඉහත විස්තර කරන ලද නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර පැවැති අරගලයේ මුල් නොදියුණු වකවානුවේදීය. (''ධනපතියෝ සහ නිර්ධනයෝ'' නැමැති 1 කොටස බලන්න. )

මේ ක්‍රමවල සම්පාදකවරු සැබවින්ම පංතීන්ගේ ප්‍රතිසතිතතාවයද, එවකට ආධිපත්‍යය දැරූ පංතිය තුළ විනාශකාරී කොටස්වල ක්‍රියාකාරීත්වයද දුටුවෝය. එහෙත් තවමත් බිළිඳු වියෙහි පසුවන නිර්ධන පංතියට ඓතිහාසික ස්වාධීනත්වයක් හෝ ඔවුනට ආවේණික වූ දේශපාලන ව්‍යාපාරයක් හෝ තිබෙන බවත් ඔවුහු නොදුටහ.

පංති ප්‍රතිසතිතතාවයන්ගේ සංවර්ධනය කර්මාන්තයේ දියුණුවට සමාන වේගයකින් සිදුවන නිසා තවමත් නිර්ධන පංතියේ විමුක්තියට අවශ්‍ය ආර්ථික තත්ත්වයන් සපයා නැති බව ඔවුනට පෙනිණි. එබැවින් මෙම තත්ත්වයන් බිහි කිරීමෙහි සමත් නව සමාජ විද්‍යාවක්, නව සමාජ නියාමයන් සොයන්නට වූහ.

සාමාජීය ක්‍රියාකාරීත්වයට අයත් ස්ථානය ඔවුන්ගේ පෞද්ගලික නිර්මාණශීලී ක්‍රියාකාරීත්වයට යටත් විය යුතුය. ඓතිහාසික විමුක්ති තත්ත්වයන්ට අයත් ස්ථානය මනඃකල්පිත තත්ත්වයන්ට යටත් විය යුතුය. එමෙන්ම පංතියක් වශයෙන් අනුක්‍රමයෙන් සහ ඉබේ හටගන්නා නිර්ධන පංතික සංවිධානය මොවුන්ගේ වට්ටෝරුවක් අනුව සාදන ලද සංවිධානයට යටත් විය යුතුය. ඔවුන්ගේ මතය අනුව, අනාගතයේ සමස්ත ලෝක ඉතිහාසය ඔවුන්ගේ සාමාජීය සැළැස්ම ප්‍රචාරය කිරීම සහ ප්‍රායෝගික ලෙස ක්‍රියාවට පෙරළීම බවට පත් වන්නේය.

වැඩියෙන්ම දුක් විඳින පංතිය, කම්කරු පංතිය වන බැවින් සිය ක්‍රම සම්පාදනයන් සැලැස්මානුගත කිරීමේදී එම පංතියේ අභිවෘද්ධිය ගැන ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතුය යන සවිඥනක හැඟීම ඔවුනට ඇත. ඔවුනට නිර්ධන පංතිය පවතින්නේ එය අතිශයින්ම දුක් කරදර විඳින පංතිය යන ස්ථාවරය අනුව පමණකි.

පංති සටනේ නොදියුණු තත්ත්වය නිසාත්, ස්වකීය පරිසරය නිසාත්, මේ ගණයේ සමාජවාදීහු තමන් සියලු ප්‍රතිසතිතතාවයන්ට වඩා ඉහළින් සිටින පිරිසක් ලෙස සිතාගනිති. සමාජයේ හැම සාමාජිකයකුගේම තත්ත්වය, ඉතා යහපත් තත්ත්වයෙක පවතින සාමාජිකයාගේ තත්ත්වය පවා තවත් උසස් කරලීමට මොවුනට වුවමනාය. එම නිසා ඔව්හු නිරන්තරයෙන්ම පංති ප්‍රභේදයක් නොතකා මුළු මහත් පංතියටමත්, වඩාත් වැඩි වශයෙන් පාලක පංතියටත් ආයාචනය කරති. ඔවුන්ගේ මතය හැටියට ඔවුන්ගේ සැලැස්ම ගැන දැන ගැනීම පමණක් සෑහේ. එවිට එය ඉතාම හොඳ සැළැස්ම බව සමාජය පිළිගනු ඇත.

මේ හේතුව නිසා ඔවුහු සියලු දේශපාලන ක්‍රියාවන්ද, විශේෂයෙන් විප්ලවවාදී ක්‍රියාවන්ද ප්‍රතික්ෂේප කරති. තම අරමුණු සාමකාමී ක්‍රියා මගින් සහ කුඩා පරිමාණ අත්හද බැලීම්, එම හේතුව නිසා අසාර්ථක වීමට භාජනය වූ අත්හද බැලීම් මගින්ද, ආදර්ශයේ බලපෑම මගින්ද නව සාමාජීය බයිබලයක් සඳහා මග පාද ගැනීමට ක්‍රියා කරති.

නිර්ධන පංතිය තවමත් ඉතා නොදියුණු තත්ත්වයෙක පවතින වකවානුවක, තම තත්ත්වය පිළිබඳව මනස් ෂෘෂ්ටික සංකල්පයක් පමණක් ඇති කැරගෙන සිටින වකවානුවෙක අනාගත සමාජය ගැන අඳිනු ලබන මෙවැනි මනස් ෂෘෂ්ටික චිත්‍ර සමාජයේ පොදු ප්‍රතිනිර්මාණය සඳහා වූ එම පංතියේ ප්‍රථම පූර්ව හැඟීම් සහිත අභිලාෂයන්ට ගැලපේ.

එහෙත් මේ සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී සාහිත්‍ය තුළ එමෙන්ම විවේචක කොටස්ද ඇත. ඒවා දැනට පවතින සමාජයේ සියලු පදනම්වලට පහර දෙයි. එබැවින් කම්කරු පංතියේ අධ්‍යාපනය සඳහා ඉතා අවශ්‍ය වටනා කරුණුවලින් එම සාහිත්‍ය සමන්විතය. එම සාහිත්‍ය මගින් යෝජනා කර තිබෙන ව්‍යවහාරික පියවරයන් වන නගරය සහ ගම අතර ඇති ප්‍රතිවිරෝධතාවය නැති කිරීම* ද, පවුල අහෝසි කරලීමද, වැටුප් ශ්‍රමය මගින් පෞද්ගලික ලාභ ගරා ගැනීම අහෝසි කරලීමද, සාමාජීය සංගතිය ලොවට ප්‍රකාශ කර සිටීමද, සරළ නිෂ්පාදන මෙහෙයැවීමක් දක්වා රාජ්‍යයේ කාර්යයන් පරිවර්තනය කිරීමද යන මේ සියලු යෝජනා, එවකට යම්තමින් බිහිවෙමින් පැවති, මේ සාහිත්‍ය මගින් අපැහැදිලි සහ අවිනශ්චිත ආදිතම ස්වරූපයන් වශයෙන් පමණක් හඳුනා ගනු ලැබූ පංති ප්‍රතිසතිතයන්ගේ අතුරු දහන්වීම වෙත යොමු වී තිබිණි. එම නිසා මෙම යෝජනා හුදු මනෝරාජික ස්වරූපයකින් යුක්තය.

විවේචක-මනෝරාජික සමාජවාදයේ සහ කොමියුනිස්ට්වාදයේ වැදගත්කම සහ ඓතිහාසික සංවර්ධනයත් අතර තිබෙනුයේ අපවර්තනීය සම්බන්ධකමකි. සමකාලීන පංති අරගලය වර්ධනය වන සහ නියත හැඩයක් ගන්නා ප්‍රමාණයට සමානුපාතිකව, අරගලයට ඉහළින් සිට එයින් ඈත් වී, වෙන් වී සිටීමේ මනස් ෂෘෂ්ටික ප්‍රහාරයන්ගේ මුළු ප්‍රායෝගික වටිනාකමද, මුළු න්‍යායික සහේතුක නිදෙස්භාවයද නැති වී යනු ඇත. එම නිසා මේ ක්‍රමයේ නිර්මාතෘවරුන් බොහෝ කරුණු අතින් විප්ලවවාදී වුවද, ඔවුන්ගේ ගෝළයෝ හැමදම ප්‍රතිගාමී නිකායවල් සැදූහ. නිර්ධන පංතියේ තවත් දුර සංවර්ධනය නොදකින ඔවුහු සිය ගුරුන් ගේ

---

* ඉංග්‍රීසි සංස්කරණයේ ''ප්‍රතිවිරෝධතාවය'' වෙනුවට ''වෙනස'' යන වචනය යොදා ඇත. - <u>සංස්කාරක</u>

පැරණි මතවල තදින්ම එල්ලී සිටිති. එබැවින් ඔවුහු පංති අරගලය අප්‍රාණික කිරීමටත්, පංති ප්‍රතිසතිතතාවයන් සමාදනයෙන් නිරවුල් කර දැමීමටත් නොකඩවා ක්‍රියා කරති. ඔවුහු තවමත් ස්වකීය මනෝරාජික සමාජයන් අත්හද බැලීමට සිහින දකිමින් නව ජෙරුසෙලමේ කුඩා සැලැස්ම වන හුදකලා පැලැන්ටීස් පිහිටුවාලීමටද, (*Home Colonies*) අභ්‍යන්තරික ජනපද පිහිටුවාලීමටද, කුඩා ඉකාරියා* පිහිටුවාලීමටද ක්‍රියා කරති. මේ අහස් මාලිගා ඉදි කිරීම පිණිස ධනපතීන්ගේ හදවත් වලට සහ මුදල් පසුම්බිවලට ආයාචනය කිරීමට මොවුනට සිදුවී ඇත. ඉහතින් විස්තර කළ ප්‍රතිගාමී හා ගතානුගතික සමාජවාදීන්ගේ ප්‍රවර්ගයට මොවුන් ක්‍රම ක්‍රමයෙන් වැටෙමින් සිටිති. ඔවුන් එම ප්‍රවර්ගයෙන් වෙනස් වන්නේ වඩාත් ක්‍රමානුකූල පණ්ඩිත මානීත්වය නිසාත්, තම සමාජ විද්‍යාවේ ආනුභා සම්පන්න ප්‍රතිඵල පිළිබඳව ඔවුන් තුළ ඇති අන්ධ භක්තිය නිසාත් පමණකි.

මේ හේතුව නිසා ඔවුහු කම්කරුවන්ගේ සියලු දේශපාලන ව්‍යාපාරවලට විරුද්ධ වෙති. නව බයිබලය කෙරෙහි ඇති අවිශ්වාසයේ විපාකයන් වශයෙන් එබඳු ක්‍රියාවන් ඇති විය හැකිය යනු ඔවුන්ගේ මතයය.

එංගලන්තයේ ඕවන්වාදියෝ සහ ප්‍රංශයේ පූරියේවාදියෝ පිළිවෙලින් එංගලන්තයේ චාටිස්ට්වරුන්ටද[37], ප්‍රංශයේ ප්‍රතිසංස්කරණවාදීන්ටද[38] විරුද්ධව ක්‍රියා කරති.

# IV. විවිධ රටවල විරුද්ධ පක්ෂ සම්බන්ධව කොමියුනිස්ට්වාදීන්ගේ ස්ථාවරය

දෙවැනි කොටසින් කරන ලද පැහැදිලි කිරීමෙන් ඉක්බිතිව දැනට පිහිටුවා ඇති කම්කරු පක්ෂ එනම් එංගලන්තයේ චාටිස්ට්වරුන් සහ උතුරු ඇමෙරිකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණවාදීන් කෙරෙහි කොමියුනිස්ට්වාදීන්ගේ ආකල්පය කෙබඳුද යන්න අවබෝධ කරගත හැකිය.

කම්කරු පංතියේ ක්ෂණික අරමුණු ඉටුකර ගැනීමටත්, ක්ෂණික අයිතිවාසිකම් හා වුවමනාවන් ක්‍රියාත්මක කැරැ ගැනීමටත් සටන් කරන කොමියුනිස්ට්වාදීහු අද්‍යතන ව්‍යාපාරය කර ගෙන යාමේදී, අනාගතය සඳහාද සටන් කරති. ප්‍රංශයේ කොමියුනිස්ට්වාදියෝ ගතානුගතික සහ රැඩිකල් ධනපති පංතියට විරුද්ධ ව,

---

* ෂාර්ල් පූර්යේගේ සැලැස්මයන්ට සීමාවුණු සමාජවාදී ජනපද පැලැන්ටිස් නමින් හැඳින්විණි. කබේ සිය මනෝරාජික ජනපදයට ඉකාරියා යන නම තැබීය. පසු කලෙක ඔහුගේ ඇමෙරිකානු කොමියුනිස්ට් ජනපදයද මෙනමින් හැඳින්විණි. (1888 ඉංග්‍රීසි මුද්‍රණයට එංගල්ස් ලියූ සටහනකි).

*Home Colonies* (රට තුළ ජනපද) සිය ආදර්ශවත් කොමියුනිස්ට්වාදී සමාජ ඕවන් මෙනමින් හැඳින්වීය. පැලැන්ටිස් යනු පූරියේ විසින් සිය සැලැස්මයන්ට සීමාවුණු සාමාජීය මාලිගාවලට දෙන ලද නාමයයි. ඉකාරියා යනු මනෝරාජික-මනස් ඝෂ්ටික රජයකි. මේ අපූරු රටේ කොමියුනිස්ට්වාදී සමාජය ගැන කබේ විස්තර ලියුවේය. (1890 ජර්මන් සංස්කරණයට එංගල්ස් ලියූ සටහනකි.)

සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්* සමග එකතු වෙති. එහෙත් එසේ කරන්නේ විප්ලවවාදී සම්ප්‍රදයේ සිට පැවත එන වාග් පාඨ සහ මායාමත විවේචනය කිරීමේ අයිතිය ප්‍රතික්ෂේප නොකරමිනි.

ස්විට්සර්ලන්තයේ කොමියුනිස්ට්වරු රැඩිකල්වාදීන්ට ආධාර දෙති. එහෙත් එසේ කිරීමේදී, එම පක්ෂය එකිනෙකට ප්‍රතිවිරෝධී කණ්ඩායම්වලින් සෑදී තිබෙන බවත්, කොටසක් ප්‍රංශ ශෛලිය අනුව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන් බවත්, අනික් කොටස රැඩිකල් ධනවාදීන් බවත් අමතක නොකරති.

පෝලන්තයේ ජාතික විමුක්තිය සඳහා ප්‍රධානතම කොන්දේසි වශයෙන් කෘෂික විප්ලවයක් ඇති කළ යුතුයැයි තරයේ ප්‍රකාශ කරන පක්ෂයට, 1846 ක්‍රාකොව් කැරැල්ල[40] ඇති කළ පක්ෂයට කොමියුනිස්ට්වරු ආධාර කරති.

ජර්මන් ධනපති පංතිය, නිරපේක්ෂ රාජාණ්ඩුවටත්, රදළවාදී ඉඩම් හිමියන්ටත්, ප්‍රතිගාමී අවරසිකයින්ටත් විරුද්ධව විප්ලවවාදී ලෙස ක්‍රියා කරන හැම විටදීම ජර්මන් කොමියුනිස්ට්වරු එම පංතිය සමග එකතු වී සටන් කරති.

එහෙත් ධනපති පංතිය සිය ආධිපත්‍යයත් සමගම අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු සාමාජයික සහ දේශාපාලනමය කොන්දේසි ජර්මන් කම්කරුවන් ධනපති පංතියට විරුද්ධව මෙහෙයවන අවි ලෙස ක්ෂණිකවම පාවිච්චියට ගැනීම සහතික කිරීම සඳහාද, ජර්මනියේ ප්‍රතිගාමී පංතීන් ඇද වැටුණු වහාම ධනපති පංතියට විරුද්ධව සටන අරඹාලීම සහතික කරනු සඳහාද ධනපති පංතිය සහ කම්කරු පංතිය අතර ඇති පංති ප්‍රතිසතිතතාවය පිළිබඳ වඩාත් පැහැදිලි වැටහීමක් කම්කරු පංතිය තුළ ඇති කරවා ලනු පිණිස ඔවුහු එක මොහොතක්වත් අපතේ නොයවති.

ජර්මනිය යුරෝපයේ වඩාත් දියුණු තත්ත්වයක් යටතේ පවතින නිසාත්, එංගලන්තයේ දහහත්වැනි සියවසරේදීද, ප්‍රංශයේ දහඅටවැනි සියවසරේද සිටි නිර්ධන පංතියට වඩා ඉහමත් ලෙස දියුණු වූ නිර්ධන පංතියක් සහිතව සිදුවීමට යන ධනපති විප්ලවයකට ජර්මනිය ආසන්න වී ඇති නිසාත් කොමියුනිස්ට්වාදීහු තම අවධානය ප්‍රධාන වශයෙන් ජර්මනිය කෙරෙහි යොමු කරති. එමෙන්ම ජර්මනියේ ධනපති විප්ලවය ඉන් ඉක්බිතිව ක්ෂණිකව ඇතිවිය හැකි නිර්ධන පංති විප්ලවයක ප්‍රාරම්භයක් විය හැකි බැවිනි.

එක් වචනයකින් පවසතොත්, සෑම රටකම සිටින කොමියුනිස්ට්වාදියෝ, ඒ ඒ රටවල දැනට පවතින සාමාජයික සහ දේශපාලනමය ක්‍රමවලට විරුද්ධව විප්ලවවාදී සෑම ව්‍යාපාරයකටම ආධාර දෙති.

මේ හැම ව්‍යාපාරයකම දේපොළ පිළිබඳ ප්‍රශ්නය, එම අවධියේදී එය අඩු

---

* මේ පක්ෂය එවකට පාර්ලිමේන්තුවේ ලෙද්රු-රොල්ලෙන් විසින් නියෝජනය කරන ලදි. එහි සාහිත්‍ය නියෝජිතයා වුයේ ලුවී බ්ලාන්ය[39]. මුද්‍රණයේදී එය නියෝජනය කරන ලද්දේ ලෑඞ්දෙරපෑ දිනපතා පුවත්පත විසිනි. සමාජවාදී-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යන නම ඔවුන් විසින් නිපදවන ලද්දේ ප්‍රජාතන්ත්‍රවාදී හෝ සමූහාණ්ඩුවාදී හෝ පක්ෂයේ අඩු වැඩි වශයෙන් සමාජවාදී පැහැයක් සහිත කොටස හැඳින්වීම පිණිසය. (1888 ඉංග්‍රීසි සංස්කරණයට එංගල්ස් ලියූ සටහනකි.)

හෝ වැඩි හෝ වශයෙන් දියුණු ස්වරූපයක් ගත්තද, ඒවා සියල්ලකදීම ප්‍රථම ප්‍රශ්නය ලෙස ඉදිරිපත් කරති.

අවසාන වශයෙන්, සියලු රටවල ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ අතර සමගියක් සහ එකඟතාවයක් ඇති කරවනු පිණිස, හැම තැනකදීම කොමියුනිස්ට්වරු පරිශ්‍රමයක් දරති.

සිය අදහස් හා අරමුණු සැඟවීම කොමියුනිස්ට්වාදීහු පිළිකුල් කරති. දැනට පවතින සාමාජීය තත්ත්වයන් ප්‍රචණ්ඩකාරී ලෙස බිඳ හෙළීමෙන් පමණක් සිය අරමුණු සපුරාලිය හැකි බව ඔව්හු ප්‍රසිද්ධියේම පවසති. කොමියුනිස්ට්වාදී විප්ලවයක් ඉදිරියේ පාලක පංතීන් බියෙන් සැළෙත්වා. ස්වකීය විලංගු හැර නිර්ධනීන්ට නැතිවීමට වෙන කිසිවක් නැත. දිනාගැනීමට ලෝකයක් ඔවුන්ට ඇත්තේය.

## සකල දේශවාසී නිර්ධනයිනි එක්වව්!

# 1872 ජර්මන් සංස්කරණයට ලියූ සංඥාපනය

කම්කරුවන්ගේ ජාත්‍යන්තර සංගමයක් වූ එකල පැවති තත්ත්වයන් යටතේ, සත්තකින්ම රහස් සංවිධානයක් හැටියට පමණක් ක්‍රියා කළ හැකි වූ කොමියුනිස්ට් සංගමය විසින් 1847 නොවැම්බර් මාසයේ ලන්ඩන් නුවර පවත්වන ලද සිය සම්මේලන වාරයේදී, මුද්‍රණය කොට ප්‍රසිද්ධ කිරීම සඳහා විස්තර සහිත පක්ෂයේ න්‍යායික සහ ව්‍යවහාරික වැඩ පිළිවෙලක් ලියා සකස් කරන ලෙස පහත අත්සන් කරන දෙදෙනාට පවරන ලදි. පහත සටහන් 'ප්‍රකාශනය' බිහිවූයේ එසේය. මෙම ප්‍රකාශනයේ මුල් පිටපත මුද්‍රණය කිරීම සඳහා පෙබ්‍රවාරි විප්ලවයට[1] සති කීපයකට පෙර ලන්ඩනයට යවන ලදි. මෙය පළමුවෙන්ම මුද්‍රණය කළේ ජර්මන් බසිනි. ජර්මනියේත්, බ්‍රිතාන්‍යයේත්, ඇමෙරිකාවේත් එය යටත් පිරිසෙයින් දොළොස් වාරයක් පමණ ජර්මන් භාෂාවෙන් යළි යළිත් මුද්‍රණය කොට ප්‍රසිද්ධ කැරිණි. හෙලන් මැක්පාලින් මෙනවිය විසින් පරිවර්තනය කරන ලද මෙම ප්‍රකාශනය 1850 දී ලන්ඩනයේ *Red Republican* සඟරාවේ පළමුවරට ඉංග්‍රීසි බසින් ප්‍රසිද්ධ විණි. එහි විවිධ පරිවර්තන තුනකට නොඅඩු සංඛ්‍යාවක් 1871 දී ඇමෙරිකාවේ පළවිය. 1848 ජූනි කැරැල්ලට[2] ස්වල්ප දවසකට පෙර එහි අනුවාදයක් ප්‍රංශ බසින් පැරිසියෙහි ප්‍රථම වරට පළවිය. මෑතකදී *බැ'දජස්කසිළු* නැමැති නිව්යෝර්ක් සඟරාවේ එය ප්‍රංශ බසින් පළවිය. නව පරිවර්තනයක් දැන් පිළියෙළ වෙමින් පවතී. මෙම 'ප්‍රකාශනය' ජර්මන් බසින් ප්‍රථම වරට පළ කිරීමෙන් ටික කලකට ඉක්බිතිව, එය පෝලන්ත බසින්ද ලන්ඩන් නුවරදී පළ විය. එක්දහස් අටසිය හැට ගණන් වලදී එහි අනුවාදයක් රුසියන් බසින් ජිනීවා නුවර පළ කරන ලදි. මෙම 'ප්‍රකාශනය' ප්‍රථමයෙන් පළවී වැඩිකල් යන්නට පෙර එය ඩෙන්මාක් බසින්ද පරිවර්තනය විය.

ඉකුත් වසර විසිපහ තුළදී තත්ත්වයන් කෙතරම් වෙනස් වුණද, මෙම 'ප්‍රකාශනය' මඟින් වර්ධනය කර ඇති පොදු මූලධර්ම සමස්තයක් ලෙස ගත් විට, ඒවා අන් හැම කලකදී මෙන්ම අදත් සම්පූර්ණයෙන්ම නිරවද්‍ය වේ. එක් හෝ තවත් තැනෙක යම් යම් කරුණු නිවැරදි කිරීමකට භාජනය කළ හැකිය. මෙම 'ප්‍රකාශනයෙන්' සටහන් වෙන පරිදි, මේ මූලධර්ම ව්‍යවහාරික ලෙස ක්‍රියාවට යෙදවීම, ඒ ඒ අවස්ථාවල පවතින ඓතිහාසික තත්ත්වයන් මත සැම කල්හිමත්, සැම තන්හිදීත් රැඳී ඇත්තේය. එබැවින් දෙවන කොටසේ අගට යෝජනා කැරැ තිබෙන විප්ලවීය පියවරයන් අරභයා විශේෂ අවධාරණයක් කර නැත. ඒ කොටස අද ලියන්නේ නම්, නොයෙක් ලෙස එයට වඩා වෙනස්ව එය ලියැවෙනු ඇත. ඉකුත් වසර විසිපහ තුළදී මහා පරිමාණ කර්මාන්තයේ ඉමහත් වර්ධනය නිසාත්, එයට සරිලන සේ කම්කරු පංතියේ පක්ෂ සංවිධානය දියුණු වී තිබෙන නිසාත්, පළමුකොට පෙබ්‍රවාරි විප්ලවයේදී ද, ඉන් ඉක්බිතිව, පුරා දෙමසක් තිස්සේ නිර්ධන පංතිය ප්‍රථම වරට දේශපාලන බලය සිය'තට ගෙන සිටි, පැරිස් කොමියුනයෙහිදී[3] ඊටත් වඩා වැඩියෙන්ද ලබන ලද ව්‍යවහාරික අත්දැකීම් නිසාත් මේ වැඩ පිළිවෙළෙහි සමහර තැන් යල්පැන ගොස් ඇත්තේය. ''කම්කරු පංතියට කලින් සාදා පිළියෙළ කොට තිබූ රාජ්‍ය යන්ත්‍රය එලෙසින්ම සිය අතට ගෙන එය සිය අරමුණු සඳහා පාවිච්චියට ගත නොහැකි'' බව පැරිස් කොමියුනය විසින් විශේෂයෙන්ම ඔප්පු කරන ලදි ('ප්‍රංශයේ රටවැසි යුද්ධය; ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයේ ප්‍රධාන මණ්ඩලයේ ආමන්ත්‍රණය,' ජර්මන් මුද්‍රණය, 19 වැනි පිටුව බලන්න - මෙහි මෙම සංකල්පය වඩාත් පූර්ණ ලෙස දියුණු කර ඇත). තවද, සමාජවාදී සාහිත්‍යයේ වත්මන් කාලය අරභයා කෙරෙන විවේචනය අසම්පූර්ණ බව ස්වයං ප්‍රත්‍යක්ෂ කරුණෙකි. මන්දයත්, එම විවේචනය 1847 දක්වා පමණක් බලපාන බැවිනි. එමෙන්ම

කොමියුනිස්ට්වාදීන් විවිධ විරුද්ධ පක්ෂ කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ සටහන් (ෂඪ කොටස) ප්‍රතිපත්ති මූලක වශයෙන් අදත් නිරවද්‍ය වුවද, ව්‍යවහාරික වශයෙන් යල්පැන ඇත. මන්දයත්, දේශපාලන තත්ත්වය හාත්පසින්ම වෙනස් වී තිබෙන බැවිනි, එමෙන්ම එහි සඳහන් කොට තිබෙන දේශපාලන පක්ෂවලින් බහුතරය ඓතිහාසික සංවර්ධනය විසින් පොළෝ තලයෙන් අතුගා දමා ඇති බැවිනි.

එසේවුවද, 'ප්‍රකාශනය' ඓතිහාසික ලියවිල්ලක් බවට පත්වී ඇති නිසා එය වෙනස් කිරීමට කිසිදු අයිතියක් අපට තවදුරටත් නොමැත. 1847 සිට වත්මන් කාලය දක්වා වූ පරතරය සම්පූර්ණ කරන හැඳින්වීමක් ඇතුළු කිරීමට සමහර විට ඉඩකඩ ලැබෙනු ඇත. මේ මුද්‍රණය අපට කෙතරම් බලාපොරොත්තු නොවූ එකක් වී දයත්, එබන්දක් ලිවීමට අපට කාලයක් නොතිබිණි.

කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්

1872 ජූනි 24, ලන්ඩන්

*'Das Kommunistische Manifest.*
*Neue Ausgabe mit einem Vorwort*
*der Verfasser'. Leipzig, 1872*
නමැති පොත් පිංචක් ලෙස
මුද්‍රණය කැරිණි.

## දෙවැනි රුසියන් සංස්කරණයට ලියන ලද සංඥාපනය

බකූනින් විසින් පරිවර්තනය කරන ලද 'කොමියුනිසිට් පක්ෂයේ ප්‍රකාශනයේ' රුසියන් සංස්කරණය අටසිය හැට ගණන්වල මුල් භාගයේදී[4], ''කෝලකොල්''[5] මුද්‍රණාලය මගින් ප්‍රසිද්ධ කැරිණි. එකල බටහිර ලෝකයාට එම 'ප්‍රකාශනය' පෙනුනේ කුතුහලය අවුස්සන සුලු සාහිත්‍යය කෘතියක් වශයෙන් පමණකි. අද එවැනි ස්ථාවරයක් කොහෙත්ම ඇති විය නොහැකිය.

එකල (1847 දෙසැම්බර්) නිර්ධන පංතික ව්‍යාපාරය පැතිර තුබුණේ කෙතරම් සීමා සහිත ක්ෂේත්‍ර තුළදැයි යන්න, 'ප්‍රකාශනයේ' අවසාන කොටසින්, එනම් 'විවිධ රටවල විරුද්ධ පක්ෂ අරභයා වූ කොමියුනිස්ට්වාදීන්ගේ ස්ථාවරය' පිළිබඳ කොටසින් ඉතා පැහැදිලි ලෙස පෙන්වා දෙයි. නියත ලෙසම මෙහි සටහන් කර නැත්තේද රුසියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය ගැනය. එවකට රුසියාව මුළු මහත් යුරෝපීය ප්‍රතිගාමීත්වයේ අවසාන මහා සංචිතය ලෙස පැවතුනා වූද, යුරෝපයේ අතිරික්ත නිර්ධන පංතික බලවේගයන් සංක්‍රමණය මගින් එක්සත් ජනපදයට උකහා ගත්තා වූද කාලයක් විය. මේ රටවල් දෙකම යුරෝපයට අමු ද්‍රව්‍ය සැපයූ අතර ඒ සමගම යුරෝපයේ කාර්මික නිෂ්පාදිතයන් අලෙවි කිරීම සඳහා වූ වෙළඳ පොළවල්ද විය. එම නිසා මේ දෙරටම එක් හෝ තවත් විධියකින් එවකට පැවති යුරෝපීය සමාජ අනුපිළිවෙල ඔසවාගෙන සිටි කුළුණු බවට පත් වී තිබිණි.

අද කෙතරම් වෙනසක් ඇති වී තිබේද! නියත ලෙසම යුරෝපීයයන්ගේ සංක්‍රමණය නිසා උතුරු ඇමෙරිකාවේ යෝධමය කෘෂිකාර්මික නිෂ්පාදනයක් සඳහා ඉඩකඩ ඇති විය. මේ නිෂ්පාදනයේ තරඟය යුරෝපයේ සහ කුඩා වූ ඉඩම් අයිතියේ පදනම් දෙදරුම් කවයි. මේ හැර බටහිර යුරෝපයේ විශේෂයෙන්ම එංගලන්තයේ මෙතෙක් කල් පැවති, කාර්මික ඒකාධිකාරය නොබෝ කලකින් බිඳ දැමීමට සමත් වන තරම් ශක්තියකින් හා පරිමාණයකින් යුතුව, ස්වකීය දැවැන්ත කාර්මික සම්පත් සූරාගැනීමට එක්සත් ජනපදයට එය හැකියාවක් ලබා දුන්නේය. මේ හේතුන් දෙක ඇමෙරිකාව මත විප්ලවවාදී ලෙස බලපායි. එහි මුළු මහත් දේශපාලනමය ක්‍රමයේ පදනම වන ගොවීන්ගේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් අයිතිය, යෝධ ගොවිපළවල තරඟය ඉදිරියෙහි පියවරෙන් පියවර පරාජය වෙමින් පවතී. ඒ සමගම, කාර්මික ප්‍රදේශවල නිර්ධන පංතික බහු ජනකායක් සහ අත්‍යධික ප්‍රාග්ධන සංකේන්ද්‍රණයක්ද ප්‍රථම වරට වර්ධනය වෙමින් පවතී.

දැන් අපි රුසියාව වෙතට එමු! 1848-1849 විප්ලවීය සමයේදී යුරෝපයේ රාජ කුමාරයින්ට පමණක් නොව, යුරෝපයේ ධනපති පංතියටද, එවකට අවදිවීමට පටන්ගෙන සිටි නිර්ධන පංතියෙන් ගැලවීමේ එකම මාර්ගය සැලසී තුබුණේ රුසියානු මැදහත් වීමෙන් පමණකි. යුරෝපීය ප්‍රතිගාමීත්වයේ නායකයා ලෙස සාර් රජු ප්‍රකාශයට පත් කරන ලදි. අද සාර් රජු ගාත්චින නගරයේ විප්ලවයෙහි යුද සිරකරුවකු බවට පත් වී සිටී[6]. රුසියාව යුරෝපීය විප්ලවීය ව්‍යාපාරයෙහි පුරෝගාමී බල ඇණිය බවට පත් වී සිටී.

නූතන ධනවාදී දේපළ අයිතියෙහි නොවැළැක්විය හැකි සහ ළං වෙමින් පවතින විනාශය ප්‍රකාශයට පත් කිරීම 'කොමියුනිස්ට් ප්‍රකාශනයෙහි' අරමුණ විය. එහෙත් රුසියාවේ සීඝ්‍රයෙන් වර්ධනය වන ධනේශ්වර කොල්ලයටත්, දියුණු වීමට පටන් ගෙන ඇති ධනවාදී ඉඩම් දේපොළ අයිතියටත් මුහුණට මුහුණ ලා ඉඩම්වලින් හරි අඩකටත් වැඩිය ගොවීන්ගේ පොදු අයිතියට යටත් වී ඇති බැව් අපි දකිමු. දැන් පැන නැගී තිබෙන ප්‍රශ්නය මෙයයි: බොහෝ සෙයින් විනාශයට පත්වී ඇති නමුදු ඉඩම් අයිතිය පිළිබඳ ආදි කල්පික පොදු ක්‍රමයක් වන රුසියානු *obshchina** ව ඊට වඩා උසස් ක්‍රමයක් වන කොමියුනිස්ට්වාදී පොදු ක්‍රමයක් දක්වා ඍජු ලෙසම පරිවර්තනය විය හැකිද? නැතහොත් අනිත් අතට, බටහිර ඓතිහාසික සංවර්ධනයෙහි සිදු වූ පරිදි, විසුරුවා හැරීමේ ක්‍රියාදාමයක් තුළින් ප්‍රථමයෙන් එය ගමන් කළ යුතුද?

අද මේ ප්‍රශ්නයට දිය හැකි එකම පිළිතුර මෙසේය: එකකින් අනික සම්පූර්ණ වන ලෙස රුසියන් විප්ලවය බටහිර නිර්ධන පංති විප්ලවයකට පූර්ව නිමිත්ත වන්නේ නම්, ඉඩම් පිළිබඳ අද්‍යතන රුසියානු පොදු අයිතිය, කොමියුනිස්ට්වාදී වර්ධනයක ආරම්භක මොහොත වනු ඇත.

කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස්

1882 ජනවාරි 21 ද ලන්ඩන්

---

**Obshchina* - ගම්බද ප්‍රජා සමූහයී සංස්කාරක

1882 දී ජිනීවාහි පළ කරන ලද කාල්
මාක්ස්ගේ සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ
'කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ'
මුද්‍රණය විය.

## 1883 ජර්මන් සංස්කරණයට ලියූ සංඥාපනය

මේ සංස්කරණයේ සංඥාපනයට මට තනිවම අත්සන් කිරීමට සිදුවීම දෙම්නසට හේතුවකි. අන් කිසිවකුට වඩා යුරෝපයේ හා ඇමෙරිකාවේ මුළු මහත් කම්කරු පංතිය ණය ගැති වී තිබෙන පුද්ගලයා වන මාක්ස් හයිගේට් සුසාන භූමියේ සදහටම සැතපෙයි. ඔහුගේ සොහොන මත දනටමත් ළා තණ පත් වැවී ඇත. ඔහුගේ අභාවයෙන් ඉක්බිතිව, 'ප්‍රකාශනය' පුනරීක්ෂණයට භාජනය කිරීම හෝ අතිරේකයක් එකතු කිරීම හෝ කොහෙත්ම සිතිය නොහැකිය. පහත සටහන් කරුණු යළිත් වරක් ඉතා පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීම ඉතා අවශ්‍ය බව මා අදහස් කරන්නේ එබැවිනි.

'ප්‍රකාශනයේ' මුල සිට අග දක්වා දිවෙන චින්තනය - එනම් ආර්ථික නිෂ්පාදනයත්, අනිවාර්යයෙන්ම ඉන් පැන නගින හැම ඓතිහාසික යුගයකම සමාජ සැලැස්මත්, එම යුගයේ දේශපාලනමය සහ බුද්ධිමය ඉතිහාසයේ පදනම වන්නේ යැයිද, (ඉඩම් පිළිබඳ ආදිකල්පික පොදු අයිතිය දිරාපත් වූ කාලයේ සිටම) මුළු මහත් ඉතිහාසයම පංති අරගල පිළිබඳව සූරාකනු ලබන්නන් සහ සූරාකන්නන් අතර අරගලයක් අරභයා සමාජ සංවර්ධනයේ විවිධ අවධිවල, පෑගීමට භාජනය වන සහ පාගන පංතීන් අතර අරගලයක් පිළිබඳ ඉතිහාසයක් යැයිද, එනමුදු මුළු මහත් සමාජය සූරාකෑමෙන්, පීඩනයෙන් සහ පංති අරගලවලින් සදහටම මුදවා ලන්නේ නැතිනම්, සූරාකෑමට භාජනය වී සිටින සහ පීඩිත පංතියට (නිර්ධන පංතියට), එම පංතිය සූරා කන සහ පාගන පංතියෙන් (ධනපති පංතියෙන්) විමුක්තිය ලැබීමට තවදුරටත් නොහැකි අවධියකට මේ අරගලය එළඹ තිබේ යැයිද යන්න - සම්පූර්ණයෙන්මත්, විශේෂයෙන්මත් මාක්ස්ගේ චින්තනයකි.*

දනටමත් කීප වාරයක් මවිසින් මෙය ප්‍රකාශ කොට ඇති නමුදු, දන් මෙය නියත ලෙසම 'ප්‍රකාශනය' ඉදිරියෙහි සටහන් කිරීම අවශ්‍ය වී ඇත.

ෆ්‍රෙඩ්රික් එංගල්ස්

---

* ඉංග්‍රීසි සංස්කරණයේ සංඥාපනයෙහි මම මෙසේ ලියුවෙමි: ''මගේ අදහස අනුව ඩාවින්ගේ න්‍යායය[7] ජෛව විද්‍යාවට ඉටු කළ සේවයම ඉතිහාසයට ඉටු කිරීමට නියමිත මේ ප්‍රස්තුතය කරා අප දෙදෙනාම 1845 පෙර වසර කීපයක් තිස්සේ සමීප වෙමින් සිටියෙමු. ස්වාධීනව එය වෙත කෙතරම් සමීප වීමට මා සමත් විද යන්න 'එංගලන්තයේ කම්කරු පංතියේ තත්ත්වය' නැමැති මගේ කෘතියෙන් පෙන්නුම් කෙරේ. එහෙත් 1845 වසන්ත සමයේදි බ්‍රසල්ස් නුවරදී මාක්ස් මට යළිත් හමුවූ විට, ඔහු විසින් එය සම්පූර්ණයෙන්ම සකස් කොට තිබිණි. මා මෙහිදී ප්‍රකාශ කළ තරම් මැ සුපැහැදිලි ලෙස එය ඔහු මා ඉදිරියේ තැබීය'' (1890 ජර්මන් සංස්කරණයට එංගල්ස් ලියූ සටහන.

1883 ජූනි 28, ලන්ඩන්
*'Das Kommunistische Manifest',*
*Höttingen-Zürich,* 1883 හි පළ විය.

## 1888 ඉංග්‍රීසි සංස්කරණයට ලියූ සංඥාපනය

ප්‍රථමයෙන්ම විශේෂයෙන්ම ජර්මානු වූද, ඉක්බිතිව ජාත්‍යන්තර වූද, 1848 ට පෙර යුරෝපයේ පැවැති දේශපාලන තත්ත්වයන් යටතේ නොවැළැක්විය හැකි ලෙසම රහස් සමාජයක් වූද, වැඩකරන ජනතාවගේ සංවිධානයක් වූ, කොමියුනිස්ට් සංගමයේ වැඩ පිළිවෙළ වශයෙන් මෙම 'ප්‍රකාශනය' ප්‍රසිද්ධ කරන ලදි. 1847 නොවැම්බර් මාසයේදී ලන්ඩනයේදී පවත්වන ලද මෙම සංගමයේ සමුළුවකදී, මුද්‍රණය කොට පළ කිරිම සඳහා පක්ෂයේ සම්පූර්ණ න්‍යායික සහ ව්‍යවහාරික වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මාක්ස්ට හා එංගල්ස්ට බලය පැවරිණි. එම කෘතිය 1848 ජනවාරි මාසයේදී සම්පූර්ණ කරන ලදි. පෙබ්‍රවාරි 24 ද පටන්ගත් ප්‍රංශ විප්ලවයට[8] සති කීපයකට කලින්, ජර්මන් බසින් ලියන ලද එම මුල් පිටපත මුද්‍රණය පිණිස ලන්ඩනයට යවන ලදි. 1848 ජූනි කැරැල්ලට සති කීපයකට පෙර පැරිසියේ ප්‍රංශ අනුවාදය පළ විය. ප්‍රථම ඉංග්‍රීසි අනුවාදය හෙලන් මැක්පාලින් මෙනවිය විසින් කරන ලදින්, ලන්ඩන්හි ජෝර් ජූලියන් හාර්නේගේ *Red Republican* සඟරාවේ 1850 දී පළ විය. මෙහි මුද්‍රණයන් ඩෙන්මාක් බසින්ද, පෝලන්ත බසින්ද පළ විය.

නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර හටගත් ප්‍රථම මහා සංග්‍රාමය වූ, 1848 ජූනි පැරිස් කැරැල්ල පරාජයවීම නිසා, යුරෝපීය කම්කරු පංති දේශපාලනමය සහ සමාජමය අභිලාෂයන් නැවත වරක් ටික කලකට පසුතලයට ඇද වැටිණි. එතැන් සිට ආධිපත්‍යය සඳහා වූ අරගලය, පෙබ්‍රවාරි විප්ලවයට පෙර පැවති පරිදි, නැවත දේපොළ හිමි පංතියේ විවිධ කොටස්වලට පමණක් සීමා විය. කම්කරු පංතියට සිය දේශපාලනමය ස්වාධීනත්වය සඳහා සටන් කිරීමට සිදුවූ අතර ධනපති පංතියේ රැඩිකල් කොටස තුළ අන්තවාදී තත්ත්වයක් ගැනීමට සිදුවිය. සෑම ස්වාධීන නිර්ධන පංතික ව්‍යාපාරයක්ම තවදුරටත් ජීවමය බවක් දැක්වූ සෑම තැනම අනුකම්පා විරහිත ලෙස පාගනු ලැබීය. එවකට ක්යෝල්න් නගරයේ පිහිටුවා තිබුණු කොමියුනිස්ට් සංගමයේ මධ්‍යම මණ්ඩලය ලුහුබැඳ ගිය ප්‍රැසියන් පොලීසිය එය අල්ලා ගත්තේය. එහි සාමාජිකයින් සිරභාරයට ගෙන, දහඅට මසක් තිස්සේ සිරභාරයේ තබා ගෙනැ සිට, 1852 ඔක්තෝබර් මාසයේදී අධිකරණය ඉදිරියට පමුණුවන ලදි. මේ සුප්‍රසිද්ධ ''කොමියුනිස්ට් ක්යෝල්න් නඩු විභාගය'' ඔක්තෝබර් 4 ද සිට නොවැම්බර් 12 ද දක්වා පැවතිණි. විත්තිකරුවන්ගෙන් හත් දෙනෙක් වසර තුනේ සිට හය දක්වා කාලයකට බලකොටුවක් තුළ සිර අඩස්සියේ තැබීමට අධිකරණය නියම කළේය. නඩු තීන්දුවට ඉක්බිතිව, ඉතිරි වූ සාමාජිකයින් විසින් ක්ෂණිකව සංගමය විසුරුවා හරින ලදි. 'ප්‍රකාශනය' එතැන් සිට මතක නැති වීමේ ඉරණමට පාත්‍රවූවාක් මෙන් පෙනිණි.

පාලක පංතීන්ට නව ප්‍රහාරයක් ගැසීමට තරම් සෑහෙන ශක්තියක් යුරෝපීය කම්කරු පංතිය යළි ලබාගැනීමෙන් ඉක්බිතිව, කම්කරුවන්ගේ ජාත්‍යන්තර සංගමය බිහිවිය. එහෙත් මෙම සංගමය නියත අරමුණක් සඳහා - යුරෝපයේ සහ

ඇමෙරිකාවේ සටන් කරන නිර්ධන පංතිය එක්සත් කිරීම පිණිස පිහිටුවන ලදින්, 'ප්‍රකාශනයේ' සටහන් මූලධර්ම එකවර ප්‍රකාශ කිරීමට එයට නොහැකි විය. ඉංග්‍රීසි වෘත්තීය සමිතිවලටද, ප්‍රංශයේ, බෙල්ජියමේ, ඉතාලියේ සහ ස්පාඤ්ඤයේ ප්රුදෙන්ගේ[9] අනුගාමිකයිනටද, ජර්මනියේ ලසාල්වාදීන්ටද[10]* පිළිගත හැකි තරම් පුළුල් වැඩ පිළිවෙළක් මේ ජාත්‍යන්තරයට තිබිය යුතු වූයේය. මේ සියලු පක්ෂ සතුටු වන සේ වැඩ පිළිවෙළ සැදූ මාක්ස් සංයෝජිත ක්‍රියාකාරීත්වයේ සහ අන්‍යෝන්‍ය සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් නොවැළැක්විය හැකි සේ ඇති විය යුතු කම්කරු පංතියේ බුද්ධිමය සංවර්ධනය මත විශ්වාසය තැබීය. ප්‍රාග්ධනයට විරුද්ධ අරගලයේ සිද්ධීන් හා ජය පරාජයන්, ජයග්‍රහණවලට වඩා පරාජයන් තමන් ප්‍රිය කළ විවිධ නොවරදින සුලු මාධ්‍යයන්හි ඇත්තා වූ අඩු පාඩුව කම්කරුවන්ගේ සිත්වලට අනිවාර්යයෙන්ම කාවද්ද, කම්කරු පංතියේ විමුක්තිය පිළිබඳ නියම තත්ත්වයන් කෙරෙහි වඩාත් පූර්ණ හැඟීමක් කම්කරුවන්ගේ විඥානයට ඇතුළු කළේය. එමෙන්ම මාක්ස් නිවැරදි විය. ජාත්‍යන්තරය 1874 දී විසිර යන විට, කම්කරුවෝ, එය පිහිටවූ කාලය වන 1864 දී සිටියාට වඩා බොහෝසෙයින් වෙනස් මිනිසුන් කොටසක් බවට පත් වී සිටියහ. ප්‍රංශයේ ප්රුදෙන්වාදයත්, ජර්මනියේ ලසාල්වාදයත් අවසන් හුස්ම හෙළමින් පැවතිණි. ගතානුගතික ඉංග්‍රීසි වෘත්තීය සමිති පවා බොහෝ දිගු කලකට පෙර සිටමැ ජාත්‍යන්තරය සමග එයට තිබුණු සම්බන්ධකම් කඩා බිඳ දමා සිටි නමුදු, ඒවායේ සභාපතිවරයාට පසුගිය වසරේදී ස්වොන්සිහි මෙසේ පැවසීමට තරම් ඒවා අනුක්‍රමයෙන් ඉදිරියට යමින් සිටිහ: ''මහාද්වීපික සමාජවාදය දැන් අප බියගැන්වීමට සමත් නොවේ.'' සැබවින්ම 'ප්‍රකාශනයේ' මූලධර්ම ලෝකයේ සියලු රටවල කම්කරුවන් අතර සෑහෙන තරමින් ප්‍රචාරය විය.

ඒ අනුව 'ප්‍රකාශනය' ම යළිත් වරක් පෙරමුණට පිවිසියේය. 1850 න් අනතුරුව ජර්මන් පිටපත කීපවරක්ම ස්විට්සර්ලන්තයෙහිද, එංගලන්තයෙහිද සහ ඇමෙරිකාවෙහිද යළිත් මුද්‍රණය විය. 1872 එය නිව්යෝර්ක්හි ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලදින්, *Woodhull and Claflin's Weekly* සඟරාවේ එය පළ විය. මෙම ඉංග්‍රීසි පරිවර්තනයට අනුකූලව කරන ලද ප්‍රංශ භාෂා පරිවර්තනයක් *Le Socialiste* සඟරාවෙහි පළ විය. ඉන් ඉක්බිතිව, තරමක් විකෘති කරන ලද ඉංග්‍රීසි අනුවාද දෙකක් යටත් පිරිසෙයින් ඇමෙරිකාවේ මුද්‍රණය කැරිණි. මින් එක් පරිවර්තනයක් එංගලන්තයෙහි නැවත වරක් පළ විය. බකුනින් කළ ප්‍රථම රුසියානු පරිවර්තනය 1863 පමණ කාලයේදී ජිනීවාහි ගෙර්ට්සන්ගේ කෝලකොල් මුද්‍රණාලය විසින් පළ කැරිණි. වීරවරියක් බඳු වේරා සසූලිච් විසින් ලියන ලද දෙවැනි රුසියන් පරිවර්තනය 1882 ජිනීවාහිදී ප්‍රසිද්ධ කරන ලදි. නව ඩෙන්මාර්ක් සංස්කරණයක්, 1885 දී කෝපන්හේගන්හි *Socialdemokratisk Bibliothek* සඟරාවේ පළ විය. නව ප්‍රංශ සංස්කරණයක් පැරිසියේ *Le Socialiste* සඟරාවෙහි 1886 දී පළ විය. මෙම ප්‍රංශ පරිවර්තනයට අනුකූලව 1886 දී මැඩ්රිඩ්හි ස්පාඤ්ඤ භාෂාවෙන් සංස්කරණයක් එළි දැක්කේය. වරින් වර පළ වූ ජර්මන් සංස්කරණයන් ගැන සටහන් කිරීමට අවශ්‍යතාවයක් නොමැත. මේවා සංඛ්‍යාවෙන් දෙළහකට අඩු නොවේ. කොන්ස්තන්තිනෝපල්හි මීට මාස කීපයකට පෙර පළ කිරීමට නියමව තිබූ ආර්මේනියානු බසින් ලියන ලද පරිවර්තනයක් මුද්‍රණද්වාරයෙන් බිහි නොවීය. මට

* පෞද්ගලිකව නම් අපට ලසාල් මාක්ස්ගේ පිළිගත් ගෝලයකු වුයේය. මෙම හේතුව නිසා ඔහු 'ප්‍රකාශනයට' පක්ෂව සිටියේය. එහෙත් 1862-1864 කාලයේදී ඔහු රාජ්‍ය ණය මුදල් යටතේ සමූපකාර කම්හල් ඉල්ලා සිටීමට වඩා ඈත නොගියේය.

දැනගත හැකිවූ පරිදි එයට හේතුවුයේ මාක්ස්ගේ නමින් පොත මුද්‍රණය කිරීමට, මුද්‍රණාලය හිමියා බියවූ අතර, 'ප්‍රකාශනය' ස්වකීය කෘතියක් ලෙස හැඳින්වීමට පරිවර්තකයා එකඟ නොවීමය. ඉන් පසු කලෙක වෙනත් භාෂාවලට මෙය පෙරළා ඇති බව මම අසා ඇත්තෙමි. එහෙත් මා ඒවා දැක නැත. මේ අනුව 'ප්‍රකාශනයේ' ඉතිහාසය, සැහෙන තරමින් සමකාලීන කම්කරු පංති ව්‍යාපාරයේ ඉතිහාසය පිළිබිඹු කරයි. වත්මන් අවධියේදී එය නිසැකවම සියලු සමාජවාදී සාහිත්‍ය අතුරෙන් අති පුළුල් ලෙස පැතුරුණු සහ උපරිමය ලෙස ජාත්‍යන්තරවූත්, සයිබීරියාවේ සිට කැලිෆෝනියාව දක්වා වූ කෝටි සංඛ්‍යාත කම්කරුවන් විසින් පිළිගනු ලැබුවා වූත් පොදු වැඩ පිළිවෙළ වන්නේය.

ඒ කෙසේ වුවද, එය අප ලියන විට, එය සමාජවාදී ප්‍රකාශනයක් යැයි කීමට අපට හැකියාවක් නොතිබිණි. 1847 දී සමාජවාදීන් හැටියට එක් පැත්තකින් ප්‍රසිද්ධ වී සිටියේ විවිධ මනෝරාජික ක්‍රමවල අනුගාමිකයින්යඃ එංගලන්තයේ ඕවන්වාදීන්[11] සහ ප්‍රංශයේ පුරියේවාදීන්ය[12]. ඒ අතර මේ දෙගොල්ලන්ගෙන් අනුක්‍රමයෙන් අභාවයට යන හුදු නිකායවාදීන් බිහි විය. අනිත් අතින්, ප්‍රාග්ධනයට සහ ලාභයට කිසිදු හානියක් නොවන සේ අණ්ඩ දැමීම වැනි ප්‍රතිකාර මගින් අනේක විධ සමාජ විපත්වලින් විමුක්තිය ලබා දෙන බවට පොරොන්දු වූ සමාජ කූට වෛද්‍යන්ය. මේ දෙගොල්ලම කම්කරු පංති ව්‍යාපාරයෙන් බාහිර වූ පුද්ගලයින් වූ අතර ''උගත් පංතීන්ගේ'' ආධාරය පැතූ අයද වූහ. යම් කොටසක් විසින් හුදෙක් දේශපාලන විප්ලවයන් කිරීම ප්‍රමාණවත් නොවේයැයි සාක්ෂාත් කැරගෙන, සමාජය හාත්පසින්ම වෙනස්කිරීමකට භාජනය කළ යුතු යැයි කියා සිටියේද, එම කොටස තමන් කොමියුනිස්ට්වාදීන් යැයි කියා ගති. එය අසංස්කෘත, ගොරෝසු සහ සහජාසයානුගත කොමියුනිස්ට්වාද විශේෂයක් විය. ප්‍රධානතම ප්‍රශ්නයට අත තැබූ එය මනෝරාජික කොමියුනිස්ට්වාදය - ප්‍රංශයේ කබේගේ කොමියුනිස්ට්වාදයත්, ජර්මනියේ වෙයිට්ලිංගේ[13] කොමියුනිස්ට්වාදයත් - කම්කරු පංතිය තුළ බිහි කිරීමට තරම් ශක්තිමත් විය. මේ ආකාරයෙන් 1847 දී සමාජවාදය මධ්‍යම පංතික ව්‍යාපාරයක් වූ අතර කොමියුනිස්ට්වාදය කම්කරු පංතික ව්‍යාපාරයක් වූයේය. යටත් පිරිසෙයින් මහාද්වීපය තුළ හෝ සමාජවාදය ''වැදගත්'' දෙයක් වියඃ එහෙත් කොමියුනිස්ට්වාදය ඊට හාත්පසින්ම වෙනස් දෙයක් විය. ''කම්කරු පංතියේ විමුක්තිය සිදුවිය හැක්කේ, කම්කරු පංතිය විසින්මය'' යන මතය අප විසින් මුල සිටම දැරූ නිසා, අප විසින් තෝරා ගත යුත්තේ මේ නම් දෙකෙන් කුමක්ද යන්න ගැන අප තුළ අනුමානයක් නොවීය. එපමණක් නොව, එතැන් සිට එම නම ප්‍රතික්ෂේප කිරීමේ අදහස අපට කිසිසේත්ම ඇති නොවීය.

'ප්‍රකාශනය' අපේ හවුල් නිෂ්පාදනයක් වන නමුදු, එහි න්‍යෂ්ටිය අඩංගු මූලික ප්‍රස්තුතය මාක්ස්ට අයත් යැයි ප්‍රකාශ කිරීම මගේ යුතුකමක්ය යනු මගේ අදහසය. එම ප්‍රස්තුතය මෙසේයඃ හැම ඓතිහාසික යුගයකම දේශපාලනමය සහ බුද්ධිමය වර්ධනයේ ඉතිහාසය ඉදිකර ඇති පදනම වන්නේත්, එම යුගයේ පවතින ආර්ථික නිෂ්පාදන ක්‍රමය සහ හුවමාරුවය, එමෙන්ම ඉන් අවශ්‍යයෙන්ම පැන නගින සමාජයීය සංවිධානයත්ය. එහි විපාක ඵලයක් වශයෙන් (ඉඩම් පිළිබඳ පොදු අයිතියක් භුක්ති විඳි ආදිකල්පික ගෝත්‍ර සමාජය දිරාපත් වීමෙන් ඉක්බිතිව ඇති වූ) මිනිස් සංහතියේ මුළු මහත් ඉතිහාසයම, පංති අරගලයන් පිළිබඳ, සූරාකන්නන් සහ සූරාකනු ලැබීමට භාජනය වූවන් අතරත්, පාලක සහ පාලිත පංතීන් අතරත් වූ සටන් අරගල පිළිබඳ ඉතිහාසයකි.

මේ පන්ති අරගල පිළිබඳ ඉතිහාසයේ ප්‍රගමනය වත්මන් කාලයේදී කෙතරම් දුරට වර්ධනය වී තිබේදයත්, සූරාකනු ලබන හා පීඩිත පංතිය වන නිර්ධන පංතිය සිය විමුක්තිය ළඟා කැර ගන්නා විටම, මුළු මහත් සමාජය සදහටමත්, අවසාන වශයෙනුත්, සියලු ආකාරයේ සූරාකෑම්වලින්, පීඩනයෙන්, පංති ප්‍රභේදයන්ගෙන් සහ පංති සටන් අරගලවලින් මුදවා ලන්නේ නැතිව, නිර්ධන පංතියට සූරාකන සහ පාලක පංතිය වන ධනේශ්වර පංතියේ වියගහෙන් විමුක්තිය ලැබීමට නොහැකි අවධියකට එළැඹ ඇත්තේය.

මෙම චින්තනය මගේ අදහස අනුව, ජෛව විද්‍යාවට ඩාවින්ගේ න්‍යායය[14] ඉටුකළේ යම් සේවයක්ද, එවැනිම සේවයක් ඉතිහාසයට ඉටු කරනු ඇති අතර, අපි දෙදෙනම 1845 ට කලින් වසර කීපයක් තිස්සේ එයට අනුක්‍රමයෙන් සමීපවෙමින් සිටියෙමු. ස්වාධීනව මා එය වෙත සමීප වීමට කොතරම් සමත් වුණේද යන්න 'එංගලන්තයේ කම්කරු පංතියේ තත්ත්වය'* නැමැති මගේ පොතින් ඉතා හොඳට පෙන්නුම් කර ඇත.

එහෙත් 1845 වසන්තයේදී බ්‍රසල්ස්හිදී මා මාක්ස් හමුවූ විට එය ඔහු ලියා නිමකොට තිබිණි, මා මෙහිදී සටහන් කළ පරිදි හැකි තරම් පැහැදිලි ලෙස ඔහු මට එය ඉදිරිපත් කළේය.

1872 ජර්මන් සංස්කරණයට අප විසින් හවුලේ ලියන ලද සංඥාපනයෙන් මම පහත සටහන් කොටස උපුටා දක්වමිः

ඉකුත් වසර විසිපහ තුළදී තත්ත්වයන් කෙතරම් වෙනස් වුණද, මෙම 'ප්‍රකාශනය' මඟින් වර්ධනය කර ඇති පොදු මූලධර්ම සමස්තයක් ලෙස ගත් විට, ඒවා අන් හැම කලකදී මෙන්ම අදත් සම්පූර්ණයෙන්ම නිරවද්‍ය වේ. එක් හෝ තවත් තැනෙක යම් යම් කරුණු නිවැරදි කිරීමකට භාජනය කළ හැකිය. මෙම 'ප්‍රකාශනයෙන්' සටහන් වෙන පරිදි, මේ මූලධර්ම ව්‍යවහාරික ලෙස ක්‍රියාවට යෙදවීම, ඒ ඒ අවස්ථාවල පවතින ඓතිහාසික තත්ත්වයන් මත සෑම කල්හිමත්, සෑම තැන්හිදීත් රැඳී ඇත්තේය. එබැවින් දෙවන කොටසේ අගට යෝජනා කැර තිබෙන විප්ලවීය පියවරයන් අරභයා විශේෂ අවධාරණයක් කර නැත. ඒ කොටස අද ලියන්නේ නම්, නොයෙක් ලෙස එයට වඩා වෙනස්ව එය ලියැවෙනු ඇත. 1848 සිට** මහා පරිමාණ කර්මාන්තයේ ඉමහත් වර්ධනය නිසාත්, එයට සරිලන සේ කම්කරු පංතියේ සංවිධානය දියුණු වීම සහ ව්‍යාප්ත වීම නිසාත්,*** පළමු කොට පෙබ්‍රවාරි විප්ලවයේදී ද, ඉන් ඉක්බිතිව පුරා දෙමසක් තිස්සේ නිර්ධන පංතිය ප්‍රථම වරට වැඩියෙන්ද ලබන ලද ව්‍යවහාරික අත්දැකීම් නිසාත් මේ වැඩ පිළිවෙළෙහි

---

* 'The Condition of the Working Class in England in 1844'. By Frederick Engels. Translated by Florence K. Wishnewetzky. New York, Lovell - London, W. Reeves, 1888. (ෆ්‍රෙඩ්රික් එංගල්ස්. '1844 දී එංගලන්තයේ කම්කරු පංතියේ තත්ත්වය'. ඉංග්‍රීසි අනුවාදය ෆ්ලෝරන්ස් කේ. විෂ්නෙවෙට්ස්කි විසිනි. නිව්යෝර්ක්, ලොවල් - ලන්ඩන්, ඩබ්ලිව්. රීවස්, 1888).

** 1872 ලියන ලද ප්‍රථම මුද්‍රණයෙහි මෙම පාඨය තරමක් වෙනස්ව ලියා ඇත. - සංස්කාරක

*** 1872 ලියන ලද ප්‍රථම මුද්‍රණයෙහි මෙම පාඨය තරමක් වෙනස්ව ලියා ඇත. - සංස්කාරක

සමහර දේශපාලන බලය සිය'තට ගෙන සිටි, පැරිස් කොමියුනයෙහිදී[15] ඊටත් වඩාතැන් යල්පැන ගොස් ඇත්තේය. ''කම්කරු පංතියට කලින් සාද පිළියෙළ කොට තිබූ රාජ්‍ය යන්ත්‍රය එලෙසින්ම සිය අතට ගෙන එය සිය අරමුණු සඳහා පාවිච්චියට ගත නොහැකි'' බව පැරිස් කොමියුනය විසින් විශේෂයෙන්ම ඔප්පු කරන ලදි ('ප්‍රංශයේ රටවැසි යුද්ධය; ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයේ ප්‍රධාන මණ්ඩලයේ ආමන්ත්‍රණය,'. ලන්ඩන්, ට්‍රැලව් ප්‍රකාශකයෝ, 1871, 15 වැනි පිටුව බලන්න. මෙහි එම චින්තනය තවත් දුර දියුණු කර ඇත.) තවද සමාජවාදී සාහිත්‍යයේ වත්මන් කාලය අරභයා කරන විවේචනය අසම්පූර්ණ බව ස්වයං ප්‍රත්‍යක්ෂ කරුණකි. මන්දයත්, එම විවේචනය 1847 දක්වා පමණක් බලපාන බැවිනි. එමෙන්ම කොමියුනිස්ට්වාදීන් විවිධ විරුද්ධ පක්ෂ කෙරෙහි දක්වන ආකල්පය පිළිබඳ සටහන් (ෂඪ කොටස) ප්‍රතිපත්ති මූලක වශයෙන් අදත් නිරවද්‍ය වුවද, ව්‍යවහාරික වශයෙන් යල්පැන ඇත. මන්දයත්, දේශපාලන තත්ත්වය හාත්පසින්ම වෙනස් වී තිබෙන බැවිනි, එමෙන්ම එහි සඳහන් කොට තිබෙන දේශපාලන පක්ෂවලින් බහුතරය ඓතිහාසික සංවර්ධනය විසින් පොළෝ තලයෙන් අතුගා දමා ඇති බැවිනි.

''එසේ වුවද, 'ප්‍රකාශනය' ඓතිහාසික ලියවිල්ලක් බවට පත්වී ඇති නිසා එය වෙනස් කිරීමට කිසිදු අයිතියක් අපට තවදුරටත් නොමැත.''

මෙම වත්මන් අනුවාදය, මාක්ස්ගේ 'ප්‍රාග්ධනය' නැමැති මහා ග්‍රන්ථයෙන් වැඩි කොටසක් අනුවාදය කළ සැමුවෙල් මුවර් මහතා විසින් කැරිණි. අප දෙදෙන එකතුව, පොදුවේ එහි හරි වැරදි බැලීමු. ඓතිහාසික ස්වරූපයක් දරන සවිස්තර සටහන් කීපයක් ම විසින් එකතු කරන ලදි.

<u>ෆ්‍රෙඩ්රික් එංගල්ස්</u>

1888 ජනවාරි 30 ද, ලන්ඩන්

*Karl Marx and Frederick Engels.*
*'Manifesto of the Communist Party'.*
*London, 1888* පොතෙහි පළ විය.

## 1890 ජර්මන් සංස්කරණයට ලියූ සංඥාපනය

ඉහත සටහන් සංඥාපනය ලිවීමෙන් අනතුරුව, 'ප්‍රකාශනයේ' නව සංස්කරණයක් යළිත් වරක් අවශ්‍ය වී ඇත. එලෙසම මෙහි වාර්තාගත කළ යුතු බොහෝ දේවලට 'ප්‍රකාශනය' ගොදුරු වී ඇත.

1882 ජිනීවාහි පළවූ දෙවැනි රුසියන් සංස්කරණය වේරා සසූලිච් විසින් කරන ලද්දකි. මෙයට සංඥාපනය ලියුවේ මාක්ස් හා මවිසිනි. අවාසනාවකට මෙන් මෙහි මුල් ජර්මන් පිටපත් නැතිවෙලාය. එබැවින් මට සිදුවී ඇත්තේ රුසියන් පිටපතින් ආපසු පරිවර්තනය කිරීමටය. එසේ කිරීමෙන් මුල් පෙළ කොහෙත්ම දියුණු නොවේ. එම සංඥාපනය මෙසේය:

බකුනින් විසින් පරිවර්තනය කරන ලද 'කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ' ප්‍රථම රුසියන් සංස්කරණය, එක්දස් අටසිය හැට ගණන් වල මුල් භාගයේදී, කෝලකොල් මුද්‍රණාලය විසින් ප්‍රසිද්ධ කැරිණි. සාහිත්‍යික කුතුහලයක් වශයෙන් පමණක් එවකට 'ප්‍රකාශනයේ' රුසියන් සංස්කරණය බටහිර ජනතාවට පෙනිණි. අද එවැනි මතයක් කොහෙත්ම ඇතිවිය නොහැකිය.

එවකට (1848 ජනවාරි) නිර්ධන පංතික ව්‍යාපාරය පැතිර තුබුණේ කෙතරම් සීමා සහිත ක්ෂේත්‍රයක් තුළද යන්න, 'ප්‍රකාශනයේ' අවසාන කොටසින් එනම් 'විවිධ රටවල විරුද්ධ පක්ෂ කෙරෙහි කොමියුනිස්ට්වාදීන් දක්වන ආකල්පය' නමැති කොටසින් ඉතා හොඳින් පෙන්වා දී ඇත. රුසියාව සහ එක්සත් ජනපදය ගැන විශේෂයෙන්ම මෙහි සටහන් වී නැත. ඒ වූ කලී රුසියාව මුළු මහත් යුරෝපයේ ප්‍රතිගාමීත්වයේ අවසාන මහා සංචිතය ලෙස පැවතුණා වූද, යුරෝපයේ අතිරික්ත නිර්ධන පංතික බලවේග සංක්‍රමණය මගින් එක්සත් ජනපදයට උකහා ගත්තා වූද සමයෙක් විය. මේ රටවල් දෙක යුරෝපයට අමු ද්‍රව්‍ය සැපයූ අතර ඒවා ඒ සමගම යුරෝපයේ කර්මාන්ත භාණ්ඩ අලෙවි කිරීම සඳහාවූ වෙළඳ පොළවල්ද විය. ඒ නිසා එවකට එක් හෝ තවත් ආකාරයකින් එකල පැවති සමාජ ක්‍රමය ඔසවා ගෙන සිටින කුළුණු බවට පත් වී තිබිණි.

අද කෙතරම් වෙනසක් ඇති වී තිබේද? නියත ලෙසම යුරෝපීයයන්ගේ සංක්‍රමණය නිසා උතුරු ඇමෙරිකාවේ යෝධමය කෘෂිකාර්මික නිෂ්පාදනයක් සඳහා ඉඩකඩ ඇතිවිය. මේ නිෂ්පාදනයේ තරඟය යුරෝපයේ ලොකු සහ කුඩා වූ ඉඩම් අයිතියේ පදනම් දෙදරුම් කවයි. මේ හැර බටහිර යුරෝපයේ විශේෂයෙන්ම එංගලන්තයේ මෙතෙක් කල් පැවති, කාර්මික ඒකාධිකාරය නොබෝ කලකින් බිඳ හෙළීමට සමත් වන තරම්, ශක්තියකින් හා පරිමාණයකින් යුතුව, ස්වකීය දැවැන්ත කාර්මික සම්පත් සූරාගැනීමට, එක්සත් ජනපදයට එය හැකියාවක් ලබා දුන්නේය. මෙම හේතූන් දෙක ඇමෙරිකාව මත විප්ලවවාදී ලෙස බලපායි. ඇමෙරිකාවේ මුළු මහත් දේශපාලන ක්‍රමයේ පදනම වන ස්වකීය ශ්‍රමය යොදවන ගොවීන්ගේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් අයිතිය, යෝධ ගොවිපළවල තරඟය ඉදිරියෙහි පරාජය වෙමින් පවතී. ඒ සමගම කාර්මික ප්‍රදේශවල නිර්ධන පංතික බහු ජනකායක් සහ අත්‍යධික ප්‍රාග්ධන සංකේන්ද්‍රණයක්ද ප්‍රථම වරට වර්ධනය වෙමින් පවතී.

දැන් අපි රුසියාව වෙතට එමු! 1848-1849 විප්ලවීය සමයේදී යුරෝපයේ රාජ කුමාරයින්ට පමණක් නොව, යුරෝපයේ ධනපති පංතියටද, එවකට අවදි වීමට පටන් ගෙන සිටි නිර්ධන පංතියෙන් ගැළවීමේ එකම මාර්ගය සැළසී තුබුණේ රුසියානු මැදහත් වීමෙන් පමණකි. යුරෝපීය ප්‍රතිගාමීත්වයේ නායකයා ලෙස සාර් රජු ප්‍රකාශයට පත් කරන ලදි. අද සාර් රජු ගාත්චිනා නගරයේ විප්ලවයෙහි යුද සිරකරුවකු බවට පත් වී සිටී. රුසියාව යුරෝපීය විප්ලවයෙහි පුරෝගාමී බල ඇණිය බවට පත් වී සිටී.

නූතන ධනවාදී දේපොළ අයිතියෙහි නොවැළැක්විය හැකි සහ ළං වෙමින් පවතින විනාශය ප්‍රකාශයට පත් කිරීම 'කොමියුනිස්ට් ප්‍රකාශනයෙහි' අරමුණ විය. එහෙත් රුසියාවේ සීඝ්‍රයෙන් වර්ධනය වන ධනේශ්වර කොල්ලයටත්, දියුණු වීමට පටන් ගෙන තිබෙන ධනවාදී ඉඩම් දේපොළ අයිතියටත් මුහුණට මුහුණ ලා ඉඩම්වලින් හරි අඩකටත් වැඩිය ගොවීන්ගේ පොදු අයිතියට යටත් වී ඇති සැටි අපි දකිමු.

දැන් පැන නැගී තිබෙන ප්‍රශ්නය මෙයයඃ බොහෝ සෙයින් විනාශයට පත්වී ඇති නමුදු ඉඩම් අයිතිය පිළිබඳ ආදිකල්පික පොදු ක්‍රමයක් වන රුසියානු ඔබ්ෂීනවට (*obshchina*), ඊට වඩා උසස් ක්‍රමයක් වන කොමියුනිස්ට්වාදී පොදු ක්‍රමයක් දක්වා සෘජු ලෙසම පරිවර්තනය විය හැකිද? නැතහොත් අනිත් අතට, බටහිර ඓතිහාසික සංවර්ධනයෙහි සිදුවූ පරිදි, විසුරුවා හැරීමේ සන්තතියක් තුළින් ප්‍රථමයෙන් ගමන් කළ යුතුද?

අද මේ ප්‍රශ්නයට දිය හැකි එකම පිළිතුර මෙසේයඃ එකකින් අනික සම්පූර්ණ වන සේ රුසියන් විප්ලවය බටහිර නිර්ධන පංති විප්ලවයට පූර්ව නිමිත්ත වන්නේ නම්, ඉඩම් පිළිබඳ සමකාලීන රුසියානු පොදු අයිතිය කොමියුනිස්ට්වාදී වර්ධනයක ආරම්භක මොහොත වනු ඇත.

<u>කාල් මාක්ස් හා ෆෙඩ්රික් එංගල්ස්</u>

1882 ජනවාරි 21 ද ලන්ඩන්.

මේ කාලයේදීම *Manifest Komunistyczny* නමින් පොලන්ත බසින් අනුවාදයක් ජිනීවාහි පළ විය.

ඉන් අනතුරුව 1885 කෝපන්හේගන් නගරයේදී *Socialdemokratisk Bibliothek* නැමැති සඟරාවෙහි ඩෙන්මාක් බසින් පළ විය. කනගාටුවකට මෙන් එය අසම්පූර්ණය, පරිවර්තනය කිරීමට අසීරු යැයි සැලකෙන ඇතැම් කොටස් පරිවර්තකයා විසින් අතහැර දමා තිබේ. මේ හැර සමහර තැන්වල නොසැලකිලිවත්කම කියාපාන සලකුණුද දක්නට ඇත. පරිවර්තකයා මීට වඩා වැඩි සැලකිලිමත් ආකල්පයක් පරිවර්තනය කෙරෙහි දැක්වූයේ නම්, සෑහෙන තරම් උසස් ප්‍රතිඵල ඔහුට ලබා ගැනීමට ඉඩ තිබුණු බව පෙනී යන නිසා මෙම අප්‍රසන්නතාවය වඩාත් කැපී පෙනෙයි.

1886 දී අලුත් අනුවාදයක් ප්‍රංශ භාෂාවෙන් *Le Socialiste* නැමැති පැරිස් පුවත් පතෙහි පළ විය. එය මෙතෙක් පළවුණු ඉතාම හොඳ අනුවාදය වන්නේය.

එම ප්‍රංශ අනුවාදයට අනුකූලව ස්පාඤ්ඤ අනුවාදයක් ප්‍රථමයෙන්ම මැඩ්රිඩ්හි *ඍක ීදජස්කසිඒ* පුවත්පතෙහිද, අනතුරුව වෙනම පොත් පිංචක් හැටියට *Manifiesto del Partido Comunista por Carlos Marx y F. Engels, Madrid, Administración de El Socialista, Hernan Cortés 8.* හි පළ විය.

කුතුහලය අවුස්සන දෙයක් ලෙස තවත් එක් කරුණක් මතක් කරමි. 1887 දී කොන්සතන්තිනෝපල්හි ග්‍රන්ථ ප්‍රකාශකයෙකුට 'ප්‍රකාශනයේ' ආර්මේනියානු අනුවාදයක මුල් පිටපත භාර දෙන ලදි. එහෙත් මාක්ස්ගේ නම සටහන් වී ඇති දෙයක් පළ කිරීමට තරම් නිර්භයත්වයක් මේ ගුණවත් මිනිසාට නොතිබිණි. අනුවාදකයාගේ නම කතුවරයාගේ නම ලෙස යෙදීමට ඔහු යෝජනා කළේය. එහෙත්

අනුවාදකයා ඊට එකඟ නොවීය.

ඇමෙරිකාවේදී අනුවාදය කරන ලද අඩු වැඩි වශයෙන් සාවද්‍ය සංස්කරණ කීපයක් එක පිට එක එංගලන්තයේ පළ විය. අන්තිමේදී 1888 දී තථ්‍ය අනුවාදයක් බිහි විය. මේ අනුවාදය කළේ මගේ මිත්‍ර සැමුවෙල් මුවර් විසිනි. එය මුද්‍රණයට යැවීමට පෙර අපි දෙදෙනා එකතුව යළිත් එය කියවා බැලීමු. එහි නම මෙලෙස සටහන් කළෙමු: '' 'කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය' කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසිනි. අධිකාරය ලත් ඉංග්‍රීසි අනුවාදය. සංස්කරණය සහ විස්තර සටහන් සැපයීම ප්‍රෙඩ්රික් එංගල්ස් විසිනි. 1888 ලන්ඩන්. විලියම් රීව්ස්, 185 ප්ලීට් මාවත, ඊස්ටන් සෙන්ට්‍රල්.'' මවිසින් එම සංස්කරණයට සපයන ලද සටහන්වලින් සමහරක් මෙම සංස්කරණයට මම ඇතුළු කළෙමි.

'ප්‍රකාශනයට' ස්වකීය ඉතිහාසයක් ඇත. (ප්‍රථම සංඥාපනයෙහි සඳහන් කර ඇති අනුවාද මගින් ඔප්පුකොට ඇති පරිදි) මෙම 'ප්‍රකාශනය' මුලින් බිහිවූ වේලේ, එවකට සංඛ්‍යාව අතින් කොහෙත්ම විශාල නොවූ විද්‍යාත්මක සමාජවාදයේ පුරෝගාමී බලඇණිය විසින් උද්යෝගයකින් එය පිළිගන්නා ලදි. 1848 දී ජූනි මාසයේ[16] පැරිස් කම්කරුවන්ගේ පරාජයත් සමග ආරම්භ වූ ප්‍රතිගාමීත්වය එය ඉක්මනින්ම පසු තලයට ඇද දැම්මේය. අවසානයේ දී 1852 නොවැම්බර් මාසයේදී ක්යෝල්න්හි කොමියුනිස්ට්වාදීන් වැරදිකරුවන් ලෙස තීරණය කළ නඩු තීන්දුව[17] විසින් ''නීත්‍යානුකූල ලෙස'' නීති විරෝධී කැරිණි. පෙබ්‍රවාරි විප්ලවයත් සමග ආරම්භ වූ කම්කරු ව්‍යාපාරය සමාජ කරලියෙන් අතුරුදහන් වීමත් සමගම 'ප්‍රකාශනය' ද පසුතලයට ඇද වැටිණි. පාලක පංතියේ බලයට විරුද්ධව නව ප්‍රහාරයක් ආරම්භ කිරීමට තරම් සෑහෙන ශක්තියක් යුරෝපීය කම්කරු පංතිය ඒකරාශී කර ගත් ඉක්බිතිව, ජාත්‍යන්තර කම්කරුවන්ගේ සංගමය (සහෝදරත්වය) බිහි විය. යුරෝපයේ සහ ඇමෙරිකාවේ මුළු මහත් සටන්කාමී කම්කරු පංතිය එකම මහා සේනාවක් තුළට ඒකරාශී කිරීම එහි අරමුණ විය. එබැවින් 'ප්‍රකාශනයේ' සටහන් මූලධර්ම වලින් <u>ඍජු ලෙස ආරම්භ කිරීමට</u> එයට නොහැකි විය. ඉංග්‍රීසි වෘත්තීය සමිතිද, ප්‍රංශ, බෙල්ජියම්, ඉතාලි සහ ස්පාඤ්ඤ ප්රුදෙන්වාදීන්ද, ජර්මන් ලසාල්වාදීන්ද* ඉදිරියේ දොර නොවැසෙන අන්දමේ වැඩ පිළිවෙළක් එයට තිබිය යුතු විය. එවැනි වැඩ පිළිවෙළක් - එනම් ජාත්‍යන්තරයේ ව්‍යවස්ථාවලට යොදනලද ප්‍රාරම්භ වාක්‍යය[18] - බකුනින් සහ අරාජිකවාදීන් විසින් පවා පිළිගත්තාවූ වැඩ පිළිවෙළක් මාක්ස් විසින් ඉතා දක්ෂ ලෙස සකස් කැරිණි. 'ප්‍රකාශනයෙහි' සටහන් මූලධර්මවල අවසාන ජයග්‍රහණ අරභයා මාක්ස් කම්කරු පංතියේ බුද්ධිමය සංවර්ධනය කෙරෙහි සර්ව ප්‍රකාරයෙන්ම විශ්වාසය තැබීය. එක්සත් ක්‍රියාකාරීත්වයේ සහ සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් මෙම සංවර්ධනය අනිවාර්ය ඵලයක් විය යුතුය. ධනපති ක්‍රමයට විරුද්ධව කරන අරගලයේ සිද්ධීන් හා ජය පරාජයන් සහිත පෙරළිද, ජය ට වඩා පරාජයන් ද, සර්වරෝග නාශකය ලෙස ගණන් ගනිමින්,

---

* තමා මාක්ස්ගේ ''ගෝලයකු'' බව නිතර අපට කියා සිටි ලසාල් සත්තකින්ම 'ප්‍රකාශනය' මත පිහිටා සිටියේය. එහෙත් රජයේ ණය මුදල්වල ආධාරය ඇතිව, නිපදවන්නන්ගේ සමූපකාරය සඳහා ඔහු ඉදිරිපත් කළ ඉල්ලීම්වලින් පිටතට නොගියාවූද, කම්කරු පංතිය, රජයේ ආධාර අනුමත කරන්නන් සහ ස්වයං ආධාර අනුමත කරන්නන් හැටියට කොටස් දෙකකට බෙදුවාවූද ඔහුගේ අනුගාමිකයින් පිළිබඳ වූ තත්ත්වය මෙයට වඩා වෙනස් විය.

මෙතෙක් යොදන ලද විසඳුම්වල ඇති අඩු පාඩුව ප්‍රදර්ශනය නොකර සිටීමට නොහැකි වූ අතර, කම්කරුවන්ගේ විමුක්තිය සඳහා සැබෑ තත්ත්වයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම පිණිස එය ඔවුන්ගේ සිත් වඩාත් සුබග්‍රාහී කළේය. මාක්ස් නිවැරදි විය. 1874 දී කම්කරු පංතිය, ජාත්‍යන්තරය විසුරුවා හරින විට, එය පිහිටුවා ලූ අවධියේ, එනම් 1864 තත්ත්වයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වී සිටියේය. ලතින් රටවල ප්‍රැදෙන්වාදයද, ජර්මනියේ විශේෂත්වයක් වන ලසාල්වාදය ද අවසන් හුස්ම හෙළමින් තිබිණි. එවකට අධි ගතානුගතික ඉංග්‍රීසි වෘත්තීය සමිති පවා ''මහාද්වීපික සමාජවාදය අප තවදුරටත් බිය කරන්නේ නැතැ'' යි 1887 දී ස්වෝන්සි සමුළුවේදී ඔවුන්ගේ සභාපතිවරයා ලවා ප්‍රකාශ කරවීමට තරම් අනුක්‍රමයෙන් සමීප වෙමින් පැවතිණි. එහෙත් 1887 මහාද්වීපික සමාජවාදය 'ප්‍රකාශනය' මගින් දන්වා සිටි න්‍යායයම බව අඩු වැඩි වශයෙන් හැඳින්විය හැකි තත්ත්වයෙක පැවතිණි. එබැවින් එක්තරා ප්‍රමාණයකට 1848 සිට සමකාලීන කම්කරු පංති ඉතිහාසය, 'ප්‍රකාශනයේ' ඉතිහාසය මගින් පිළිබිඹු කෙරේ. දනට නිසැක ලෙසම, සමාජවාදී සියලු සාහිත්‍ය අතුරෙන් ඉතා පුළුල් ලෙස පැතිර ගිය, උපරිමය වශයෙන් ජාත්‍යන්තර කෘතිය වන 'ප්‍රකාශනය' සයිබීරියාවේ සිට කැලිෆෝනියාව දක්වා වූ සියලු රටවැසි දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ගේ පොදු වැඩ පිළිවෙළද වන්නේය.

එසේවුවද, එය බිහිවූ මොහොතේ දී, එය සමාජවාදී ප්‍රකාශනයක් ලෙස හැඳින්වීමට අපට නොහැකි විය. 1847 දී සමාජවාදීන් යන නාමය යටතේ දෙවර්ගයක ජනතාව හඳුන්වනු ලැබූහ. එක් පැත්තකින් විවිධ මනෝරාජිකවාදවල අනුගාමිකයෝද, විශේෂයෙන් එංගලන්තයේ ඕවන්වාදියෝද, ප්‍රංශයේ ෆුරියේවාදියෝද වූහ. එපමණක් නොව, එවකට මේ දෙවර්ගයම හුදු නිකායයන් බවට පත්වී, ක්‍රමයෙන් අභාවයට යන තත්ත්වයකට වැටී තිබිණි. අනික් පැත්තෙන්, ප්‍රාග්ධනයට සහ ලාභයට යම්තමින් හෝ අලාභ නොකර, අනේක විධ සියලු දෙස් දුරලන ප්‍රතිකාර ක්‍රම සහ අනේක විධ පැලැස්තර ඇලවීම් මගින් සමාජයේ දූෂණයන් අහෝසිකැරැ දැමීමට ඉදිරිපත් වූ සමාජ ගොඩ වෙද්දුද වූහ. මේ දෙවර්ගයටම අයත් පුද්ගලයෝ කම්කරු පංති ව්‍යාපාරයට පිටතින් සිටි අතර ඔවුහු වඩාත් වැඩියෙන් ''උගත්'' පංතීන්ගේ ආධාරය පැතූ අය වූහ. මෙයට විරුද්ධව, පිරිසිදු දේශපාලන විප්ලව පමණක් ප්‍රමාණවත් නොවන බව වටහාගෙන, සමාජය හාත්පසින්ම යළි ඉදි කළ යුතුහයි ඉල්ලා සිටි කම්කරුවන්ගේ කොටස තමන් කොමියුනිස්ට්වාදීන් ලෙස හඳුන්වා ගත්හ. එය අසංස්කෘත, ගොරෝසු සහජාසයානුගත කොමියුනිස්ට්වාදයක් වූයේය. එහෙත් මනෝරාජික කොමියුනිස්ට්වාදී පද්ධති දෙකක් බිහිකිරීමට එය සමත් විය: එකක් ප්‍රංශයේ කබේගේ ''ඉකේරියානු'' කොමියුනිස්ට්වාදයයි, අනික ජර්මනියේ වෙයිට්ලිංගේ කොමියුනිස්ට්වාදයයි[19]. 1847 දී සමාජවාදය ධනපති ව්‍යාපාරයක් වූ අතර කොමියුනිස්ට්වාදය කම්කරු පංතික ව්‍යාපාරයක් විය. සමාජවාදය යටත් පිරිසෙයින් මහාද්වීපය තුළ සම්පූර්ණයෙන්ම නම්බුකාර දෙයක් වූ අතර කොමියුනිස්ට්වාදය ඊට හාත්පසින්ම වෙනස් විය. ''කම්කරු පංතියේ විමුක්තිය ළඟා කරලිය හැක්කේ කම්කරු පංතියටමය'' යන මතය අප විසින් මුල සිට ස්ථිර ලෙසම දරූ නිසා, මේ නම් දෙකින් අප විසින් තෝරාගත යුත්තේ කුමක්ද යන්න ගැන අප තුළ මොහොතකට හෝ සැකයෙක් නොවීය. එපමණක් නොව, අතැන් සිට එම නාමය ප්‍රතික්ෂේප කිරීමේ අදහසත් අප තුළ කිසිදිනෙක නොවිණි.

''සකල දේශවාසී නිර්ධනයිනි, එක්වව් !'' එහෙත් මීට වසර හතළිස් දෙකකට පෙර, නිර්ධන පංතිය තම ඉල්ලීම් ඉදිරිපත් කරමින් ඉදිරියට ආ ප්‍රථම පැරිස් විප්ලවයට ආසන්න සමයේදී, අප මේ වචන ලෝකයටම ප්‍රකාශ කළ විට, ඊට

ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත් වූ කටහඬවල්වල සංඛ්‍යාව අල්ප විය. එනමුදු 1864 සැප්තැම්බර් 28 ද බටහිර යුරෝපීය රටවල බහුතරයේ නිර්ධනීහු කීර්තිමත් අනුස්මරණයකින් යුත් ජාත්‍යන්තර කම්කරුවන්ගේ සංගමය (සහෝදරත්වය) තුළ එක්සත් වූහ. මෙම ජාත්‍යන්තරයේ ආයු ප්‍රමාණය නව වසරකට පමණක් සීමා වූ බව නම් සැබවි. එහෙත් එමගින් බිහිකළ ලෝකයේ සියලු රටවල නිර්ධන පංතිකයින්ගේ සදකාලික සන්ධානය අදත් ජීවමානව පවතින බවත්, එය මින් පෙර නොවූ විරූ තරම් ශක්තිමත්ව පවතින බවත්, අද දවස විසින් අන් හැමටම වඩා හොඳින් ඔප්පු කර පෙන්වයි. මන්දයත්, අද මවිසින් මේ වැකි ලියන මොහොතේදී, 1866 දී ජාත්‍යන්තර ජිනීවා මහා සමුළුව විසින්ද, දෙවනුව 1889 කම්කරුවන්ගේ පැරිස් මහා සමුළුව විසින්ද ප්‍රකාශනයට පත්කළ පරිදි, යුරෝපීය සහ ඇමෙරිකන් නිර්ධන පංතිය සම්මත පැය අටේ වැඩ දිනය නීත්‍යානුකූල ප්‍රඥප්තියක් මගින් ස්ථාපිත කරවා ගැනීම නැමති ක්ෂණික අරමුණ සඳහා ප්‍රථම වරට <u>එකම</u> යුද්ධ හමුදාවක් ලෙස පෙළ ගැසී, <u>එකම</u> ධජයක් යටතේ ඒකරාශී වී, සිය සටන් බල මුළු පිරික්සා බලමින් සිටින බැවිනි. මේ අද්‍යතන දර්ශනය, සියලු රටවල නිර්ධනීන් අද සැබවින්ම එක්සත් වී සිටින බව ලෝකයේ සියලු රටවල ධනපතීන්ට හා ඉඩම් හිමියන්ට පෙන්වා දෙයි.

අහෝ, මෙය සියැසින් දැක බලා ගැනීමට මාක්ස් දැන් මා ළඟ සිටියා නම්!

<u>ෆ්‍රෙඩ්රික් එංගල්ස්</u>

1890 මැයි 1 ද, ලන්ඩන්

*'Das Kommunistische Manifest'.*
*London. 1890* නමැති පොතෙහි
පළ විය

## 1892 පෝලන්ත සංස්කරණයට ලියූ සංඥාපනය

පෝලන්ත බසින් පළකරන 'කොමියුනිස්ට් ප්‍රකාශනයේ' අලුත් සංස්කරණය පළ කිරිමට අවශ්‍ය වීමේ සාධකය නිගමන කීපයක්ම කිරීමට ඉඩ සලසයි.

හැමටම පළමුව, 'ප්‍රකාශනය' මෑත කලෙක සිට යුරෝපා මහාද්වීපයේ මහා පරිමාණ කර්මාන්ත සංවර්ධනයේ සූචිය බවට පත්වැ තිබීම වැදගත් දෙයකි. යම් කිසි රටක මහා පරිමාණ කර්මාන්ත ව්‍යාප්ත වන ප්‍රමාණයට ධන හිමි පංතීන් සම්බන්ධයෙන් කම්කරු පංතිය හැටියට තම තත්ත්වය කුමක්ද යන්න පැහැදිලි කැර ගැනීමේ අභිලාෂය එම රටේ කම්කරුවන් අතර වර්ධනය වෙයි. ඔවුන් අතර සමාජවාදය පැතිරයාම පුළුල් වෙයි. 'ප්‍රකාශනයේ' ඉල්ලුමද වැඩි වෙයි. මේ නයින්, එක් හෝ තවත් රටක භාෂාවලින් බෙදා හරිනු ලබන 'ප්‍රකාශන' පිටපත් සංඛ්‍යාව අනුව ඒ, ඒ රටේ කම්කරු පංතික ව්‍යාපාරයේ තත්ත්වය පමණක් නොව, එහි මහා පරිමාණ කර්මාන්ත ශාලාවල සංවර්ධන මට්ටමද සෑහෙන තරම් නිවැරදි ලෙස මැනීමටද හැකි වන්නේය.

එබැවින්, නව පෝලන්ත සංස්කරණය පෝලන්තයේ නිශ්චිත කර්මාන්ත

ප්‍රගමනයකට සාක්ෂි දරයි. මීට දස වසරකට පෙර පැරණි සංස්කරණය පළකිරීමෙන් ඉක්බිතිව, එවැනි ප්‍රගමනයක් සැබවින්ම සිදුවී තිබෙන බවට සැකයක් නම් නැත්තේය. සාර් රාජධානියට අයත් පෝලන්තය, සම්මේලන පෝලන්තය[20] රුසියානු අධිරාජ්‍යයේ විශාල කර්මාන්තමය ප්‍රදේශයක් බවට පත් වී තිබේ. මහා පරිමාණයේ රුසියානු කර්මාන්තය හැම තැනම විසිර ඇත - පින්ලන්ත මුහුදු බොක්ක වටා කොටසක් ද, රට මැද (මොස්කව් සහ ව්ලදිමීර්) කොටසක්ද, තෙවැනි කොටස කළු මුහුද සහ අසොව් මුහුදු බඩද, ඉතිරි කොටස තැනින් තැනද විසිර ඇති අතර, පෝලන්ත කර්මාන්තය සාපේක්ෂ ලෙස විශාල නොවන පෙදෙසක සංකේන්ද්‍රණ ගතවීමක් මගින් ඇතිවන වාසි සහ අවාසි භුක්ති විඳී. මෙහි ඇති වාසිය තරඟකාරී රුසියානු කම්හල් හිමියන් පිළිගත්තේ, පෝලන්ත වැසියන් රුසියන් ජාතිකයින් බවට පරිවර්තනය කිරීමට ඔවුන් තුළ ඉමහත් උණුසුම් අභිලාෂයක් තිබියදීත්, පෝලන්තයට විරුද්ධව ආරක්ෂක තීරු බදු ඉල්ලා සිටීමෙනි. පෝලන්ත කම්හල් හිමියන්ට සහ රුසියන් ආණ්ඩුවට මෙහි ඇති අවාසිය දැනුණේ, පෝලන්ත කම්කරුවන් අතර සමාජවාදී අදහස් සීඝ්‍ර ලෙස පැතිරයාමෙනි, 'ප්‍රකාශනය' ඔවුන් විසින් වැඩි වැඩියෙන් ඉල්ලා සිටීමෙනි.

එහෙත් රුසියාව පසු බා යමින් පෝලන්ත කර්මාන්තය ලබාගත් සීඝ්‍ර වර්ධනය පෝලන්ත ජනතාව තුළ පවතින නොසිඳෙන සුලු ජීව බලයක් පිළිබඳ නව ඔප්පු කිරීමක් සහ පෝලන්තයේ අනාගතයේදී සිදුවිය හැකි ජාතික පුනර්ජීවනයේ නව සහතිකයකි. ස්වාධීන සහ ශක්තිමත් පෝලන්තයක පුනර්ජීවනය පෝලන්ත ජාතිකයින්ගේ පමණක් නොව, අප සියල්ලන්ගේ අවධානය යොමු විය යුතු දෙයකි. යුරෝපීය ජාතීන්ගේ අවංක සහයෝගතාවයක් ඇති විය හැක්කේ, ඒ හැම ජාතියක්ම තම ගෘහය තුළ ස්වෛරී ස්වාමීත්වය ලැබුවහොත් පමණකි. නිර්ධන පංතික ධජය යටතේ නිර්ධන පංතික සටන්කාමීන්ට, ධනපතීන්ගේ කටයුත්ත පමණක් ඉටු කිරීමට සිදු වූ 1848 විප්ලවය ඉතාලියේ, ජර්මනියේ සහ හංගේරියාවේද නිදහස ලබාගත්තේ එහි කැමැත්ත ක්‍රියාවට පෙරලූ බලකාරයින් වූ ලුවී බොනපාට් සහ බිස්මාක්[21] මගිනි. එනමුදු 1792 සිට මේ රටවල් තුනේ සමස්ත සේවයට වඩා වැඩි සේවයක් විප්ලවයට ඉටු කළ පෝලන්තය තමාට වඩා දස ගුණයකින් අධික රුසියන් බලයකට යටත් වූ මොහොතේදී හුදකලා වීමකට පත්විය.[22] පෝලන්තයේ ස්වාධීනත්වය රැකගැනීමට වත්, එය නැවත දිනාගැනීමට වත් වංශාධිපතියෝ අසමත් වූහ. මෙම ස්වාධීනත්වය වත්මන් කාලයේදී පෝලන්ත ධනපති පංතියට නම් යටත් පිරිසෙයින් වැදගැම්මකට නැති දෙයකි. ඒ කෙසේ වුවද, යුරෝපීය ජාතීන්ගේ සංගතික සහයෝගතාවයක් සඳහා එය අත්‍යාවශ්‍ය දෙයකි. එය දිනාගත හැක්කේ යෞවන පෝලන්ත නිර්ධන පංතියට පමණකි, ඔවුන්ගේ හස්තයෙහි එය සම්පූර්ණයෙන්ම සුරක්ෂිත වන්නේය. මන්දයත්, පෝලන්තයේ ස්වාධීනත්වය පෝලන්තයේ කම්කරුවන්ට මෙන්ම, යුරෝපයේ සෙසු රටවල කම්කරුවන්ටද එය අවශ්‍ය බැවින.

ෆ්‍රෙඩ්රික් එංගල්ස්

1892 පෙබ්‍රවාරි 10 ද, ලන්ඩන්.

*K. Marx i F. Engels. 'Manifest Kommukistyczny'. London, 1892*
නමැති පොතෙහි පළ විය

# 1893 ඉතාලි සංස්කරණයට ලියන ලද සංඥාපනය

ඉතාලි පාඨකයා වෙත

'කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය' පළවීමත්, එය 1848 මාර්තු 18 ද මිලාන්හි සහ බර්ලින්හි ඇති වූ විප්ලව, රටවල් දෙකක අවිගත් කැරළි සමග සම්පාත වීමත්, එකට සිදු වුණායි කෙනෙකුට කිව හැකිය. යුරෝපා මහද්වීපයේ මැද පිහිටි එක් ජාතියකුත්, මධ්‍යධරණී මුහුද මැද පිහිටි තවත් ජාතියකුත් මේ කාලයට පෙර බෙදීම්වලට ගොදුරු වීමෙන් සහ අභ්‍යන්තරික භේදවලින් දුර්වලවී සිටි සහ එහි විපාකයක් වශයෙන් විදේශීය ආධිපත්‍යය යටතට පත්වී සිටියහ. ඉතාලිය ඔස්ත්‍රියානු අධිරාජයාට යටත් වී තිබුණු අතර ජර්මනිය මුළු මහත් රුසියාවේම අධිපතියාවූ සාර්ගේ - වඩාත් වක්‍රවූද විපාක අතින් ඊට වඩා නොඅඩු වියගහට යටවී සිටියේය. 1848 මාර්තු 18 ද ඇතිවූ ප්‍රතිඵලය වූයේ ඉතාලිය සහ ජර්මනිය මෙමෙ අපකීර්තියෙන් නිදහස් වීමය. 1848 සිට 1871 දක්වා මේ මහා ජාතීන් දෙක යළි ප්‍රකෘතිමත් කරනු ලැබ, එක් හෝ තවත් විදිහකින් ස්වාධීනත්වයක් ඒවාට ලැබිණි නම්, කාල් මාක්ස් පෙන්වා දුන් පරිදි, එය සිදුවූයේ, 1848 විප්ලවය පාගා දැමූ පුද්ගලයින්ම ඔවුන්ගේ කැමැත්තට විරුද්ධව, එම විප්ලවයේ අරමුණු ක්‍රියාවට යෙදූ විධායකයින් වූ බැවිනි.

එම විප්ලවය හැම තැනම කරන ලද්දේ කම්කරු පංතිය විසිනි. මහා මාර්ගවල කපොලු ඉදි කළේත්, තම ලේ පූජා කළේත් කම්කරු පංතිය විසිනි. එහෙත් පැරිසියේ කම්කරුවෝ පමණක්, ආණ්ඩුව පෙරළා දැමීමෙන්, ධනේශ්වර ආණ්ඩු ක්‍රමය පෙරළා දැමීමේ ඉතා ස්ථිර අභිප්‍රාය ඇතිව සිටියහ. එසේවුවද, තම පංතියත්, ධනපති පංතියත් අතර නොවැළැක්විය හැකි ප්‍රතිවිරෝධීතාවයන් තිබෙන බව ඔවුන් සවිඥානකව දැන සිටියද, සමාජ ප්‍රතිසාධනයකට හැකියාවන් ලබා දීමට තරම් වන, රටේ ආර්ථික සංවර්ධනයක් හෝ, එයට සරිලන මට්ටමක් දක්වා ප්‍රංශ කම්කරුවන්ගේ අධ්‍යාත්මික වර්ධනයක් වෙත එළැඹීමක් හෝ නොතිබිණි. මේ හේතුව නිසා අවසානයේදී, විප්ලවයේ සියලු ඵල නෙලාගනු ලැබුවේ ප්‍රංශ ධනපති පංතිය විසිනි. අනිත් රටවල - ඉතාලියේ, ජර්මනියේ සහ ඔස්ත්‍රියාවේ - මූලාරම්භයේ සිට ධනපතීන්ට බලයට පැමිණීම සඳහා ආධාර දීමකට පමණක් කම්කරු පංතිය සීමා විය. එහෙත් කිසිම රටක ජාතික ස්වාධීනත්වයෙන් තොරව, ධනපති පාලනයක් ඇති කළ නොහැකිය. එමනිසා 1848 විප්ලවය, මේ කාලය වන විටත් ඒකීයතාවය සහ ස්වාධීනත්වය නැතිව සිටි ජාතීන් තුනට - ඉතාලියට, ජර්මනියට සහ හංගේරියාවට - එය ලබා දිය යුතු වූයේය. මීළඟ වාරය පෝලන්තයටය.

එනයින්, 1848 විප්ලවය සමාජවාදී නොවූයේ නම්, එය එබඳු විප්ලවයක් සඳහා හෙළි පෙහෙළි කොට බිම සකස් කළේය. ඉකුත් වසර හතළිස් පහක් තිස්සේ ධනේශ්වර ක්‍රමයට අයත් සියලු රටවල්වල මහා පරිමාණ කර්මාන්තයේ වේගවත් සංවර්ධනයට පින් සිදුවන්නට, හැම තැනම සංඛ්‍යාව අතින් විශාල වූත්, සංකේන්ද්‍රණ ගතවූත්, ශක්තිමත් වූත් නිර්ධන පංතියක් බිහිවිය. ඒ අනුව 'ප්‍රකාශනයේ' සටහන් බසින් කියතොත්, ධනපති පංතිය ස්වකීය මිනී වළ හාරන පංතියක් බිහි කොට ඇත. එක්, එක් ජාතියක ස්වෛරීභාවය සහ ඒකීයතාවය ස්ථාපිත නොකර, නිර්ධන පංතියේ ජාත්‍යන්තර සංගමයක් හෝ, පොදු අරමුණු ඉටුකරලීම සඳහා එම ජාතීන්ගේ සාමකාමී සහ සවිඥානක සහයෝගතාවයක් හෝ බිහිකරලීමට නොපුළුවන. 1848 ට පෙර පැවති දේශපාලන තත්ත්වයන් යටතේ ඉතාලියානු, හංගේරියානු, ජර්මන්, පෝලන්ත, රුසියානු කම්කරුවන්ගේ යම්කිසි පොදු ජාත්‍යන්තර ක්‍රියාකාරීත්වයක්

සිතින් මවා ගැනීමට පවා තැත් කළ හැකිද?

මෙහි තේරුම, 1848 සංග්‍රාමයන් අපතේ නොගිය බවය. එමෙන්ම එම විප්ලවීය කාලාවධිය සහ අපත් අතර ඇති වසර හතළිස් පහක පරතරයද අපතේ නොගිය බවය. ඒවායේ මල් ඵල හටගනු ඇත. මේ 'ප්‍රකාශනයේ' මුල් පිටපත පළවීම ජාත්‍යන්තර විප්ලවයට ශුභාසිංශනයක් වූවාක් මෙන්ම, ඉතාලි බසට පෙරළා ඇති මෙම සංස්කරණය පළවීමද ඉතාලි නිර්ධන පංතියේ ජයග්‍රහණයට සුබ නිමිත්තක් වේවායි මගේ එකම පැතුම වන්නේය.

'ප්‍රකාශනය' අතීතයේදී ධනේශ්වර පංතිය විසින් සපුරාලන ලද විප්ලවවාදී කාර්ය කොටස සාධාරණ ලෙස අගය කරයි. ප්‍රථම ධනවාදී ජාතිය ඉතාලිය විය. රදළවාදි මධ්‍යම යුගයේ අවසානයත්, සමකාලීන ධනපති යුගයේ ආරම්භයත් එක් මහා පුද්ගලයෙකුගෙන් සටහන් වී ඇත. හේ ඉතාලි ජාතික දන්තේය, මධ්‍යකාලීන යුගයේ අවසාන කිවියාත්, නව යුගයේ ප්‍රථම කිවියාත් ඔහුය. දැන්, 1300 දී මෙන්ම නව ඓතිහාසික යුගයක් එළැඹෙමින් පවතී. එම නව නිර්ධන පංතික යුගයේ උපත සනිටුහන් කරන නව දන්තේ කෙනෙකු ඉතාලිය අපට ප්‍රදානය කරන්නේද?

<u>ෆෙඩ්රික් එංගල්ස්</u>

1893 පෙබ්‍රවාරි 1 ද, ලන්ඩන්

*Karlo Marx e Federico Engels.*
*'I1 Manifesto del Partito Comunista'.*
*Milano, 1893* නමැති පොතෙහි පළ විය.

## සංස්කාරකගේ සටහන්

1 1848 ප්‍රංශයේ පෙබරවාරි විප්ලවය ගැනය.

2 1848 ජූනි 23-26 දිනවල පැරිස් නිර්ධන පංතියේ කැරැල්ල ගැනය. 1848-1849 යුරෝපයේ විප්ලවයේ උච්ච අවධිය ජූනි මස කැරැල්ලය.

3 1871 පැරිස් කොමියුනය - පැරිසියේ නිර්ධන පංතික විප්ලවය විසින් පිහිටුවන ලද කම්කරු පංතියේ විප්ලවවාදී ආණ්ඩුවය. නිර්ධන පංතික ආඥාදායකත්වය නිර්මාණය කිරීම අරභයා ඉතිහාසයේ ප්‍රථම අත්දැකීමය. පැරිස් කොමියුනය 1871 මාර්තු 18 සිට මැයි 28 ද දක්වා පැවතිණි.

4 එම සංස්කරණය 1869 දී මුද්‍රණය කරන ලදි. 1888 ඉංග්‍රීසි සංස්කරණයට එංගල්ස් විසින් ලියන ලද සංඥාපනයේ රුසියානු බසින් 'කොමියුනිස්ට් ප්‍රකාශනය' නිකුත් කළ දිනය නිවැරදි ලෙස සටහන් වී නැත.

5 කෝලකොල් - 1857 සිට 1867 දක්වා රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් වන එයි. අයි. ගෙර්ට්සන් සහ එන්. පී. ඔගර්යෝව් විසින් නිකුත් කළ රුසියන් විප්ලවවාදී-ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පතය. 1865 ට පෙර ලන්ඩනයේදීද ඉන් ඉක්බිතිව ජිනීවාහිදීද මෙය නිකුත් විය.

6 1881 මාර්තු 1 ද රුසියාවේ අධිරාජයා වූ දෙවැනි අලෙක්සාන්දර් නරෝද්නය වෝල්‍යා සංවිධානයේ සාමාජිකයින් විසින් මරා දැමූ පසු සිහසුනට පත් තෙවැනි අලෙක්සාන්දර් රජු ගත්චිනහි (පීටර්ස්බුර්ගය අසල පිහිටි සාර්ගේ නිල මාලිගය) සැඟවී සිටියේය. විප්ලවවාදී ව්‍යාපාරයට බිය වූ මොහු නරෝද්නය වෝල්‍යා (නරෝද්නික්වාදී ත්‍රස්තවාදීන්ගේ රහස් දේශපාලන සංවිධානයකි) ත්‍රස්තවාදීන් යළිත් පහර දෙනු ඇතැයි තැතිගෙන සිටියේය.

7 ඩාවින්, චාර්ස්-රොබට් (1809-1882) ඉංග්‍රීසි ජාතික විද්‍යාඥයෙකි. ද්‍රව්‍යවාදී ජෛව විද්‍යාවේ නිර්මාතෘවරයාය. ඩාවින් ප්‍රථම වරට ප්‍රකෘති විද්‍යාත්මක ද්‍රව්‍ය අති විශාල සංඛ්‍යාවක් මත ජීවමාන ස්වභාව ධර්මයේ සංවිධානය පිළිබඳ න්‍යායයක් ඉදිරිපත් කොට, ඓන්ද්‍රීයමය ලෝකයේ වර්ධනය අඩු සංකීර්ණ ආකාරයන්ගේ සිට වඩාත් වැඩි සංකීර්ණ ආකාර දක්වා වර්ධනය වූ සැටි ඔප්පු කළේය, අළුත් ජීව වස්තූන් ඇති වීම සහ පැරණි ජීව වස්තූන් අතුරුදහන් වීම ස්වාභාවික ඓතිහාසික සංවර්ධනයේ ප්‍රතිඵලයක් බව පෙන්වා දුන්නේය.

ඩාවින්ගේ න්‍යායයේ ප්‍රධාන සංකල්පය ස්වාභාවික හා කෘතිම වරණයන්ගේ මාර්ගයෙන් විශේෂයන්ගේ ප්‍රභවය ඇති වීමේ උගැන්වීමය. ඉන්ද්‍රියයනට විචල්‍යතාවය සහ ආවේණිකය ස්වාභාවික බව ඩාවින් පෙන්වා දුන්නේය. යම්කිසි සතකුට හෝ පැලෑටියකට හෝ සිය පැවැත්ම සඳහා කරන අරගලයේදී හිත කර ලක්ෂණ පැලපදියම් වී එය සතුන්ගේ හා පැලෑටිවල නව වර්ගයන්ගේ ඇති වීමට ඉඩ සලසන බව ඩාවින් පෙන්වා දුන්නේය. 'විශේෂයන්ගේ ප්‍රභවය' (1859) නැමැති කෘතියෙන් ඔහු සිය විද්‍යාත්මක උගැන්වීමේ ප්‍රධාන මූලධර්ම සහ ඔප්පු කිරීම් ඉදිරිපත් කළේය.

8 අංක 1 සටහන බලන්න.

9 ප්රුදෙන් පියේර් ජොසෙප් (1809-1865) - ප්‍රංශ දේශපාලන සාහිත්‍ය ධරයෙකි, ආර්ථික වේදියෙකි, සමාජ විද්‍යා වේදියෙකි. සුළු ධනවාදී දෘෂ්ටියේ ආචාර්ය වරයෙකි. අරාජිකවාදයේ එක් කර්තෘවරයෙකි. ප්රුදෙන්ගේ සිහිනය වූයේ සුළු ධනවාදී අයිතිය චිරාගත කිරීමය. ඔහු සුළු ධනවාදී ස්ථාවරයකින් මහා ධනවාදී අයිතිය විවේචනයට හසු කළේය. කම්කරුවන්ට තමන්ගේම නිෂ්පාදන මාධ්‍යයන් අයත් කර ගෙන කර්මාන්ත ශිල්පීන් වීමට උදව් දෙන ''නිළිණ ණය දෙන'' ''මහජන බැංකුවක්'' පිහිටුවාලීමට ඔහු යෝජනා කළේය. හුවමාරු කිරීමේ විශේෂ බැංකු පිහිටුවීමේ ප්රුදෙන්ගේ සිහිනයද එවැනිම ප්‍රතිගාමී ස්වරූපයක් දැරීය. මේ බැංකු මගින් ශිල්පීන් නිපදවන භාණ්ඩවලට ''සාධාරණ'' මිලක් ලබාදීම ඔහුගේ අදහස විය. එහෙත් ඒ අතරම ධනවාදි නිෂ්පාදන මාධ්‍යයන් සහ උපකරණවල අයිතිය වෙනස් කිරීමට හේ අකැමැති විය. නිර්ධන පංතියේ ඓතිහාසික ක්‍රියා කලාපය වටහා ගැනීමට අපොහොසත් වූ ප්රුදෙන් පංති සටනද, නිර්ධන පංතික විප්ලවය සහ නිර්ධන පංතික ආඥාදායකත්වයද පිළි නොගත්තේය. අරාජිකවාදී ස්ථාවරයෙක සිට රජයක අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කළේය. පළමුවැනි ජාත්‍යන්තරයට තම අදහස් පැටවීමට පරිශ්‍රම දැරූ ප්රුදෙන්වාදීන්ට විරුද්ධව මාක්ස් හා එංගල්ස් දැඩි සටනක් ගෙන ගියහ. කාල් මාක්ස් විසින් ලියන ලද 'දර්ශනවාදයේ දුගීබව' නැමැති කෘතිය මගින් ඔහු ප්රුදෙන්වාදය දරුණුතම විවේචනයට හසු කළේය.

10 ලසාල්වාදියෝ - සුළු ධනවාදී සමාජවාදී ජර්මන් ජාතික ලසාල් ගේ අනුගාමිකයින් මෙනමින් හැඳින්විණි. 1863 දී ලයිප්සිග් නගරයේ කම්කරු සංගම්වල සමුළුවේදී ලසාල් සමස්ත ජර්මන් කම්කරු සංගමයේ සාමාජිකයෙකු බවට පත්විය. එම සංගමයේ පළමුවැනි සභාපති වරයාද ඔහුය. එහි වැඩ පිළිවෙල, මූලික උපක්‍රම ඔහු සූත්‍ර ගත කළේය. කම්කරු පංතියේ බහුජන දේශපාලන පක්ෂයක් නිර්මාණය කිරීම ජර්මනියේ කම්කරු පංති ව්‍යාපාරයේ ඉදිරි පියවරයක් බවට සැක නැත. එසේ වුවද මූලික දේශපාලන හා න්‍යායික ප්‍රශ්නවලදී ලසාල් සහ ඔහුගේ ගෝලයෝ අවස්ථාවාදී ස්ථාවරයක් ගත්හ. සාමාජයික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ප්රුසියානු ආණ්ඩුව පාවිච්චි කළ හැකි යැයි සිතූ ලසාල්වාදියෝ බිස්මාක්ගේ ආණ්ඩුව සමග සාකච්ඡා කිරීමට උත්සාහ දැරූහ. මාක්ස් සහ එංගල්ස් ලසාල්වාදීන්ගේ න්‍යායය, උපක්‍රම සහ සංවිධානාත්මක මූලධර්ම ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ අවස්ථාවාදී ප්‍රවණතාවයක් බව පෙන්වා දෙමින් එය විවේචනය කළහ.

11 ඕවන්වාදියෝ - ඉංග්‍රීසි ජාතික මනෝරාජික සමාජවාදී රොබට් ඕවන් (1771-1858) ගේ ගෝලයෝ සහ අනුගාමිකයෝය.

ඕවන් ඉතා දැඩි ලෙස ධනවාදී සමාජය විවේචනය කළේය. එහෙත් ධනවාදී ප්‍රතිවිරෝධීතාවයේ සැබෑ මුල් හෙළි කිරීමට හේ අපොහොසත් විය. සාමාජයික අසාධාරණත්වය රඳා පවතින්නේ අධ්‍යාපනය පොදු ලෙස පැතිරයාමේ නොසෑහෙනතාවය උඩ මිස ධනවාදී නිෂ්පාදන ක්‍රමය තුළ නොවන බව ඕවන් විශ්වාස කළේය. එබැවින් ධනවාදය වෙනස් කිරීම පිණිස අධ්‍යාපනය පැතිරවීම සහ සාමාජයික ප්‍රතිසංස්කරණ සහිත පුළුල් වැඩ පිළිවෙලක් ඔහු ඉදිරිපත් කළේය. සමාජයේ අනාගතය ඔහු දුටුවේ කුඩා ස්වයං පාලක කොමියුන්වල

ස්වාධීන සන්ධීය සංවිධානයක් ලෙසය. එහෙත් ඕවන් සිය අදහස් ප්‍රායෝගික ලෙස ක්‍රියාවට යෙදවීමේදී අසාර්ථක විය.

12 පුරියේවාදියෝ - ප්‍රංශ මනෝරාජික සමාජවාදී ෂාර්ල් පුරියේගේ (1772-1837) අනුගාමිකයෝ සහ ගෝලයෝය.

පුරියේ ධනපති ක්‍රමය ඉතා දැඩි ලෙසත්, ගැඹුරු ලෙසත් විවේචනයට හසු කළේය. අනාගත ''සංගතික'' මිනිස් සමාජය පිළිබඳව ලස්සන චිත්‍රයක් මැවීය. එය මිනිස් හැඟීම් සවිඥානක ලෙස දැනගැනීමේ පදනම මත වූවකි. ඔහු ප්‍රචණ්ඩකාරී විප්ලවයට විරුද්ධ විය. අනාගත සමාජවාදී සමාජය කරා පරිවර්තනය වීම ආදර්ශවත් ශ්‍රමකාමී සංගම්වල සාමකාමී ප්‍රචාරයේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවිය හැකි බව ඔහු පිළිගත්තේය. මෙම ශ්‍රමකාමී සංගම්වල ස්වේච්ඡානුගත සහ සිත් ඇද ගන්නා ශ්‍රමය මිනිසාගේ අවශ්‍යතාවයක් වනු ඇතැයි ඔහු විශ්වාස කළේය. එසේවුවද පුරියේ පෞද්ගලික දේපොළ අයිතිය ප්‍රතික්ෂේප නොකළේය. ඔහුගේ මේ ශ්‍රම සංගම්වල පොහොසත්තු මෙන්ම දුප්පත්තුද වූහ.

13 කබේ, එතියෙන් (1788-1856) - ප්‍රංශ ජාතිකයෙකි. සුළු ධනවාදී ස්ථාවරයක පිහිටා ආණ්ඩු ක්‍රම හා දේශපාලනය ගැන පොත් ලියූවෙකි. මනෝරාජික කොමියුනිස්ට්වාදයේ සම්භාවනීය නියෝජිතයෙකි. සමාජයේ සාමකාමී පුනඃස්ථාපනයක් ඇති කිරීම මගින් ධනවාදයේ අඩුපාඩුකම් මකාලීමට පුළුවනැයි ඔහු විශ්වාස කළේය. 1840 දී ඔහු විසින් ලියන ලද ඉකාරියානු සංචාරය නැමති ග්‍රන්ථයෙන් ඔහු සිය අදහස් ඉදිරිපත් කළේය. ඔහු එය ප්‍රායෝගික ලෙස ක්‍රියාවේ යෙදවීම පිණිස ඇමෙරිකාවේ කොමියුනිස්ට්වාදී ජනපද පිහිටුවීමට උත්සාහ කළේය. එහෙත් ඔහුගේ එම ප්‍රයත්නය සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය.

වයිට්ලින්ග්, විල්හෙල්ම් (1808-1871) ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. මනෝරාජික ''සර්ව සමාන'' කොමියුනිස්ට්වාදී න්‍යායයේ එක් ආදි කතු වරයෙකි. එංගල්ස් පවසන පරිදි වයිට්ලින්ග් ජර්මනියේ නිර්ධන පංතික ප්‍රථම ස්වාධීන න්‍යායික ව්‍යාපාරයේ සක්‍රීය ක්‍රියා කොටසක් ඉටු කළේය.

14 ඩාවින් පිළිබඳ සටහන (අංක 7) බලන්න.

15 කොමියුනය පිළිබඳ අංක 3 සටහන බලන්න.

16 අංක 2 සටහන බලන්න.

17 1852 ඔක්තෝබර් 4 සිට නොවැම්බර් 12 ද දක්වා ප්‍රැසියානු ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද ප්‍රකෝපකාරී නඩු විභාගය ගැනය. ජාත්‍යන්තර කොමියුනිස්ට්වාදී සංගමයේ සාමාජිකයින් එකොළොස් දෙනෙකුට විරුද්ධව නඩු පවරන ලදී. රජය පාවාදීමට කුමන්ත්‍රණය කළැයි යන චෝදනාව යටතේ ආරම්භ වූ මෙම නඩු විභාගය ව්‍යාජ ලියවිලි සහ බොරු සාක්ෂි අනුව හත්දෙනෙකු වරදකරුවන් බවට තීරණය කොට ඔවුනට අවුරුදු තුනේ සිට හය

දක්වා කාලයක සිර දඬුවම් නියම කරන ලදි.

18 කාල් මාක්ස්ගේ 'ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වයේ පොදු ව්‍යවස්ථා මාලාව' බලන්න.

19 වයිට්ලින්ග් පිළිබඳ සටහන බලන්න (අංක 13).

20 සම්මේලන පෝලන්තය 1814-1815 වියානා සම්මේලනයේදී ගන්නා ලද තීරණය අනුව, පෝලන්ත රාජධානියෙන් රුසියාවට අයත් වුණු කොටස මෙනමින් හැඳින්විණි.

21 තුන්වැනි නැපෝලියන් (ලුවී බොනපාට්) (1808-1873) පළමුවැනි නැපෝලියන්ගේ බෑණාය. දෙවැනි ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපති ධූරයට (1848-1851) පත් විය. අනතුරුව ප්‍රංශයේ අධිරාජයා (1852-1870) හැටියට පත් විය.

බිස්මාක් ඔටෝ එඩ්වර්ඩ් ලියෝපෝල්ඩ් (1815-1898) ප්‍රුසියාවේ සහ ජර්මනියේ රාජ්‍ය නායකයෙකි, රාජ්‍ය තන්ත්‍රිකයෙකි. දේශීය හා විදේශීය ප්‍රතිපත්තිවලදී විශාල ඉඩම් හිමි යුන්කරයින්ගේ සහ ධනපතීන්ගේ අයිතිය ආරක්ෂා කළේය. ප්‍රුසියාවේ නායකත්වය යටතේ ජර්මනිය ඒකරාශී කිරීමට ඔහු රටවල් අල්ලා ගැනීම සහ සාර්ථක ලෙස රාජ්‍ය තන්ත්‍රික උපායයන් යෙදවීය. 1871 සිට 1890 දක්වා ජර්මන් අධිරාජ්‍යයේ චාන්සලර් ධූරය ඉසිලීය.

''1848 විප්ලවයට, ඊට පෙර හටගත් විප්ලවයට මෙන්ම, විශේෂ ගමන් සගයෝ සහ උරුමක්කාරයෝ සිටියහ. කාල් මාක්ස් නිතර කීමට ආශා කළ පරිදි විප්ලවය මර්දනය කළ අයම එහි බලකාරයෝ බවට පත්වූහ. ඒකීය, ස්වාධීන ඉතාලියක් බිහිකිරීමට ලුවී නැපෝලියන්ට සිදු විය. බිස්මාක්ට ජර්මනියේ එක්තරා විදිහක පෙරළියක් කිරීමට සිදු වූ අතර හංගේරියාවට නිදහස දීමට සිදු විය...'' ('එංගලන්තයේ කම්කරු පංතියේ තත්ත්ව' නැමැති පොතේ ඉංග්‍රීසි සංස්කරණයට එංගල්ස් ලියූ සංඥාපනයෙනි).

22 රුසියන් අධිරාජ්‍යයට අයත් පෝලන්ත පෙදෙස්වල 1863 ජනවාරි මාසයේදී ආරම්භ වූ ජාතික විමුක්ති කැරැල්ල ගැනයි. මේ කැරැල්ල සාර්ගේ හමුදාව විසින් ඉතා කෲර ලෙස පාගා දැමිණි. කැරැල්ලේ සමහර නායකයින් බටහිර රටවල් මැදිහත්වීම බලා පොරොත්තු වුණද, ඒ රටවල් රාජ්‍ය තන්ත්‍රික ප්‍රකාශනයට පමණක් සීමා විය.

23 නවවැනි පියුස් පාප්වහන්සේ - 1864 දී පාප් ධූරයට පත් විය. එවකට ඔහු ''ලිබරල්වාදියකු'' සේ ගණන් ගැනිණි. එහෙත් 1848 ට පෙර යුරෝපයේ පොලිස් කාරයාගේ ක්‍රියා කලාපය ඉටු කළ රුසියන් පළමුවැනි නිකොලායි සාර් රජු මෙන්ම පාප්තුමාද සමාජවාදයේ පරම හතුරකු වූයේය. මුළු මහත් යුරෝපා ප්‍රතිගාමීත්වයේ පිළිගත් නායකයා වූ මැටර්නිහ් ප්‍රංශ ඉතිහාසඥයකු සහ ඇමතිවරයකු වන ගීසෝ සමග මේ කාලයේදී විශේෂයෙන් කිට්ටු සබඳකම් ඇති කර ගත්තේය. ගීසෝ මහා මූල්‍ය ධනපතීන්ගේ හා කර්මාන්ත ධනපතීන්ගේ දෘෂ්ටිමය ආචාර්යවරයකු වූ අතර නිර්ධන පංතියේ පරම

සතුරෙක් විය. ප්‍රුසියන් රජයේ ඉල්ලීමක් පරිදි ගීසෝ, කාල් මාක්ස්ව පැරිසියෙන් නෙරපා දැමීය. ජර්මනියේ පමණක් නොව, ප්‍රංශයේ හා බෙල්ජියමේද, එපමණක් නොව, ස්විට්සර්ලන්තයේ පවා කොමියුනිස්ට්වාදී ප්‍රචාරක කටයුතුවලට පොලීසිය හැම මාධ්‍යයක්ම පාවිච්චි කරමින් හිරිහැර කළේය.

24 <u>හාක්ස්ත්හවුසන්, අව්ගුස්ට්</u> (1792-1866) ප්‍රුසියානු සිටුවරයෙකි. රුසියන් කෘෂක ක්‍රමය සහ රුසියන් ගොවීන්ගේ ජීවන තතු පිරික්සා බැලීම සඳහා රුසියාවට පැමිණීමට පළමුවැනි නිකොලායි සාර් රජුගෙන් අවසර ලබා ගත්තේය (1843-1844). රුසියාවේ කෘෂක සම්බන්ධකම්වලදී සාමූහික ක්‍රමයක නටබුන් පිළිබඳ පොත් කීපයක් ලියුවේය.

25 <u>මව්රර්, ගියෝර්ග්-ලුඩ්විග්</u> (1790-1872) - ජර්මන් ඉතිහාසඥයෙකි. පැරණි සහ මධ්‍යකාලීන ජර්මනියේ සමාජ ක්‍රමය පිරික්සුමට ලක් කළේය. ජර්මනියේ මධ්‍යකාලීන සමූහය - මාර්ක් - අධ්‍යයනය කිරීමේදී විශාල සේවයක් කළේය.

26 <u>මෝගන්, ලුවිස් හෙන්රි</u> (1818-1881) ඇමෙරිකන් ජාතික මානව විද්‍යාඥයෙකි, පුරාවිද්‍යා වේදියෙකි, ඉතිහාසඥයෙකි. ඇමෙරිකන් ඉන්දියන්වරුන්ගේ සමාජ ක්‍රමය සහ ජීවන තතු හැදෑරීමේදී ලබාගත් මානව විද්‍යාත්මක විශාල කරුණු රාශියක් පදනම් කර ගනිමින් ආදිකල්පික සමාජයේ මූලික රූපය වූ වංශයේ සංවර්ධනය පිළිබඳව උගැන්වීමක් සනාථ කළේය. පංති සහිත සමාජයට පෙර පැවති සමාජයේ ඉතිහාසය යුගවලට බෙදීමට තැත්කළේද මෝගන් විසිනි. මෝගන්ගේ කෘති මාක්ස් හා එංගල්ස් උසස් ලෙස නිගණනය කළහ. මාක්ස් ඔහුගේ පොත වන 'ආදිකාලීන සමාජය'ට (1877) විස්තර සටහන් ලියුවේය. එංගල්ස් 'පවුල, පෞද්ගලික දේපොළ සහ රජය ඇති වූ සැටි' නැමැති තම කෘතියෙහි මෝගන් එකතු කළ සත්‍ය කරුණු උපුටා දක්වයි.

27 <u>ජාතීන්ගේ මහා දේශාටනය</u> - ක්‍රි. ව. 4-5 සියවසරවලදී නැගෙනහිර යුරෝපයේ සිට බටහිරට ගිය වංශ හා ජාතීන් ගැනය.

<u>කුරුස යුද්ධ</u> 11-13 ශතවර්ෂවලදී බටහිර යුරෝපීය රදළයින්ගේ හා සෙනෙවිවරුන්ගේ නැගෙනහිර යුද්ධ-යටත් විජිත ප්‍රයාණ ගැනය. ජෙරුසලමේ සහ අනිකුත් රටවල සුද්ධ වූ ස්ථාන බේරාගැනීමේ ආගමික ධජය යටතේ මුස්ලිම් රටවලට විරුද්ධව මේ යුද්ධ කරන ලදි.

28 පසු කළෙක මාක්ස් හා එංගල්ස් විසින් ලියන ලද කෘතිවල ''ශ්‍රම වටිනාකම'', ''ශ්‍රම මිල'' නැමැති සංකල්පයන් වෙනුවට මාක්ස් විසින් ඉදිරිපත් කළ ''කම්කරු ශ්‍රම ශක්තියේ වටිනාකම'' සහ ''කම්කරු ශ්‍රම ශක්තියේ මිල'' නැමැති පද යෙදවිණි.

29 <u>පාදඩ නිර්ධන පංතිය (ලුම්පන් ප්‍රොලිටේරියට්)</u> - *Lumpen* නැමැති ජර්මන් වචනයේ තේරුම වැරැහැලි යනුයි. මින් හඳුන්වන්නේ විපංතික නිර්ධන කොටස් වන රස්තියාදු කාරයින්, හිඟන්නන්, හොරුන් ආදීන්ය.

සංවිධානාත්මක දේශපාලන සටන් කිරීමේ නොහැකියාවද, සදාචාරාත්මක

අස්ථිරතාවයද, සාහසික ක්‍රියාවලට ඇති ආශාවද නිසා මේ කොටස් ධනපති පංතිය විසින් කුලියට ගෙන ඔවුන් ලවා වැඩ නැවැත්වීම් කඩා කප්පල් කරවීම්, මැරවරකම් කරවීම් ආදිය කරවනු ලැබේ.

30 චන්දය දීමේ අයිතිය ප්‍රතිසංස්කරණය කිරීම ගැනය. එම පනත මහජනතාවගේ බලකිරීම පිට එංගලන්තයේ පාර්ලිමේන්තුව විසින් 1831 දී පිළිගන්නා ලදි. 1832 දී සාමි මන්ත්‍රී මණ්ඩලය එය සම්මත කළාය. මේ ප්‍රතිසංස්කරණය ඉඩම් අයිතිකාර මූල්‍ය ප්‍රභූවරුන්ට විරුද්ධව, කාර්මික ධනපති පංතියේ නියෝජිතයින්ට පාර්ලිමේන්තුවට රිංගා ගැනීමට ඉඩ ලබා දුන්නේය. ප්‍රතිසංස්කරණය සඳහා කළ සටනේදී ප්‍රධාන බලවේගය වූ නිර්ධන පංතිය සහ සුළු ධනපති පංතිය ලිබරල් ධනපති පංතිය විසින් රවටන ලදින් ඔවුන්ට චන්ද බලය අහිමි විය.

31 ලෙජිමිස්ට්වරු - 1830 දි පෙරළා දමන ලද බූර්බොන්වරුන්ගේ අනුගාමිකයෝය. පරම්පරාගත විශාල ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි නියෝජිතයෝය. මූල්‍ය ප්‍රභූවරුන්ගේ සහ විශාල ධනපතීන්ගේ ආධාරය ඇතිව ඔර්ලියන් වරුන්ට විරුද්ධව කළ සටන්වලදී ලෙජිමිස්ට්වරු නිතර පාහේ සාමාජයික ජනාන්දෝලනයක් ඇති කළහ. මෙවැනි අවස්ථාවලදි ඔවුහු සූරාකන ධනපතීන්ට විරුද්ධව, වැඩ කරන ජනතාවගේ ආරක්ෂකයින් හැටියට පෙනී සිටියහ.

යෞවන එංගලන්තකාරයෝ - 1840 ගනන්වලදී සාදන ලද ඉංග්‍රීසි ගතානුගතික (ටෝරි) පක්ෂයට අයත් දේශපාලනඥයින්ගේ සහ සාහිත්‍ය වේදීන්ගේ කණ්ඩායමක් මෙනමින් ප්‍රසිද්ධ විය. ධනපති පංතියේ ආර්ථික හා දේශපාලන බලය නිසා අසතුටට පත් ඉඩම්හිමි රදළ පෙළැන්තියට අයත් යෞවන එංගලන්තකාරයෝ ධනපති පංතියට විරුද්ධව ගෙනයන සටනට කම්කරු පංතිය ඇඳ ගැනීම පිණිස කුටිල ජනාන්දෝලනයක යෙදුණහ.

32 සිස්මොන්ඩි, ජාන් ෂාර්ල් ලෙයෝනාර් සිමොන්දෙ (1773-1842) - ස්විට්සර්ලන්ත ආර්ථික විද්‍යා වේදියෙකි, ඉතිහාසඥයෙකි. සුළු ධනපති සමාජවාදයේ නියෝජිතයෙකි. මහා ධනපති නිෂ්පාදනයේ ප්‍රගමනික ප්‍රවණතාවය සිස්මොන්ඩිට නොවැටහිණි. පැරණි සම්ප්‍රදායන් හා සිරිත්වලින් ආදර්ශ සෙවීමට හේ ඉදිරිපත් විය. වෙනස් වූ ආර්ථික තත්ත්වයන්ට කොහෙත්ම නොගැළපෙන කර්මාන්ත වැඩ ශාලා සංවිධානද, කෘෂිකර්මයේ පීතෘමූලිකත්වයද ඔහු ආදර්ශ ලෙස දිටීය.

33 යුන්කර්වරු - ප්රුසියානු ඉඩම් හිමි රදළ පෙළැන්තියය.

34 ගෲන් කාල්, (1817-1887) - ජර්මන් සුළු ධනවාදී දේශපාලන සාහිත්‍ය වේදියෙකි.

35 බබෙප්, ග්‍රාහ් - (සැබෑ නම - ප්‍රන්සුවා නොඑල්) (1760 - 1797) - ප්‍රංශ විප්ලවවාදියෙකි, මනෝරාජික කොමියුනිස්ට්වාදයේ සම්භාවනීය නියෝජිතයෙකි. අවිගත් නැගිටීම සඳහා සූදනම් වන රහස් සංගමයක් සංවිධානය කළේය. කුමන්ත්‍රණය හෙළිදරව් විය. 1797 මැයි 27 ද ඔහු එල්ලා මරන ලදි.

36 සෙන්-සිමොන්, අන්රී ක්ලෝඩ් (1760-1825) - ප්‍රංශ මනෝරාජික සමාජවාදියෙකි. ධනවාදය විවේචනය කොට, ධනපති සමාජය වෙනුවට මූලික සංගමයන් සහිත සමාජයක් ගොඩ නැගීම සඳහා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළේය. නව සමාජයේ හැම දෙනෙකුම වැඩ කළ යුතු බවත්, ශ්‍රමයෙහි සිය සාර්ථකත්වය අනුව ඔවුන්ගේ සාමාජයික ක්‍රියාකලාපය එයට ගැළපෙන සේ අනුරූපී විය යුතු බවත් සෙන්-සිමොන් කල්පනා කළේය. කර්මාන්තය හා විද්‍යාව අතර මිත්‍ර සම්බන්ධතාවය ගැනත්, මධ්‍යගත හා නිෂ්පාදන සැලැස්මක් ගැනත් අදහස් ඉදිරිපත් කළේය. එහෙත් ඔහු පෞද්ගලික දේපොළට සහ ප්‍රාග්ධන පොළියට අත නොගැසීය. විප්ලවයට හා දේශපාලන සටන්වලට විරුද්ධ විය. නිර්ධන පංතියේ ඓතිහාසික කාර්යභාරය තේරුම් නොගත්තේය. ආණ්ඩු ප්‍රතිසංස්කරණ සහ නව ආගමක් අනුව සමාජයට අධ්‍යාත්මික අධ්‍යාපනයක් ලබා දීමෙන් පංති ප්‍රතිසතිතාවයන් අහෝසි කළ හැකි යැයි කල්පනා කළේය.

37 චාටිස්ට්වාදය (*Chartism*) - එංගලන්ත කම්කරු පංතියේ දරුණු ආර්ථික තත්ත්වය සහ දේශපාලන නොපනත්කම නිසා හටගත් පොදුජන විප්ලවවාදී ව්‍යාපාරයකි. 1830 ගණන්වල අගදී පටන්ගත් මෙම ව්‍යාපාරය වරින් වර විශාල රැස්වීම් සහ පෙළපාලි සහිතව 1850 මුල දක්වා පැවතිණි.

38 රිපොමිස්ට්වරු (ප්‍රතිසංස්කරණවාදියෝ) *La Réforme* නැමැති පැරිස් පුවත්පතේ (1843-1850) අනුගාමිකයෝය. සමූහාණ්ඩුවක් පිහිටුවා ප්‍රජාතන්ත්‍රික සහ සාමාජයික ප්‍රතිසංස්කරණ ඇති කරන ලෙස මේ පුවත්පත උද්ඝෝෂණයක් ගෙන ගියේය.

39 ලෙද්රූ-රොලෙන්, අලෙක්සාන්දර් ඔගියුස්ට් (1807-1874) - ප්‍රංශ දේශපාලන සාහිත්‍ය වේදියෙකි, දේශපාලනඥයෙකි. ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ නායකයෙකි. *La Réforme* පුවත්පතේ කතුවරයාය. 1848 තාවකාලික ආණ්ඩුවේ සාමාජිකයෙක් විය.

බ්ලාන්, ලුයී (1811-1882) - ප්‍රංශ සුළු ධනවාදී සමාජවාදියෙකි. ඉතිහාසඥයෙකි. 1848-1849 වසරවලදී විප්ලවයේ නායකයෙක් විය. ධනවාදීන් සමග සම්මුති ඇතිකැර ගැනීමේ ස්ථාවරයක් ගත්තේය.

40 1846 පෙබරවාරි මාසයේදී පෝලන්ත භූමියේදී සූදනම් කළ කැරැල්ලේ මූලිකයින් වූයේ පෝලන්ත විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන්ය. මේ කැරැල්ලේ පරමාර්ථය වූයේ පෝලන්තයට ජාතික විමුක්තිය ලබා දීමය.

මාඕවාදී විප්ලවීය ලීගය විසින් පළ කරන
ලිබරේශන්බේස් (LiberationBase)
දේශපාලන න්‍යායික, විමර්ශන සහ
තොරතුරු සඟරාව වෙත පිවිසෙන්න....

නිර්ධන පංති දර්ශනය ගැන නිවැරදිව
ඉගෙන ගනිමු... අව්‍යාජ විප්ලවවාදියෙකු
වෙමු... ලෝක පරිමාණ නිර්ධන පංති විමුක්ති
අරගලයට එක් වෙමු...!

Contact Us:
අප හා සම්බන්ධ වන්නඃ

වෙබ් අඩවිය | Web Site
http://liberationbase.wordpress.com

ඊ මේල් | E-Mail
slradical@ymail.com